# 1


# ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව, ඉදිරි දැක්ම සහ ප්‍රතිපත්ති

## 1.1 සමස්ත නිරීක්ෂණ


**ශ්‍රී ලංකා ආර්ථිකය 2013 වසරේ දී ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් වෙමින් සියයට 7.3 කින් වර්ධනය වූ අතර, අඛණ්ඩව වසර පහක් පුරා තනි අංකයක පැවති උද්ධමනය ක්‍රමයෙන් තවදුරටත් පහළ යමින් වසර අග වන විට මැදි තනි අංකයක් කරා ළඟා විය.** ආර්ථිකයේ සියලුම අංශ ආර්ථික වර්ධනයට ධනාත්මක ලෙස දායක වූ අතර හිතකර කාලගුණික තත්ත්වයන් සහ විදේශීය ඉල්ලුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම, වසරේ කාර්තු හතර මුළුල්ලේම ශ්‍රී ලංකා ආර්ථිකය අඛණ්ඩව වර්ධනය වීමට උපකාරී විය. 2013 වසරේ දී නාමික දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) සියයට 14.5 කින් වර්ධනය වෙමින් රුපියල් බිලියන 8,674 ක් හෝ එ.ජ.ඩොලර් බිලියන 67 ක් වූ අතර, ඒක පුද්ගල ද.දේ.නි. එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩොලර්) 3,280 ක් දක්වා ඉහළ නැගුණි. දේශීය බලශක්ති මිල ගණන් සැලකියයුතු ලෙස වැඩි කරනු ලැබුව ද විචක්ෂණශීලී මුදල් කළමනාකරණය සහ දේශීය ආහාර සැපයුම වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස මතුපිට උද්ධමනය ක්‍රමයෙන් පහළ ගිය අතර, මූලික උද්ධමනය එහි අවම මට්ටම තෙක් පහත වැටුණි. 2012 වසරේ අනුගමනය කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්තියේ පසු බලපෑම සහ රන් සුරැකුම් අත්තිකාරම් තියුණු ලෙස අඩුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය අපේක්ෂිත මට්ටමට වඩා අඩු වූ අතර, 2013 වසරේ දී මුදල් ප්‍රසාරණය අපේක්ෂිත මට්ටම දෙසට ළඟාවෙමින් මධ්‍යස්ථ වර්ධනයක් පෙන්වීය. අඛණ්ඩව පැවති පහළ උද්ධමනය හමුවේ ආර්ථික කටයුතු වලට උපකාරීවීම සඳහා මහ බැංකුවට සිය මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීමට හැකි විය. රජය සහ මහ බැංකුව විසින් 2012 වසරේ දී ගනු ලැබූ ප්‍රතිපත්ති මෙන්ම ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම, ගෙවුම් තුලනයේ සැලකිය යුතු වර්ධනයක් සනිටුහන් කිරීමට හේතු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස නිල සංචිත ඉහළ නංවා ගැනීමට සහ විනිමය අනුපාතය ස්ථාවරව පවත්වා ගැනීමට හැකි විය. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය පවත්වාගෙන යාම සඳහා වන රජයේ අඛණ්ඩ ප්‍රයත්නය, 2013 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය සහ රාජ්‍ය ණය තවදුරටත් අඩු කිරීමට උපකාරී විය. ගෝලීය මූල්‍ය වෙළෙඳපොළ තුළ විචලනයන් මෙන්ම අවිනිශ්චිතතාවයන් පැවතීම මධ්‍යයේ වුව ද, මූල්‍ය අංශය ස්ථාවරව පැවතුණි.

**2012 වසරේ දී ගනු ලැබූ සාර්ව ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මඟින් අපේක්ෂිත ස්ථායීකරණ අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ උද්ධමනය මෙන්ම උද්ධමන අපේක්ෂාවන් හිතකර මට්ටමක පැවතීම හේතුවෙන් වසර තුළ දී මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කිරීමට මහ බැංකුවට ඉඩ සැලසුණි.** ඒ අනුව, 2012 දෙසැම්බර් මාසයේ දී මහ බැංකු ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25 කින් අඩු කිරීමෙන් ආරම්භ කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්තිය, 2013 වසර තුළ දී ද

**1.1 රූප සටහන** මූර්ත ද.දේ.නි. යෙහි වාර්ෂික වර්ධනය




**1.2 රූප සටහන** වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන උද්ධමනය (පදනම - කො.පා.මි.ද. පාදක වර්ෂ කිහිපයක් එකතු කර)




අඛණ්ඩවම ක්‍රියාත්මක විය. සමස්තයක් ලෙස වසර තුළ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 100 කින් තවදුරටත් අඩු කළ අතර, ද්‍රවශීලතා තත්ත්වයන් ඉහළ යාම මගින් ද ලිහිල් ප්‍රතිපත්ති ස්ථාවරය පෙන්නුම් කරන ලදී. වසර මුළුල්ලේම උද්ධමනය තනි අංකයක පවත්වා ගැනීම, මුදල් ප්‍රතිපත්තියේ මූලික අරමුණ වූ අතර, පහළ යමින් පවතින උද්ධමනය සහ හිතකර උද්ධමන අපේක්ෂාවන් හේතුවෙන් ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත්කිරීම සඳහා සහාය දැක්වීමට මහ බැංකුවට ඉඩ සැලසුණි. ඉදිරි දැක්මකින් යුතුව ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණයන්හි ඵලදායී බව වසරේ දෙවන භාගයේ දී වාර්තා කළ ඉහළ ආර්ථික වර්ධනය සහ වසර අගභාගයේ දී වාර්තා කළ මැදි තනි අංකයක උද්ධමනය තුළින් පිළිබිඹු විය.


**නොකඩවා පස්වන වසරටත් උද්ධමනය තනි අංකයක මට්ටමේ පැවතීම හේතුවෙන් ආර්ථිකයේ වැටුප් සඳහා වන පීඩනය අඩු වූ අතර ආයෝජක විශ්වාසය ඉහළ නැගුණි.** 2013 වසරේ පළමු මාස දෙක තුළ අංක දෙකක මට්ටමකට ආසන්නව පැවති මතුපිට උද්ධමනය, දේශීය සැපයුම වැඩිදියුණුවීම සහ ඉල්ලුම් අංශයේ විචක්ෂණශීලී ප්‍රතිපත්ති හේතුවෙන් වසර අවසානය වනවිටදී ක්‍රමයෙන් මැදි තනි අංකයක් දක්වා අඩු විය. ඒ අනුව, 2013 වසර අවසානයේ දී මතුපිට උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 4.7 ක් ද වාර්ෂික සාමාන්‍ය පදනම මත සියයට 6.9 ක් ද විය. මේ අතර, සමස්ත ඉල්ලුම ඵලදායී ලෙස කළමනාකරණය කිරීම පිළිබිඹු කරමින්, මූලික උද්ධමනය වසර තුළදී ක්‍රමයෙන් අඩු වූ අතර, 2013 වසර අවසාන කාර්තුවේ දී එහි අවම අගය වාර්තා කළේය. 2013 වසර අවසානයේ දී මූලික උද්ධමනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 2.1 ක් ද වාර්ෂික සාමාන්‍ය පදනම මත සියයට 4.4 ක් ද විය. අඛණ්ඩව පහළ ගිය උද්ධමනය සහ උද්ධමන අපේක්ෂාවන් තුළින් වැටුප් මත වූ පීඩනය අඩු වූ අතර, බොහෝ සේවානියුක්ති කාණ්ඩයන්ගේ නාමික වැටුප් සුළු වශයෙන් ඉහළ යාම් තුළින් මෙම තත්ත්වය පිළිබිඹු විය.

**වසරේ දෙවන භාගයේ දී, කර්මාන්ත අංශය ශක්තිමත් ලෙස වර්ධනය වීම, සේවා අංශය යථා තත්ත්වයට පත්වීම සහ කෘෂිකාර්මික අංශයේ යහපත් වර්ධනය සමඟ 2013 වසරේ දී ආර්ථිකය වඩාත් පුළුල් පදනමකින් වර්ධනය විය.** 2012 වසරේ දී ක්‍රියාත්මක කරන ලද ස්ථායීකරණ ආර්ථික ප්‍රතිපත්තීන්හි පසු බලපෑම තවදුරටත් 2013 වසරේ පළමු භාගය තුළදී ආර්ථික වර්ධනය කෙරෙහි අඛණ්ඩවම බලපෑම් කළ නමුත්, භෞතික යටිතල පහසුකම් සංවර්ධනය වීම අඛණ්ඩව සිදුවීම, හිතකර කාලගුණික තත්ත්වයන් සහ දියුණු ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් වසරේ දෙවන භාගය තුළ දී ආර්ථික කටයුතු වර්ධනය විය. විශාල වශයෙන් ඉදිකිරීම් කටයුතු සිදුවීම සහ නිෂ්පාදන කර්මාන්ත ක්‍රියාකාරකම් ඉහළ යාම හේතුවෙන් කර්මාන්ත අංශයෙන් ද.දේ.නි.ට සිදුවන දායකත්වය සියයට 31.1 ක් දක්වා වැඩි වෙමින් කර්මාන්ත අංශය සියයට 9.9 ක වර්ධනයක් වාර්තා කරන ලදී. ප්‍රධාන වශයෙන්ම තොග සහ සිල්ලර වෙළෙඳාම, ප්‍රවාහනය සහ සන්නිවේදන යන උප අංශයන්හි වැඩිදියුණු වූ ක්‍රියාකාරිත්වය හේතුවෙන් සේවා අංශය සියයට 6.4 ක් ලෙස පසුගිය වසරට වඩා වැඩි වේගයකින් වර්ධනය විය. ඉතා අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් වසරේ පළමු භාගය තුළ දී කෘෂිකාර්මික අංශයෙහි පැවති මන්දගාමී ක්‍රියාකාරිත්වය වසර තුළ දී එම අංශයේ වාර්ෂික වර්ධන වේගය සියයට 4.7 ක් දක්වා පහළ යාමට හේතු විය. වසර තුළ දී කාර්මික අංශයේ සිදු වූ ශක්තිමත් වර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස සේවා අංශය සහ කෘෂිකාර්මික අංශය ද.දේ.නි.යට දැක්වූ දායකත්වය පිළිවෙලින් සියයට 58.1 ක් සහ සියයට 10.8 ක් දක්වා පහත වැටුණි.

**ආර්ථික හා සමාජ යටිතල පහසුකම් වැඩිදියුණුවීම, තිරසාර ආර්ථික වර්ධනයක් සඳහා වූ රජයේ ප්‍රතිපත්තියේ ප්‍රධාන අංගයක්ව පවතින අතර එමගින් සංවර්ධනයේ ප්‍රතිලාභ රටෙහි සියලු ප්‍රදේශ හා ජනගහනයේ සියලුම කොටස් වෙත ගලා යාම සහතික කෙරේ.** රටෙහි දෙවැනි ජාත්‍යන්තර ගුවන් තොටුපොළ, වරාය හා තොටුපොළ සංවර්ධන ව්‍යාපෘති, අධිවේගී මාර්ග හා මහාමාර්ග සංවර්ධන ව්‍යාපෘති, උතුරු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය, බලශක්ති ව්‍යාපෘති මෙන්ම ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති වැනි ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති ගණනාවක් වසර තුළ දී සම්පූර්ණ කිරීමට හෝ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට හැකි විය. රජය විසින් සපයනු ලබන සෞඛ්‍ය හා අධ්‍යාපන සේවා වැඩිදියුණු කිරීම සඳහා පියවර ගණනාවක් ගනු ලැබූ අතර, මෙවැනි සේවා සැපයීම සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය දිරිමත් කිරීම සහ එම අංශය මගින් මෙම පහසුකම් සැපයීම තවදුරටත් විධිමත් කරන ලදී. කොළඹ නගර අලංකරණය හා රටපුරා ක්‍රියාත්මක නගර සංවර්ධන ව්‍යාපෘති මහජනතාවගේ සුභසාධනය ඉහළ නැංවීමට උපකාරී වන අතරම, එමගින් ඉහළ වියදම් දරන සංචාරකයින් සඳහා නවාතැන්පොළක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම ආදී වෙනත් ප්‍රතිලාභ ද සැලසේ. රජය, නිවාස සංවර්ධන ව්‍යාපෘති රැසක් ද ක්‍රියාත්මක කරන ලදී. ආර්ථිකයේ අඛණ්ඩ වර්ධන ප්‍රවණතාවය, අඩු උද්ධමනය සහ දිළිඳුකම පිටුදැකීම සඳහා යොමු වූ ක්‍රියාමාර්ගයන්හි ප්‍රතිලාභ පිළිබිඹු කරමින් 2012/13 කුටුම්භ ආදායම් හා වියදම් සමීක්ෂණයේ මූලික ප්‍රතිඵලවලට අනුව දිළිඳු කුටුම්භ ප්‍රතිශතය සියයට 6.5 ක් දක්වා අඩු විය.

**වසර තුළ දී ශ්‍රම බලකාය සියයට 4.1 කින් වර්ධනය වීම හේතුවෙන් සේවා නියුක්තිය මෙන්ම සේවා වියුක්තිය ද ඉහළ ගිය අතර, ශ්‍රම ඵලදායීතාවය අඛණ්ඩව ඉහළ යාමක් පෙන්නුම් කරන ලදී.** දේශීය රැකියා අවස්ථා සඳහා ශ්‍රම වෙළෙඳපොළ වෙත ග්‍රාමීය කාන්තාවන් වැඩි වශයෙන් පිවිසීම හේතුවෙන් 2013 වසර තුළ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය ඉහළ අගයක් වාර්තා කළේය. වසර තුළ දී සේවා නියුක්ත පුද්ගලයින් සංඛ්‍යාව ඉහළ ගිය අතර, කෘෂිකාර්මික අංශයේ සිට සේවා අංශය කරා ශ්‍රම බලකාය සංක්‍රමණය වීමක් ද දක්නට ලැබුණි. ප්‍රධාන වශයෙන්ම, රැකියා අපේක්ෂකයින් ශ්‍රම වෙළෙඳපොළට අලුතෙන් එකතු වීම හේතුකොටගෙන සේවා වියුක්ති අනුපාතය පෙර වසරේ පැවති එහි ඓතිහාසික අවම අගයක සිට 2013 වසරේ දී සියයට 4.4 ක් දක්වා ඉහළ ගියේය. විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාව ද අඛණ්ඩව වර්ධනය විය. කෙසේ වෙතත්, ඉහළ කාන්තා ශ්‍රම බලකා

**1.3 රූප සටහන** — **වාර්ෂික සේවා වියුක්ති අනුපාතය**




සහභාගිත්ව අනුපාතයට දායකත්වය ලබා දෙමින්, වසර තුළ දී ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වූ සංඛ්‍යාව විශාල ලෙස පහළ ගියේය. සේවා නියුක්තියෙහි සිදු වූ ආංශික විතැන්වීමත් සමඟ කෘෂිකාර්මික හා කාර්මික අංශයන්ගේ ශ්‍රම ඵලදායීතාව වර්ධනය වූ අතර, සේවා අංශයේ ශ්‍රම ඵලදායීතාව පහළ ගියේය. මනා ලෙස ඉලක්කගත කළ ප්‍රතිපත්ති හේතුවෙන් සමස්ත ශ්‍රම ඵලදායීතාව ඉහළ යාමේ ප්‍රවණතාව අඛණ්ඩවම පැවතිය ද සියලු අංශයන්හි ඵලදායීතාව තවදුරටත් ඉහළ දැමීම සඳහා විභවතාවක් පවතී.

**දේශීය ආර්ථික ප්‍රතිපත්ති හා වසරේ දෙවන භාගය තුළදී වැඩිදියුණු වූ අපනයන ඉල්ලුම වර්ධනය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස ආර්ථිකයේ විදේශීය අංශයේ ස්ථායීතාව සැලකිය යුතු ලෙස වර්ධනය විය.** අපනයන ඉපැයීම් විශාල වශයෙන් ඉහළයාම සහ ආනයන වියදම් පහළයාම හේතුවෙන් වෙළෙඳ ශේෂයේ සැලකිය යුතු පහළ යාමක් දක්නට ලැබුණි. 2013 වසරේ දෙවන භාගයේ දී ගෝලීය වෙළෙඳ කටයුතු යථා තත්ත්වයට පත්වීම හා ප්‍රධාන අපනයන ගමනාන්තයන් වලින් වූ ඉල්ලුම ඉහළයාම අපනයන ආදායම කෙරෙහි හිතකර ලෙස බලපාන ලදී. ඒ අනුව, රෙදිපිළි හා ඇඟළුම් අපනයන ඉපැයුම්වල කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය. ඛනිජ තෙල් ආනයන අඩුවීම, ආනයන වියදම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ගමනාගමන හා සංචාරක අංශය, සේවා අංශයේ දියුණුව සඳහා දායකත්වය ලබා දුන් අතර ප්‍රවාහන පහසුකම්, තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සහ දැනුම පදනම් කරගත් ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන විභවතාවයක් පවතින නැගීඑන අංශයන්ගෙන් ලද ඉපැයීම් ද අඛණ්ඩව වර්ධනය විය. වඩාත් විවිධාංගීකරණය වූ සංක්‍රමණික රටා හේතුවෙන් සේවානියුක්ති ප්‍රේෂණ ද වර්ධනය විය. භාණ්ඩ හා සේවා අපනයන වෙළෙඳාමෙන් ලද ඉපැයීම් සහ සේවා

නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යාම හේතුවෙන් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස විදේශීය අංශයේ වර්තන ගිණුමේ හිඟය පෙර වසරේ පැවති සියයට 6.7 සිට 2013 වසර වනවිට සියයට 3.9 ක් දක්වා අඩු විය. මෙවැනි වර්ධනයන් සහ මූල්‍ය ගිණුම වෙත ලැබුණු විදේශ සෘජු ආයෝජන, රජයේ සුරැකුම්පත්වල සිදු කළ විදේශ ආයෝජන සහ රජය, බැංකු පද්ධතිය සහ මූල්‍ය නොවන අංශ වෙත ලැබුණු දිගුකාලීන ණය හේතුවෙන් 2012 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 151 ක් වූ ගෙවුම් ශේෂ අතිරික්තය 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 985 ක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 2013 වසරේ අග වනවිට දළ නිල සංචිත ආනයනික මාස 5 කට සමාන වෙමින් එ.ජ.ඩොලර් බිලියන 7.5 ක් දක්වා වර්ධනය විය. අනෙකුත් නැගීඑන ආර්ථිකයන්හි ව්‍යවහාර මුදල්වල දක්නට ලැබුණු අධික විචලතාව මධ්‍යයේ වුව ද වැඩිදියුණු වූ ගෙවුම් ශේෂය හා විදේශ සංචිත හේතුවෙන් ශ්‍රී ලංකා රුපියල ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට හැකි විය. ඒ අනුව, ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.75 කින් පමණක් අවප්‍රමාණය වූ අතර, වෙනත් ප්‍රධාන ව්‍යාවහාර මුදල් කිහිපයකට සාපේක්ෂව අධිප්‍රමාණය විය.

**රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය මගින් මැදිකාලීනව තිරසාර හා ප්‍රාදේශීය වශයෙන් තුලිත සංවර්ධනයක් අත්කර ගැනීම කෙරෙහි යොමු වූ අතර, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව සඳහා වූ අඛණ්ඩ පරිශ්‍රමයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශකවල ක්‍රමානුකූල වර්ධනයක් දක්නට ලැබුණි.** රජය, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස වර්තන වියදම් විශාල වශයෙන් අඩු කළ අතර, රටේ සමස්ත ආයෝජන තත්ත්වය ඉහළ නැංවීමට උපකාරී වෙමින් රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.5 ක ඉහළ අගයක පැවතුණි. කෙසේ වෙතත්, රජයේ ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13.1 ක් දක්වා තවදුරටත් පහළ වැටුණු අතර, මෑත වසරවල දී රාජ්‍ය ආදායම් රැස්කිරීම පුරෝකථනය කළ මට්ටමට වඩා අඩුවීම අඛණ්ඩව සිදු වීම රජයේ සැලකිල්ල යොමු වූ ප්‍රධාන කරුණක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, බදු ක්‍රමය පුළුල් කිරීම සඳහා සහ අකාර්යක්ෂමතාවන් හා අපතේ යාම් අවම කිරීම සඳහා තවදුරටත් ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී. ආදායම් රැස්කිරීම සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණ ද, වියදම් තාර්කිකරණය කිරීම තුළින් අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් සියයට 5.9 ක අගයක රඳවා ගැනීමට හැකි වූ අතර, එය ඇස්තමේන්තුගත සියයට 5.8 ට වඩා සුළු වශයෙන් වැඩිවීමකි. 2013 වසරේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම මගින් අරමුදල් ලබා නොගැනීමට රජය ගත් තීරණය හේතුවෙන් අයවැය හිඟය ප්‍රධාන වශයෙන් දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යනය කරන ලදී. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය අනුපාතය අඩුවීමේ ප්‍රවණතාව අඛණ්ඩව දක්නට ලැබුණු අතර, එම අනුපාතය වඩා යහපත් වෙමින් 2013 වසරේ දී සියයට 78.3 ක් දක්වා අඩු විය.

**2013 වසර තුළදී ප්‍රධාන රාජ්‍ය සංස්ථාවන්හි මූල්‍ය තත්ත්වයෙහි සුවිශේෂී වර්ධනයක් දක්නට ලැබුණි.** ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ සාපේක්ෂව බලශක්ති මිල ගණන් ස්ථාවරව පැවතීම මෙන්ම හිතකර කාලගුණික තත්ත්වයක් පැවතීම සහ විනිමය අනුපාතිකය ස්ථාවරව පැවතීම, ප්‍රධාන රාජ්‍ය සංස්ථාවල මූල්‍ය ක්‍රියාකාරිත්වය වර්ධනයට දායක විය. 2013 පෙබරවාරි සහ අප්‍රේල් මාසවල දී පිරිවැය පිළිබිඹු වන පරිදි ඛනිජ තෙල් මිල ගණන් සංශෝධනය කිරීම සහ විදුලි ගාස්තු සංශෝධනය කිරීම මෙම වර්ධනයට තවදුරටත් උපකාරී විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ලංකා විදුලි බල මණ්ඩලය 2013 වසරේ දී මෙහෙයුම් ලාභයක් වාර්තා කළ අතර, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ පාඩු සැලකිය යුතු ලෙස අඩුවීමක් දක්නට ලැබුණි. ලංකා විදුලිබල මණ්ඩලය සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය වැඩිදියුණුවීම තුළින් එම ආයතනවලින් බැංකු අංශය වෙත වූ වගකීම්වලින් කොටසක් පියවීමට හැකි වූ අතර, අත්‍යවශ්‍ය පුළුල්කිරීම් සහ නවීකරණය කිරීමේ වැඩකටයුතු සැලසුම් කිරීමට හැකි විය. එමගින් ආර්ථිකයට එම ආයතනවලින් සේවා සැපයීමේ හැකියාව ඉහළ නංවනු ඇත.

**මුදල් ප්‍රසාරණය අපේක්ෂිත මට්ටම් කරා යොමු වූ අතර, 2012 වසරේ දෙසැම්බර් මස සිට මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම, වෙළෙඳපොළ පොලී අනුපාතික වෙත ක්‍රමිකව සම්ප්‍රේෂණය විය.** කෙටිකාලීන වෙළෙඳපොළ පොලී අනුපාතික ක්ෂණිකව පහළ ගිය නමුත් දිගුකාලීන පොලී අනුපාතික වසරේ පළමු මාස කිහිපය තුළ දී පහළ යාමේ යම් මන්දගාමී ස්වරූපයක් පෙන්නුම් කළ අතර, වසරේ අවසාන කාලසීමාවේදී පහළ යන ලදී. හිතකර කාලගුණික තත්ත්වයන් පැවතීම සහ පරිපාලිතව තීරණය කරනු ලැබූ බලශක්ති මිල ගණන් සංශෝධනය කිරීම හේතුකොටගෙන වසර තුළ දී රාජ්‍ය සංස්ථා විසින් ලබාගත් ණය ප්‍රමාණය අඩු විය. රජය මහ බැංකුවෙන් ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු වූ අතර, 2013 වසරේ රාජ්‍ය මූල්‍ය හිඟය මූල්‍යනය කිරීමේදී රජය වාණිජ බැංකු වලින් ලබාගත් ණය ප්‍රමාණය වැඩිවීම පිළිබිඹු කරමින් රජය විසින් බැංකු අංශයෙන් ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය ඉහළ ගියේය. 2012 වසරේ සිට ක්‍රියාත්මක වන දැඩි මුදල් ප්‍රතිපත්තියේ පසු බලපෑම මෙන්ම කෘෂිකාර්මික සහ පෞද්ගලික පරිභෝජනය සඳහා ලබාගත් රන් උකස්

ණය අත්තිකාරම් තීව්‍ර ලෙස අඩුවීම හේතුකොටගෙන වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය වසර තුළ දී අඩු විය. මෑත වසරවල දී පෞද්ගලික අංශය දේශීය සහ ගෝලීය ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත ප්‍රවේශවීම ඉහළ යාම ද වාණිජ බැංකුවලින් ලබා ගන්නා ණය ප්‍රමාණය අඩුවීමට හේතු විය. කෙසේ වුවද, 2013 වසරේදී කර්මාන්ත සහ සේවා අංශය වෙත ලබාදුන් ණය රුපියල් බිලියන 201.1 කින් ඉහළ ගියේය. 2013 වසරේදී පෞද්ගලික අංශයට දේශීය සහ විදේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත ප්‍රවිශ්ට වීමට ඇති හැකියාව ඉහළයාම ද පෞද්ගලික අංශය වාණිජ බැංකු වෙතින් ණය ලබාගැනීම මන්දගාමී වීමට හේතුවිය. මේ සම්බන්ධයෙන් එ.ජ.ඩොලර් මිලියන 335.5 ක් වටිනා ණය ලබාගැනීම සඳහා බලපත්‍රලාභී බැංකු හැර පෞද්ගලික අංශයට අවසර ලබාදීම සහ එයින් රුපියල් බිලියන 34.9 ක් වටිනා අරමුදල්, කොටස් වෙළඳපොළ තුළ ලියාපදිංචි ණයකර මඟින් රැස්කර ගැනීමට හැකිවීම ද විශේෂිත කරුණකි.

**ගෝලීය වෙළෙඳපොළ ප්‍රවණතා තුළින් පැනනැගුණු අවිනිශ්චිතතා මධ්‍යයේ වුවද මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ආරක්ෂා වූ අතර, නියාමන සහ සුපරීක්ෂණ රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදී.** ශක්තිමත් ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා ආරක්ෂණ ක්‍රමෝපායයන් සමඟ විවිධාංගීකරණය වූ ණය කළඹ සහ මනා අවදානම් කළමනාකරණ පරිචයන් හේතුවෙන් 2013 වසර තුළ දී මූල්‍ය අංශය යහපත් මට්ටමක පවත්වා ගැනුණ ද, මූල්‍ය අංශයේ වත්කම් ගුණත්වය කෙරෙහි අක්‍රිය රන් ණය උකස් අත්තිකාරම් බලපෑම් කරන ලදී. මූල්‍ය අංශයේ සමස්ත වත්කම් ප්‍රමාණය ඉහළ ගිය අතර, විශේෂයෙන්ම බස්නාහිර පළාතෙන් පිටත ශාඛා ජාලය ව්‍යාප්ත වීම සහ මූල්‍ය කටයුතු සඳහා ප්‍රවේශය සහ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු වීම සිදු විය. මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම පිළිබිඹු කරමින් වෙළෙඳපොළ පොලී අනුපාතික ක්‍රමිකව පහළට නැඹුරු වූ අතර වසර මුළුල්ලේම බොහෝදුරට වෙළෙඳපොළ ද්‍රවශීලව පැවතුණි. ජාත්‍යන්තර සම්මතයන් සහ ප්‍රශස්ත පරිචයන් අනුව යමින් නියාමන සහ සුපරීක්ෂණ ක්‍රමය තවදුරටත් ශක්තිමත් කරන ලද අතර මූල්‍ය ස්ථායීතාවට ඇතිවිය හැකි අවදානම් නිසිකලට හඳුනා ගැනීම සඳහා ජාත්‍යන්තර සම්මතයන් සහ මනා පරිචයන්ට අනුගත වෙමින් නිරාවරණ අවශ්‍යතාවයන් ද ශක්තිමත් කරන ලදී. මහ බැංකුව විසින් ගෙවීම් පද්ධතියේ යටිතල පහසුකම් සහ එහි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී. ණයකර නිකුතුන් සංඛ්‍යාව සැලකියයුතු ලෙස ඉහළ යාම හේතුවෙන් සාංගමික බැඳුම්කර වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය සැලකියයුතු ලෙස ඉහළ ගිය අතර, නව අරමුදල් ගණනාවක් ස්ථාපිත කිරීමත් සමඟ ඒකක භාර අංශය 2013 වසර තුළදී පුළුල් විය. ගෝලීය වෙළෙඳපොළ අවිනිශ්චිතතා මධ්‍යයේ වුවද කොටස් වෙළෙඳපොළ සහ රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ සඳහා වූ විදේශීය ලැබීම් අඛණ්ඩව වර්ධනය විය. රක්ෂණ ක්ෂේත්‍රයේ වත්කම් සහ පාරිතෝෂික ආදායම් යන දෙඅංශයෙන්ම ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී.

**ඉදිරි කාලය දෙස බලන විට ආයෝජන ඉහළ යාම, සාර්ව ආර්ථික ස්ථායීතාව හා ගෝලීය ආර්ථික තත්ත්වයන් වැඩිදියුණුවීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා ආර්ථිකය මැදිකාලීනව තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ශ්‍රී ලංකා ආර්ථිකයේ මැදිකාලීන ප්‍රගතිය අභියෝගයන්ගෙන් තොර නොවන අතර, ආර්ථික වර්ධන ගම්‍යතාව අඛණ්ඩව තිරසාර මට්ටමක පවත්වා ගැනීම සඳහා ව්‍යුහාත්මක ගැලපීම් අවශ්‍ය වනු ඇත. භෞතික යටිතල පහසුකම්වල සිදුව ඇති විශාල වර්ධනයන් සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඵලදායී ධාරිතාවයේ සිදු වූ ඉහළ යාමත් සමඟ පශ්චාත් යුධ කාලසීමාව තුළ දී රටේ විභව නිෂ්පාදන මට්ටම (potential output) සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති අතර, එම මට්ටමට ළඟාවීමට ආර්ථික කටයුතුවලදී පෞද්ගලික අංශය ඉහළ දායකත්වයක් දැක්වීම අවශ්‍ය වනු ඇත. සමස්ත සම්පත්වල ඵලදායීතාව ඉහළ නැංවීම, නැගී එන ආර්ථික අංශයන් කෙරෙහි ඉහළ අවධානයක් යොමු කරමින් රටේ මානව ප්‍රාග්ධන පදනම වැඩිදියුණු කිරීම සහ ඵලදායී කටයුතු ඉහළ නැංවීම සඳහා පහසුකම් සපයන පරිසරයක් නිර්මාණය කිරීම, තිරසාර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතු අත්‍යාවශ්‍ය අංගයන් වේ. එවැනි සංවර්ධනයන් මඟින් ආර්ථික කටයුතු මෙන්ම භාණ්ඩ හා සේවා සඳහා අවශ්‍ය විවිධාංගීකරණයන් මෙන්ම විදේශ වෙළෙඳපොළ පදනම ප්‍රසාරණය කිරීම සඳහා එමඟින් පහසුකම් සපයනු ඇත. පංචබල කේන්ද්‍රීය උපාය මාර්ගයන් (5+1) අනුව යමින්, තවදුරටත් ආර්ථික කටයුතු විවිධාංගීකරණය වෙනුවෙන් රජය විසින් ක්‍රියාවට නංවා ඇති ප්‍රතිපත්තීන් මඟින්, ආර්ථිකය “මැදි ආදායම් උගුල” ට හසු නොවී මැදිකාලීනව සුමටව ඉන් ඉදිරියට සංක්‍රමණය වීම සඳහා පහසුකම් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මෙන්ම වෙළෙඳ පාර්ශ්වකාර ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කරන අතර එහි ප්‍රතිඵලයක් ලෙස, වෙළෙඳ භාණ්ඩ හා සේවා අපනයන වර්ධනය ඉහළ යමින් විදේශීය අංශය තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රාග්ධන වෙළෙඳපොළ විවෘත කිරීමත් සමඟ ගෝලීය ප්‍රවණතා හේතුකොටගෙන ඇතිවිය හැකි අවදානම්වලට මුහුණදීම සඳහා ආරක්ෂිත පියවර ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ. රාජ්‍ය මූල්‍ය අංශයෙන් බලනවිට මැදිකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවෙහි අපේක්ෂිත

පරිදි අයවැය හිඟය සහ රාජ්‍ය ණය තවදුරටත් අඩු කිරීම සඳහා රජය විසින් දරන ප්‍රයත්නය වඩාත් වැදගත් වනු ඇත. රාජ්‍ය ආයෝජන රටෙහි සමස්ත ආයෝජන වර්ධනයට උපකාරී වනු ඇතැයි අපේක්ෂා කරන අතර, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ඉතිරිකිරීම්හි අපේක්ෂිත වර්ධනයත් සමඟ ඉතිරිකිරීම්-ආයෝජන පරතරය පියවීම සඳහා බාහිර මූලාශ්‍රයන් මත රඳාපැවැත්ම අඩු වනු ඇත. මූල්‍ය අංශය ජාත්‍යන්තර ප්‍රශස්ත පරිචයන්ට අනුගතවීම සහ සැලසුම්කරණය කරන ලද ඒකාබද්ධකරණ වැඩසටහන හේතුකොටගෙන තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. විචක්ෂණශීලී මෙන්ම ඉදිරි දැක්මක් සහිත මුදල් ප්‍රතිපත්ති තීරණ දේශීය සැපයුම් සහ ඵලදායීතාව වැඩිදියුණුවීම හේතුකොටගෙන, උද්ධමනය, මැදිකාලීනව මැදි තනි අංකයක මට්ටමට තවදුරටත් අඩුවනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය ආර්ථික සහ මිල ස්ථායිතාව අඛණ්ඩව පවත්වාගෙන යාමට නොමඳ සහයෝගයක් ලබා දෙනු ඇත.

## 1.2 2013 වසරේ සාර්ව ආර්ථික වර්ධනයන්, ස්ථායිතාව සහ ප්‍රතිපත්තිමය ප්‍රතිචාර

### මූර්ත අංශයේ වර්ධනයන් සහ උද්ධමනය

දළ දේශීය නිෂ්පාදිතය 2012 වසරේ පැවති සියයට 6.3 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 7.3 ක වර්ධනයක් වාර්තා කරමින් ආර්ථිකය ඉහළ හා තිරසාර වර්ධන මාවතකට යළි ප්‍රවිශ්ට විය. සාර්ව ආර්ථික ස්ථායිතාවය උදෙසා 2012 වසරේ හඳුන්වාදුන් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග 2012 වසරේ දෙසැම්බර් මස සිට ලිහිල් කළ අතර, එය 2013 වසරේ ආර්ථික වර්ධනය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට උපකාරී විය. උද්ධමනය අඩු මට්ටමක පැවතීම, පොලී අනුපාතික අඩුවෙමින් පැවතීම සහ සාපේක්ෂ වශයෙන් ස්ථාවර විනිමය අනුපාතයක් පැවතීම වැනි සාර්ව ආර්ථික තත්ත්වයන් ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා දායක විය. යහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් දේශීය කෘෂිකාර්මික කටයුතු කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කිරීම මෙන්ම ඉහළ එකතු කළ අගයක් පවතින ජල විදුලිබල උත්පාදන කටයුතු සැලකිය යුතු ලෙස ඉහළ යාම ආර්ථික වර්ධනයට හිතකර අයුරින් දායක විය. රජයේ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මකවීම ද ඉහළ ආර්ථික වර්ධනයක් ලබාගැනීම කෙරෙහි උපකාරී විය. දියුණු ආර්ථිකයන්හි විශේෂයෙන්ම වසරේ දෙවන භාගය තුළ ඇති වූ පිබිදීම ශ්‍රී ලංකාවේ විදේශීය වෙළෙඳාමේ ක්‍රියාකාරීත්වය කෙරෙහි හිතකර ලෙස බලපෑ අතර, එය වසරේ දෙවන භාගය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය වේගවත් කිරීමට හේතු විය. බොහොමයක් නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි හා දකුණු ආසියාතික රටවල් ද ඇතුළුව දියුණු වෙමින් පවත්නා ආර්ථිකයන්හි මන්දගාමී වර්ධනය හමුවේ ශ්‍රී ලංකාව විසින් අත්කරගත් ආර්ථික වර්ධනය අතිශයින්ම වැදගත් වේ.


**1.1 සංඛ්‍යා සටහන** — **කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2002) යටතේ දළ ජාතික නිෂ්පාදිතය**

| අංශය | වටිනාකම (රු. මිලියන) | | ද.දේ.නි. ට දායකත්වය % | | වෙනස්වීමේ අනුපාතිකය % | | වෙනස්වීමට දායකත්වය % | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2012 (අ) | 2013 (ආ) | 2012 (අ) | 2013 (ආ) | 2012 (අ) | 2013 (ආ) | 2012 (අ) | 2013 (ආ) |
| **කෘෂිකාර්මික අංශය** | **336,817** | **352,641** | **11.1** | **10.8** | **5.2** | **4.7** | **9.2** | **7.2** |
| කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදී වන ද්‍රව්‍ය | 295,923 | 309,192 | 9.7 | 9.5 | 4.7 | 4.5 | 7.3 | 6.0 |
| ධීවර කර්මාන්තය | 40,894 | 43,449 | 1.3 | 1.3 | 9.3 | 6.2 | 1.9 | 1.2 |
| **කාර්මික අංශය** | **925,152** | **1,016,886** | **30.4** | **31.1** | **10.3** | **9.9** | **47.5** | **41.5** |
| පතල් හා කැණීම් | 84,672 | 94,388 | 2.8 | 2.9 | 18.9 | 11.5 | 7.4 | 4.4 |
| නිෂ්පාදන කර්මාන්ත | 520,938 | 559,843 | 17.1 | 17.1 | 5.2 | 7.5 | 14.3 | 17.6 |
| විදුලිය, ගෑස් සහ ජලය | 72,452 | 79,913 | 2.4 | 2.4 | 4.2 | 10.3 | 1.6 | 3.4 |
| ඉදිකිරීම් | 247,091 | 282,742 | 8.1 | 8.7 | 21.6 | 14.4 | 24.2 | 16.1 |
| **සේවා අංශය** | **1,783,318** | **1,896,572** | **58.6** | **58.1** | **4.6** | **6.4** | **43.3** | **51.3** |
| තොග සහ සිල්ලර වෙළෙඳාම | 701,408 | 739,826 | 23.0 | 22.7 | 3.7 | 5.5 | 13.7 | 17.4 |
| හෝටල් සහ ආපනශාලා | 21,029 | 25,715 | 0.7 | 0.8 | 20.2 | 22.3 | 1.9 | 2.1 |
| ප්‍රවාහනය සහ සන්නිවේදනය | 435,872 | 476,721 | 14.3 | 14.6 | 6.2 | 9.4 | 14.0 | 18.5 |
| බැංකු, රක්ෂණ සහ දේපළ වෙළෙඳාම් යනාදිය | 269,744 | 285,750 | 8.9 | 8.7 | 6.7 | 5.9 | 9.4 | 7.2 |
| නිවාස අයිතිය | 76,926 | 79,175 | 2.5 | 2.4 | 1.7 | 2.9 | 0.7 | 1.0 |
| රාජ්‍ය සේවා | 207,559 | 213,439 | 6.8 | 6.5 | 1.4 | 2.8 | 1.6 | 2.7 |
| පෞද්ගලික සේවා | 70,779 | 75,946 | 2.3 | 2.3 | 5.5 | 7.3 | 2.0 | 2.3 |
| **දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | **3,045,288** | **3,266,099** | **100.0** | **100.0** | **6.3** | **7.3** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | -62,253 | -88,454 | | | -97.4 | -42.1 | | |
| **දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.)** | **2,983,034** | **3,177,645** | | | **5.3** | **6.5** | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**1.4 රූප සටහන** **කාර්තුමය පදනම මත මූර්ත ද.දේ.නි. යෙහි වර්ධනය**




**2013 වසරේ සමස්ත ආර්ථික වර්ධනය සඳහා ආර්ථිකයේ සියලු ප්‍රධාන අංශවල ඇති වූ පුළුල් වර්ධනය උපකාරී විය.** සේවා අංශය 2013 වසරේ ආර්ථික වර්ධනය කෙරෙහි දායක වූ ප්‍රමුඛ අංශය ලෙස තවදුරටත් පැවති අතර, ඒ සඳහා ප්‍රවාහන හා සන්නිවේදන උප අංශයන්ගෙන් ඉහළ දායකත්වයක් ලබා දුන් අතර, ඊළඟට ඉහළ දායකත්වයක් ලබාදුන් උප අංශය වූයේ තොග හා සිල්ලර වෙළෙඳාමයි. මූල්‍ය සේවා ප්‍රසාරණය වීම ද සේවා අංශයේ වර්ධනය ඉහළ නැංවීම සඳහා හේතුවිය. වසර තුළ ඉහළම ආංශික වර්ධනයක් කර්මාන්ත අංශයෙන් වාර්තා වූ අතර, විදේශීය අංශයෙන් වූ ඉල්ලුමේ වර්ධනය වීම සමඟ නිෂ්පාදන කර්මාන්ත උප අංශය තවදුරටත් ඒ සඳහා ඉහළම දායකත්වය ලබා දුණි. 2013 වසර තුළ දී ඉදිකිරීම් උප අංශය ද ඉහළ වර්ධනයක් වාර්තා කළේය. වසරේ පළමු භාගයේ දී තරමක් අඩු වර්ධන මට්ටමක් පෙන්නුම් කළ කෘෂිකාර්මික අංශය වසරේ දෙවන භාගයේ දී, වී නිෂ්පාදනය, වෙනත් ආහාර බෝග හා ධීවර උප අංශයේ ප්‍රසාරණය සමඟ වර්ධනය විය.

**2012 වසරේ සියයට 4.0 ක මට්ටමේ පැවති සේවා වියුක්ති අනුපාතය 2013 වසරේ දී සියයට 4.4 දක්වා ඉහළ ගිය අතර ඒ සඳහා මූලික වශයෙන්ම හේතු වූයේ, නව රැකියා අපේක්ෂකයින් ශ්‍රම වෙළෙඳපොළට ප්‍රවිෂ්ට වීමයි.** ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 2012 වසරේ පැවති සියයට 52.6 සිට 2013 වසරේ දී සියයට 53.8 ක් දක්වා සියයට 4.1 කින් වර්ධනය විය. මේ අනුව, ස්ත්‍රී ශ්‍රම සහභාගිත්ව අනුපාතය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, පුරුෂ ශ්‍රම සහභාගිත්ව අනුපාතය සුළු වශයෙන් පහත වැටුණි. ශ්‍රම බලකාය ඉහළ යාමත් සමඟ සේවා නියුක්තිකයන්ගේ මෙන්ම සේවා වියුක්තිකයන්ගේ සංඛ්‍යාව ද ඉහළ ගියේය. ස්ත්‍රී සේවා වියුක්තිය හා පුරුෂ සේවා වියුක්තිය 2013 වසර තුළ දී පිළිවෙළින් සියයට 6.6 ක් හා සියයට 3.2 ක් දක්වා ඉහළ ගිය අතර, 2012 වසරේ දී එය පිළිවෙළින් සියයට 6.2 ක් හා 2.9 ක් ලෙස පැවතුණි. සේවා නියුක්තියේ ප්‍රධාන මූලාශ්‍රයන් මෙන්ම රටේ විදේශ විනිමය ඉපැයීමේ ප්‍රධාන අංශය වන විදේශ සේවා නියුක්ති අවස්ථාවන් 2013 වසර තුළ දී අඛණ්ඩව ඉහළ ගියේය.

**බොහෝ කෘෂිකාර්මික බෝග වගාවන්හි නිෂ්පාදනය ඉහළ යාමත් සමඟ 2013 වසරේ කෘෂිකාර්මික අංශය සියයට 4.7 ක වර්ධනයක් වාර්තා කළේය.** මෙම අංශයේ වර්ධනය සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති, දිරිගන්වන සුළු නිෂ්පාදන මිල ගණන් පැවැතීම සහ යහපත් කාලගුණ තත්ත්වයන් මෙම වර්ධනය සඳහා දායක විය. වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 4.62 ක් දක්වා සියයට 20 කින් වර්ධනය වූ අතර, දේශීය නිෂ්පාදනය ඉහළ දැමීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් එළවළු හා වෙනත් උස්බිම් වගා බෝග මෙන්ම සීනි හා කිරි නිෂ්පාදනය ද වසර තුළ දී සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගියේය. තවද, තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 340 ක් දක්වා සියයට 3.6 කින් වර්ධනය වූ අතර, එය තේ නිෂ්පාදනයේ මෙතෙක් වාර්තා වූ ඉහළම නිෂ්පාදන මට්ටම විය. කෙසේ වුවද, කෘෂිකාර්මික අංශයේ වර්ධනය අඩාල කරමින් රබර් හා පොල් වගා අංශ පිළිවෙළින්, සියයට 14.2 කින් හා සියයට 14.5 කින් පහත වැටුණි. පසුගිය වසරේ පැවති වියළි කාලගුණයේ පසු බලපෑම පොල් නිෂ්පාදනය පහත වැටීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපෑ අතර රබර් නිෂ්පාදනය පහළ යාම සඳහා පළමු මාස නවය තුළ අධික වර්ෂාපතනයක් පැවතීම සමඟ රබර් කිරි නිස්සාරණ කටයුතුවලට සිදු වූ අහිතකර බලපෑම හේතු විය. රටේ මත්ස්‍ය සැපයුම මැයි සිට ජූලි දක්වා පැවති ඉතා අයහපත් කාලගුණ තත්ත්වයන්ගේ බලපෑමට ලක්වුවද, සමස්තයක් ලෙස 2013 වසර තුළ දී ධීවර අංශය සියයට 5.5 ක සතුටුදායක වර්ධනයක් වාර්තා කිරීමට සමත් විය.

**රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තියේ අරමුණ වූයේ, නැගී එන අංශයන් තුළ අගය එකතු කළ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම මෙන්ම නිෂ්පාදන කළ හැකි මට්ටමට වඩා අඩු මට්ටමක පවතින අංශයන්හි වර්ධනය වේගවත් කිරීම දිරිමත් කිරීමයි.** සහල් අපනයනය දිරිගැන්වීමට හා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සඳහා නව සහල් ප්‍රභේද හඳුන්වා දෙන ලදී. තේ නව වගාවන් හා නැවත වගාවන් ප්‍රවර්ධනය උදෙසා සහනාධාර වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, තේ කර්මාන්තශාලා නවීකරණය කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක විය. සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් හා

පොල් වගා කටයුතුවල ව්‍යාප්තිය සඳහා ඉහළ ගුණත්වයකින් යුතු බීජ හා පැල රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීම උපකාරී විය. උක් වගාකිරීමේ කටයුතු පුළුල් විය. ඉහළ තත්ත්වයේ කිරි ගවයින් ආනයනය කිරීම, නැවුම් කිරි සැපයුම ඉහළ නැංවීමට ආධාර වූ අතර, රටේ ඉහළ ඵලදාවක් සහිත ගවගහනය ඉහළ නැංවීමේ කටයුතු වේගවත් කිරීමට සහනදායී ණය යෝජනා ක්‍රමයක අනුග්‍රහය ලැබිණ. 2013 වසර තුළ දී අලුතින් ආරම්භ කළ ධීවර වරායන් මගින් ගැඹුරු මුහුදේ ධීවර කටයුතුවල යෙදෙන විශාල ධීවර යාත්‍රා සඳහා අවශ්‍ය වරාය පහසුකම් සපයනු ඇත. ධීවර ක්ෂේත්‍රයට අවශ්‍ය නව තාක්ෂණය ලබා ගැනීම අරමුණු කරගනිමින් “දියවර දිරිය” ධීවර ණය යෝජනා ක්‍රමය අඛණ්ඩව දෙවන වසරටත් 2013 වසරේ දී ක්‍රියාත්මක විය. මේ අතර, ආනයනය කරනු ලබන ආහාර ද්‍රව්‍ය මත පවත්වාගෙන යනු ලැබූ ඉහළ තීරුබදු අනුපාත සමඟ දේශීය ආදේශකයන් මගින් දේශීය වගාකරුවන් සඳහා ස්ථාවර හා දිරිගන්වන සුළු මිල ගණන් ලබා දුණි.

**නිමැවුම් අංශය තුළ සියයට 90 ක පමණ දායකත්වය සපයනු ලබන කර්මාන්ත නිමැවුම් අංශයේ නිෂ්පාදනය 2013 වසරේ ධනාත්මක වර්ධනයක් අත් කරගත් අතර, මේ සඳහා ගෝලීය වෙළෙඳ හවුල්කාර ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීම, සංචාරක පැමිණීම ඉහළ යාම, හිතකර ව්‍යාපාරික පරිසරය සහ අදාළ කර්මාන්තයන් විසින් ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතු විය.** අපනයන වෙළෙඳපොළ ඉලක්ක කරගත් විශාලතම කර්මාන්ත නිමැවුම් උප අංශය වන රෙදිපිළි හා ඇඟළුම් උප අංශයේ නිෂ්පාදනය වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර මේ සඳහා විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපා සංගමයේ රටවලින් පැවති ඉහළ ගිය ඉල්ලුම, ඵලදායීතාවය වර්ධනය සඳහා විවිධ ක්‍රියාමාර්ග ගැනීම හා ඇඟළුම් අංශයේ එකතු කළ අගය ඉහළ නැංවීම සඳහා උපකාරී වන දේශීය වශයෙන් අමුද්‍රව්‍ය ලබා ගැනීම හේතු විය. ඇමෙරිකා එක්සත් ජනපදයේ හා යුරෝපා සංගමයේ නිමැවුම් කර්මාන්ත අංශයේ නිෂ්පාදන කටයුතු ඉහළ යාම, රබර් නිෂ්පාදන ක්ෂේත්‍රයේ හිතකර වර්ධනය සඳහා බලපාන ලදී. 2013 වසර තුළ දී පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ඉහළ යාම සඳහා, එක්සත් අරාබි එමීර් රාජ්‍යය හා ඕමානය වැනි බොරතෙල් සපයන විකල්ප මූලාශ්‍රයන් වෙතින් බාධාවකින් තොරව බොරතෙල් සැපයීම හේතු විය. නිෂ්පාදන විවිධාංගීකරණය ඉහළ යාම පිළිබිඹු කරමින් සකස් කළ ලෝහ හා විදුලි උපකරණ නිෂ්පාදන උප අංශය ද කැපී පෙනෙන වර්ධනයක් 2013 වසර තුළ දී වාර්තා කළේය.

**දැනුම පදනම් කරගත් තාක්ෂණ සූක්ෂම කර්මාන්තයන් ප්‍රවර්ධනය කිරීම, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංවර්ධනය කිරීම සඳහා අනුග්‍රහය දැක්වීම සහ ප්‍රාදේශීය කාර්මීකරණය කෙරෙහි 2013 වසරේ රජයේ කර්මාන්ත ප්‍රතිපත්තිය මූලික වශයෙන් යොමු විය.** උපායමාර්ගිකව වැදගත් වන පර්යේෂණ හා සංවර්ධනයන් ආරම්භ කිරීම සඳහා පහසුකම් සැලසීම අරමුණු කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රථම නැනෝ තාක්ෂණ විද්‍යා උද්‍යානය 2013 ඔක්තෝබර් මස දී විවෘත කරන ලදී. තවද, රජය විසින් තාක්ෂණ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීමේ සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා තාක්ෂණය හඳුන්වා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ගයක් ලෙස තාක්ෂණ සංවර්ධන අරමුදලක් පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික පියවර ගනු ලැබීය. අච්චුවේලි කර්මාන්ත පුරවරය පිහිටුවීම සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තයන් නගාසිටුවීම සඳහා ප්‍රාදේශීය කාර්මීකරණය දිරිමත් කිරීමට ප්‍රධාන හා සුළු කර්මාන්ත පුරවරයන් 20 ක් වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම 2013 වසර තුළ දී ගනු ලැබූ පියවර විය.

**2012 වසරේ දී සියයට 4.6 කින් වර්ධනය වූ සේවා අංශය, 2013 වසරේ දී සියයට 6.4 ක විශිෂ්ට වර්ධනයක් වාර්තා කළේය.** වසර තුළ දී සියලුම උප අංශයන්හි දක්නට ලැබුණු ප්‍රගතිය සේවා අංශයේ වර්ධනය සඳහා හේතු විය. ප්‍රවාහන සේවා, තොග සහ සිල්ලර වෙළෙඳාම, හෝටල් සහ ආපනශාලා මෙන්ම බැංකු සේවා, රක්ෂණ සේවා සහ දේපොළ වෙළෙඳාම් උප අංශයන්හි දක්නට ලැබුණු සැලකිය යුතු වර්ධනය, 2013 වසරේ දී සේවා අංශයේ වූ ශක්තිමත් වර්ධනයට හේතු විය. අභ්‍යන්තර වශයෙන් ගමනාගමනය දියුණු වීම සහ භෞතික යටිතල පහසුකම්හි ඇති වූ සීඝ්‍ර සංවර්ධනයට සමගාමීව ප්‍රවාහන උප අංශය පුළුල් වී ඇත. ගෝලීය වෙළෙඳපොළ තත්ත්වයන් වැඩිදියුණු වීම තුළින් වසරේ දෙවන භාගය තුළ දී විදේශීය වෙළෙඳාම නැවත යථා තත්ත්වයට පත්වීම සහ දේශීය වෙළෙඳ කටයුතු වර්ධනය වීම, තොග සහ සිල්ලර වෙළෙඳාම් උප අංශය ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීම සඳහා දායක විය. හෝටල් සහ ආපනශාලා උප අංශය පසුගිය වසරේ වර්ධන වේගය අභිබවා වර්ධනය වීමට සමත් විය. 2012 වසරේ දී ආර්ථිකය ස්ථායී කිරීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තීන්හි පසු බලපෑම් යම් තරමකට දක්නට ලැබුණ ද, බැංකු, රක්ෂණ සහ දේපොළ වෙළෙඳාම් උප අංශය සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරන ලදී. දළ දේශීය නිෂ්පාදිතය සඳහා සේවා අංශයේ දායකත්වය, 2011

**1.2 සංඛ්‍යා සටහන**

**සමස්ත ඉල්ලුම සහ ඉතිරිකිරීම් - ආයෝජන පරතරය**

| ශීර්ෂය | රුපියල් බිලියන | | වර්ධනය % | | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස | |
|---|---|---|---|---|---|---|
| | 2012 (අ) | 2013 (ආ) | 2012 (අ) | 2013 (ආ) | 2012 (අ) | 2013 (ආ) |
| **1. දේශීය ඉල්ලුම** | **8,614.1** | **9,500.3** | **14.9** | **10.3** | **113.7** | **109.5** |
| 1.1 පරිභෝජනය | 6,295.9 | 6,934.8 | 13.7 | 10.1 | 83.1 | 80.0 |
| පෞද්ගලික | 5,274.5 | 5,797.5 | 15.5 | 9.9 | 69.6 | 66.8 |
| රාජ්‍ය | 1,021.4 | 1,137.3 | 5.6 | 11.3 | 13.5 | 13.1 |
| 1.2 ආයෝජන (දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය) | 2,318.3 | 2,565.5 | 18.3 | 10.7 | 30.6 | 29.6 |
| පෞද්ගලික | 1,794.6 | 1,969.1 | 15.8 | 9.7 | 23.7 | 22.7 |
| රාජ්‍ය | 523.6 | 596.4 | 27.9 | 13.9 | 6.9 | 6.9 |
| **2. ශුද්ධ බාහිර ඉල්ලුම** | **-1,035.6** | **-826.4** | **-8.8** | **20.2** | **-13.7** | **-9.5** |
| භාණ්ඩ හා සේවා අපනයන | 1,730.5 | 1,949.3 | 14.7 | 12.6 | 22.8 | 22.5 |
| භාණ්ඩ හා සේවා ආනයන | 2,766.1 | 2,775.7 | 12.4 | 0.3 | 36.5 | 32.0 |
| **3. මුළු ඉල්ලුම (ද.දේ.නි) (1+ 2)** | **7,578.6** | **8,673.9** | **15.8** | **14.5** | **100.0** | **100.0** |
| **4. දේශිය ඉතිරිකිරීම් (3-1.1)** | **1,282.7** | **1,739.1** | **27.3** | **35.6** | **16.9** | **20.0** |
| පෞද්ගලික | 1,362.2 | 1,806.8 | 28.0 | 32.6 | 18.0 | 20.8 |
| රාජ්‍ය | -79.6 | -67.7 | -39.5 | 14.9 | -1.0 | -0.8 |
| **5. විදේශීය ශුද්ධ සාධක ආදායම** | **-154.9** | **-234.9** | **-115.1** | **-51.6** | **-2.0** | **-2.7** |
| **6. විදේශීය ශුද්ධ පෞද්ගලික ජංගම සංක්‍රාම** | **688.6** | **728.7** | **34.2** | **5.8** | **9.1** | **8.4** |
| **7. ජාතික ඉතිරිකිරීම් (4+5+6)** | **1,816.3** | **2,232.8** | **25.4** | **22.9** | **24.0** | **25.7** |
| **8. ඉතිරිකිරීම් ආයෝජන පරතරය** | | | | | | |
| දේශීය ඉතුරුම් - ආයෝජන (4-1.2) | -1,035.6 | -826.4 | | | -13.7 | -9.5 |
| ජාතික ඉතිරිකිරීම් - ආයෝජන (7-1.2) | -501.9 | -332.7 | | | -6.6 | -3.8 |
| **9. නිල ප්‍රදානයන් හැර විදේශීය** | | | | | | |
| **ජංගම ගිණුම් හිගය (2+5+6)** | **-501.9** | **-332.7** | | | **-6.6** | **-3.8** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික


මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සහ 2012 වසරවල දී පිළිවෙළින් සියයට 59.5 ක් සහ සියයට 58.6 ක් වූ අතර, කාර්මික අංශය වේගයෙන් පුළුල්වීම හේතුවෙන් 2013 වසරේ දී ද.දේ.නි.යට වූ දායකත්වය සියයට 58.1 ක් දක්වා අඩු වුවද තවදුරටත් ආර්ථිකයේ ප්‍රධානතම අංශය ලෙස පැවතුණි.

**වියදම් ප්‍රවේශයෙන් සලකා බැලූ විට, 2013 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයෙහි වර්ධනය සඳහා පරිභෝජන සහ ආයෝජන වියදම් වැඩිවීම හේතු විය.** කෙසේ වුවද, 2013 වසරේ දී රාජ්‍ය අංශයෙහි පරිභෝජන වියදම පෙර වසරට සාපේක්ෂව වැඩි වේගයකින් වර්ධනය වුවද, පෞද්ගලික අංශයේ පරිභෝජන වියදම අඩුවීම හේතුවෙන් මුළු පරිභෝජන වියදමෙහි වර්ධනය මන්දගාමී විය. අනාගත ආර්ථික අපේක්ෂාවන් පිළිබඳව ඇති විශ්වාසය පිළිබිඹු කරමින් ආයෝජන වියදම වර්ධනය විය. විදේශීය අංශයේ ඇති ඉල්ලුම වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ හා සේවා අපනයනය නාමික වශයෙන් සීඝ්‍ර ලෙස වර්ධනය වූ අතර, භාණ්ඩ හා සේවා ආනයන සුළු වශයෙන් පහත වැටුණි.

**2012 වසරේ දී දක්නට ලැබුණු වර්ධන ගම්‍යතාව අඛණ්ඩව පවත්වා ගනිමින් දේශීය ඉතුරුම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 20.0 ක් දක්වා වර්ධනය විය.** රාජ්‍ය අංශයේ ජංගම ගිණුමේ හිගය සංකෝචනය වීම හේතුවෙන් රාජ්‍ය අංශයේ නිර්-ඉතුරුම් අඩු වීම සහ පෞද්ගලික අංශයේ ඉතුරුම් වැඩි වීමෙහි සාමූහික ප්‍රතිඵලයක් ලෙස දේශීය ඉතුරුම් වර්ධනය විය. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ අඛණ්ඩව වර්ධනය වීම හේතුවෙන් 2013 වසරේ දී ජාතික ඉතුරුම් ද වර්ධනය විය. කෙසේ වෙතත්, ගෙවීම් වැඩිවීම තුළින් ශුද්ධ සාධක ආදායමේ දක්නට ලැබුණු පසුබෑසීම හේතුවෙන් ජාතික ඉතුරුම්හි වර්ධනය මන්දගාමී විය. මේ අතර, ආයෝජන කටයුතු මූල්‍යනය කිරීම සඳහා විදේශීය අංශය මත රඳාපැවතීම අඩුකරමින් සම්පත් පරතරය, 2013 වසරේ දී තවදුරටත් පටු විය.

**1.5 රූප සටහන** **ඉතිරිකිරීම් හා ආයෝජන (ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස)**





**2013 වසරේ දී පාරිභෝගික මිල උද්ධමනය ද පහළ යාමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් නොකඩවා පස්වන වසරටත් ලක්ෂ්‍යමය පදනම මත උද්ධමනය තනි අංකයක මට්ටමේ පවත්වා ගැනීමට හැකි විය.** කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) (2006/07=100) මඟින් ගණනය කරනු ලබන ලක්ෂ්‍යමය පදනම මත උද්ධමන අනුපාතය, අහිතකර කාලගුණික තත්ත්වය නිසා ආහාර සැපයුමට බාධා පැමිණීම හේතුවෙන් 2013 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල සියයට 9.8 ක් වැනි ඉහළ අගයක් වාර්තා කරන ලදී. දේශීය සැපයුම ඉහළ යාම, ජාත්‍යන්තර වෙළෙඳ භාණ්ඩ මිල මධ්‍යස්ථ මට්ටමක පැවතීම සහ විචක්ෂණශීලී මුදල් ප්‍රතිපත්ති 2013 මාර්තු මස සිට උද්ධමනය අඩුවීමට හේතු විය. වසර තුළ දී ආහාර කාණ්ඩයේ මිල වැඩිවීමට වඩා ආහාර නොවන කාණ්ඩයේ මිල අඩුවීම කැපී පෙනෙන අයුරින් සිදු විය. වසර තුළ දී නොයෙකුත් පරිපාලිත මිල ගණන් ඉහළ නංවමින් කළ සංශෝධනයන් මඟින්, සමස්ත මිල මත තරමක පීඩනයක් ඇති කිරීමට හේතු වූ අතර, එහි දෙවන වටයේ බලපෑම් අවම වන අයුරින් මනා ලෙස පාලනය කරගන්නා ලදී. 2013 දෙසැම්බර් මාසයේ දී ලක්ෂ්‍යමය පදනම මත උද්ධමන අනුපාතය මෙම වසර අවම අගය වන සියයට 4.7 ක් වූ අතර, 2012 වසර අවසාන වන විට සියයට 7.6 ක්ව පැවති වාර්ෂික සාමාන්‍ය පදනම මත උද්ධමන අනුපාතය ද 2013 වසර අවසාන වන විට සියයට 6.9 ක් දක්වා පහත වැටිණි. මනා ලෙස පාලනය කළ ඉල්ලුම් තත්ත්වයන් පිළිබිඹු කරමින් ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය අඩු අගයක පැවති අතර, 2013 දෙසැම්බර් මාසයේ දී එය එහි වාර්තා වූ අවම අගය වන සියයට 2.1 ක් දක්වා අඩු විය.


## විදේශීය අංශයේ වර්ධනයන්

**2013 වසරේ දී විදේශීය අංශය යහපත් ක්‍රියාකාරිත්වයක් පෙන්වූ අතර, යෝග්‍ය දේශීය පරිසරය සහ ගෝලීය ආර්ථිකයෙහි හිතකර සංවර්ධනය මේ සඳහා උපකාරී විය.** ඉහළ ගිය අපනයන ආදායම සහ අඩු ආනයන වියදම, වෙළෙඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු කිරීමට හේතු විය. සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සංචාරක ඉපැයීම් සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, වෙළෙඳ හිඟය ආවරණය කිරීම සඳහා එය ඉවහල් විය. මෙම සංවර්ධනයන් සමඟම අනෙකුත් සේවා අපනයනයෙන් ලද ආදායම් ඉහළයාම හේතුවෙන් විදේශීය අංශයේ ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩු විය. 2013 වසරේ දී විදේශීය සෘජු ආයෝජන ලෙස මූල්‍ය ගිණුම වෙත වූ සැලකිය යුතු ලැබීම් සහ රජය වෙත වූ ලැබීම් සමඟ බැංකු හා අනෙකුත් සංස්ථාපිත සමාගම් 2013 වසර අවසන් වන විට ගෙවුම් තුලනයේ එ.ජ.ඩොලර් මිලියන 985 ක සමස්ත අතිරික්තයක් වාර්තා කිරීමට උපකාරී වූ අතර, එමගින් රටෙහි සංචිත ප්‍රමාණය වර්ධනය විය. මේ අතර, විනිමය අනුපාත තීරණය වීමේ නම්‍යශීලීතාවය තවදුරටත් පැවති අතර, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් ශුද්ධ පදනම මත විදේශ විනිමය අවශෝෂණය කර ගැනීම තුළින් 2013 වසරේ දී

**1.6 රූප සටහන** **වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය**




**1.7 රූප සටහන** **ගෙවුම් තුලනය**



**1.3 සංඛ්‍යා සටහන** — **විදේශීය අංශයේ ප්‍රවණතා (අ)**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් මිලියන 2012 (ආ) | එ.ජ.ඩොලර් මිලියන 2013 (ඇ) | ප්‍රතිශත වෙනස % |
|---|---|---|---|
| **ජංගම ගිණුම** | **-3,982** | **-2,607** | **-34.5** |
| **වෙළෙඳ ශේෂය** | **-9,417** | **-7,609** | **-19.2** |
| **අපනයන** | **9,774** | **10,394** | **6.4** |
| කෘෂිකාර්මික නිෂ්පාදන | 2,331 | 2,581 | 10.7 |
| කාර්මික නිෂ්පාදන | 7,371 | 7,749 | 5.1 |
| ඛනිජ අපනයන | 61 | 52 | -15.9 |
| වෙනත් අපනයන | 10 | 12 | 26.6 |
| **ආනයන** | **19,190** | **18,003** | **-6.2** |
| පාරිභෝගික භාණ්ඩ | 2,995 | 3,182 | 6.3 |
| අන්තර් භාණ්ඩ | 11,578 | 10,554 | -8.8 |
| ආයෝජන භාණ්ඩ | 4,590 | 4,253 | -7.3 |
| වෙනත් | 28 | 14 | -50.0 |
| **සේවා (ශුද්ධ)** | **1,262** | **1,180** | **-6.5** |
| ලැබීම් | 3,800 | 4,685 | 23.3 |
| ගෙවීම් | 2,538 | 3,505 | 38.1 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-1,219** | **-1,817** | **49.1** |
| ලැබීම් | 142 | 148 | 4.1 |
| ගෙවීම් | 1,361 | 1,965 | 44.4 |
| **ද්විතීයක ආදායම් (ශුද්ධ)** | **5,392** | **5,639** | **4.6** |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 5,339 | 5,619 | 5.2 |
| ලැබීම් | 5,985 | 6,407 | 7.0 |
| ගෙවීම් | 646 | 788 | 22.0 |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 53 | 21 | -60.5 |
| **ප්‍රාග්ධන ගිණුම** | **130** | **71** | **-45.6** |
| **ජංගම ගිණුම + ප්‍රාග්ධන ගිණුම** | **-3,851** | **-2,536** | **-34.2** |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **4,263** | **3,126** | **-26.7** |
| **මූල්‍ය වත්කම් හි ශුද්ධ වැඩිවීම්** | **1,177** | **955** | **-18.8** |
| සෘජු ආයෝජන | 64 | 65 | 1.8 |
| විවිධ ආයෝජන | -10 | ... | |
| ණය සුරැකුම්පත් | -10 | ... | |
| අනෙකුත් ආයෝජන | 363 | -222 | -161.1 |
| මුදල් හා තැන්පතු | 162 | -459 | -383.4 |
| වෙළෙඳ ණය සහ අත්තිකාරම් | 90 | 195 | 116.0 |
| අනෙකුත් ගිණුම් ලැබිය යුතු | 111 | 42 | -61.8 |
| සංචිත වත්කම් | 760 | 1,112 | 46.2 |
| **වගකීම් හි ශුද්ධ වැඩිවීම** | **5,440** | **4,081** | **-25.0** |
| සෘජු ආයෝජන | 941 | 916 | -2.7 |
| විවිධ ආයෝජන | 2,116 | 2,106 | -0.5 |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | 272 | 263 | -3.4 |
| ණය සුරැකුම්පත් | 1,844 | 1,843 | -0.1 |
| අනෙකුත් ආයෝජන | 2,384 | 1,060 | -55.5 |
| මුදල් හා තැන්පතු | 447 | 108 | -75.9 |
| ණය | 3,070 | 949 | -69.1 |
| වෙළෙඳ ණය හා අත්තිකාරම් | -571 | -54 | -90.5 |
| අනෙකුත් ගිණුම් ගෙවිය යුතු | -563 | 58 | -110.2 |
| විශේෂ ගැනුම් හිමිකම් | - | - | |
| වැරදීම් සහ අත්හැරීම් | -412 | -590 | |
| **සමස්ත ශේෂය** | **151** | **985** | |
| **දළ නිල සංචිත** | **7,106** | **7,495** | |
| **ආනයනික මාස ගණන** | **4.4** | **5.0** | |
| මුළු විදේශීය වත්කම් | 8,586 | 8,574 | |
| ආනයනික මාස ගණන | 5.4 | 5.7 | |
| අපනයන මිල දර්ශකය (2010=100) | 103.1 | 103.5 | 0.4 |
| ආනයන මිල දර්ශකය (2010=100) | 115.2 | 108.4 | -5.9 |
| **වෙළෙඳ අනුපාතය** | **89.5** | **95.5** | **6.7** |
| **විනිමය අනුපාත (සාමාන්‍යය)** | | | අධිප්‍රමාණ(+)/ අවප්‍රමාණ(-) |
| රුපියල්/එ.ජ.ඩොලර් | 127.60 | 129.11 | -1.2 |
| රුපියල්/ජපන් යෙන් | 1.60 | 1.32 | 20.7 |
| රුපියල්/යුරෝ | 164.01 | 171.51 | -4.4 |
| රුපියල්/බ්‍රිතාන්‍ය පවුම් | 202.28 | 202.08 | 0.1 |
| රුපියල්/ඉන්දියානු රුපියල | 2.39 | 2.21 | 8.2 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංඛ්‍යා සටහනේ භාවිතා කර ඇති වර්ගීකරණය ජා.මු. අරමුදල විසින් ප්‍රකාශයට පත්කරන ලද ගෙවුම් තුලන අත්පොතෙහි හයවන සංස්කරණයට (2009) අනුකූල වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

රුපියලෙහි විචල්‍යතාවය අඩු කරන ලදී. ඇමෙරිකා එක්සත් ජනපදය විසින් සිය ප්‍රමාණාත්මක ලිහිල්කරණ වැඩසටහන හීන කිරීම පිළිබඳව නිවේදනය කිරීමෙන් අනතුරුව අනෙකුත් බොහෝ කලාපීය රටවල් විසින් අත්දකින ලද ශුද්ධ විදේශ විනිමය ගලායාම් සහ ව්‍යවහාර මුදල් දැඩි ලෙස අවප්‍රමාණය වීම් සමඟ සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ රුපියල ස්ථායීව පැවතීම විශේෂ තත්ත්වයකි.

**2013 වසරේ දී අපනයන වැඩිවීමත් රජය සහ මහ බැංකුව විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණවල බලපෑම පිළිබිඹු කරමින් ආනයන අඛණ්ඩව අඩුවීමත් සමඟ, වෙළෙඳ ගිණුමේ හිඟය සීඝ්‍ර ලෙස අඩුවිය.** 2012 වසරේ දී සියයට 7.4 කින් පහත වැටුණු අපනයන ආදායම, ප්‍රධාන වෙළෙඳ හවුල්කාර ආර්ථිකයන් ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීමත් සමග 2013 වසරේ දී සියයට 6.4 කින් වර්ධනය විය. සමස්ත අපනයන වර්ධනය සඳහා සියයට 61 ක දායකත්වයක් සපයමින් කාර්මික අපනයන ආදායම 2013 වසරේ දී සියයට 5.1 කින් වර්ධනය වූ අතර, රෙදිපිළි හා ඇඟළුම් අපනයන ඉහළ මට්ටමක පැවතීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවිය. 2013 වසරේ දී සමස්ත අපනයනයන්ගෙන් සියයට 43.4 කට දායකත්වය සැපයූ රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම සියයට 13 කින් වර්ධනය විය. ඇඟළුම් අපනයනය කරන ප්‍රධාන රටවල් වන යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය වෙත කළ ඇඟළුම් අපනයන පිළිවෙළින් සියයට 6.8 කින් සහ සියයට 21.0 කින් වර්ධනය විය. 2013 වසරේ දී කෘෂිකාර්මික අපනයනවලින් ලද ආදායම සියයට 10.7 කින් වර්ධනය වූ අතර, කෘෂිකාර්මික අපනයනවලින් සියයට 74 කට පමණ දායකත්වය සපයන තේ සහ කුළුබඩු අපනයනයන්හි සිදු වූ ඉහළ වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ගෝලීය ඉල්ලුම අඩුවීම හේතුවෙන් අනෙකුත් වෙළෙඳ භාණ්ඩ බොහොමයක මිල ගණන් පහත වැටුණ ද, නිෂ්පාදනයන්හි උසස් ගුණාත්මකභාවය හේතුවෙන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත තේ සහ කුළුබඩු අන්තර්ජාතික වෙළෙඳපොළ තුළ ඉහළ මිලක් අත්කර ගන්නා ලදී.

**2013 වසරේ දී ආනයන වියදම සියයට 6.2 කින් පහත වැටුණු අතර, ඉන්ධන නොවන ආනයන වියදම සියයට 3.2 කින් අඩු විය.** ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන අඩුවීම හේතුවෙන් අන්තර්භාණ්ඩ ආනයන සියයට 8.8 කින් පහළ යාම, 2013 වසරේ දී ආනයන වියදම පහත වැටීම සඳහා විශාලතම දායකත්වය සපයන ලදී. වසර තුළ දී ප්‍රධාන වශයෙන් තාප විදුලිබල උත්පාදනය අඩු වීම හේතුවෙන් 2013 වසරේ දී ඉන්ධන ආනයන වියදම සියයට 14.6 කින් පහත වැටුණි. ඇඟළුම් ක්ෂේත්‍රයේ එකතු කළ අගය ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස රෙදිපිළි හා රෙදිපිළි

උපාංග ආනයනය සියයට 9.7 කින් අඩු විය. ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍රසූත්‍ර ආනයනයන්හි සැලකිය යුතු පහළ යාම හේතුවෙන්, වසර තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ද සියයට 7.3 කින් පහත වැටුණි. කෙසේ වුවද, ආහාර හා පාන මෙන්ම ආහාරමය නොවන භාණ්ඩ ආනයනයන්හි වර්ධනයක් පිළිබිඹු කරමින් පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 6.3 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් රථවාහන ආනයනවල සිදු වූ සියයට 17.6 ක වර්ධනය හේතුවෙන් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

**වෙළෙඳ ගිණුමෙහි අඩුවීම, සේවා අපනයන මත වූ ඉහළ දළ ලැබීම් සහ වර්ධනය වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2013 වසරේ දී ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුමෙහි හිඟය සැලකිය යුතු ලෙස පහළ යාම සඳහා දායක විය.** ප්‍රධාන වශයෙන් විදේශ ගමන් හා සංචාරක සේවා, ප්‍රවාහන, පරිගණක සහ තොරතුරු සේවා සහ උප අංශයන්හි වර්ධනය හේතුකොටගෙන, 2013 වසරේ දී සේවා ගිණුමෙහි තවදුරටත් අතිරික්තයක් වාර්තා කරන ලදී. මගී ගාස්තු, නැව් කුලී, වරාය සහ ගුවන් තොටුපොළ ආශ්‍රිත සේවාවන්ගෙන් සමන්විත, සේවා ගිණුමෙහි ප්‍රධාන අංශය වන ප්‍රවාහන සේවා සඳහා වූ දළ ලැබීම්, 2013 වසරේ දී සියයට 9.2 ක පැහැදිලි වර්ධනයක් පෙන්වීය. සංචාරක පැමිණීම් ඉහළ යාම, බහලුම් මෙහෙයවීම් වර්ධනය වීම සහ දේශීය ගුවන් සේවා මගින් සේවය සපයන ලද ගමනාන්ත සංඛ්‍යාව ඉහළ යාම ප්‍රවාහන සේවා උප අංශයෙහි වර්ධනයට විශාල වශයෙන් දායක විය. ඵලදායී ප්‍රචාරක වැඩසටහන් සහ යටිතල පහසුකම් වර්ධනය හේතුවෙන් 2013 වසරේ දී ශ්‍රී ලංකාව වෙත සංචාරකයින් වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට හැකි විය. තවද, සංචාරකයෙකුගේ දෛනික සාමාන්‍ය වියදම ඉහළ යාමත් සමඟ 2012 වසරට සාපේක්ෂව 2013 වසරේ දී සංචාරක ඉපැයුම් සියයට 65.1 කින් සීඝ්‍ර ලෙස වර්ධනය විය. විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවාවන් ද වැඩිදියුණු වූ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. ශ්‍රී ලංකාවෙහි ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO) සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (KPO) වැනි මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවාවල වැඩිදියුණු වීමට ඇති ශක්‍යතාව පිළිබිඹු කරමින් 2013 වසරේ ඔක්තෝබර් මාසයේ දී එක්සත් රාජධානියේ National Outsourcing Association (NOA) මගින් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ හොඳම රටට පිරිනමන, "Outsourcing Destination of the Year" සම්මානය ශ්‍රී ලංකාව වෙත පිරිනමන ලදී. දකුණු ආසියාවේ නැගී එන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය ලෙස හම්බන්තොට ප්‍රදේශයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කලාපයක් පිහිටුවීමේ යෝජනාවක් ද ඉදිරිපත් කර ඇත. මේ අතර, 2013 වසරේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් තවදුරටත් ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන විදේශ විනිමය ඉපැයීමේ මූලයක් වූ අතර, එය වෙළෙඳ ගිණුමෙහි හිඟය සැලකිය යුතු ලෙස ආවරණය කිරීම සඳහා දායක විය. විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ සංයුතිය නුපුහුණු සහ ගෘහ සේවා ශ්‍රමික කාණ්ඩයන්හි සිට වෘත්තීමය සහ කුසලතා කාණ්ඩයන් වෙත පරිවර්තනය වීම සැලකිය යුතු ලක්ෂණයකි. මෙම වර්ධනයන් හා සමගාමීව, විදේශීය ජංගම ගිණුමේ හිඟය 2012 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 3,982 සිට 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 2,607 දක්වා සියයට 34.5 කින් සැලකිය යුතු ලෙස තවදුරටත් අඩු විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ දී සියයට 6.7 ක් වූ ජංගම ගිණුමේ හිඟය 2013 වසරේ දී සියයට 3.9 ක් දක්වා අඩු විය. මේ අතර, ගෙවුම් තුලනයෙහි ප්‍රාග්ධන ගිණුමෙහි ශුද්ධ ලැබීම් 2012 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 130 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 71 ක් වාර්තා කළේය.

**ගෝලීය ආර්ථික තත්ත්වය ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීම සහ ශ්‍රී ලංකාව පිළිබඳ ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය වීම පිළිබිඹු කරමින්, 2013 වසරේ දී සැලකිය යුතු මූල්‍ය ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය.** ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් ණය ද ඇතුළත් විදේශීය සෘජු ආයෝජන 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 1,421 ක් දක්වා සියයට 2.8 කින් වර්ධනය වූ අතර, යටිතල පහසුකම් සහ නිෂ්පාදන අංශයන් විසින් විදේශීය සෘජු ආයෝජන වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කර ගන්නා ලදී. මේ අතර, බැංකු අංශය විසින් විදේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළෙහි ණය සුරැකුම්පත් නිකුත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස, 2013 වසරේ දී මූල්‍ය ලැබීම් සැලකිය යුතු ලෙස රට වෙත ගලාඑන ලදී. 2012 වසරේ දී ලංකා බැංකුව මගින් ලබාගත් එ.ජ.ඩොලර් මිලියන 500 ට සාපේක්ෂව, 2013 වසරේ දී ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ලංකා බැංකුව සහ ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය විසින් සමස්තයක් ලෙස එ.ජ.ඩොලර් බිලියන 1.35 ක අරමුදල් ප්‍රමාණයක් රැස්කරන ලදී. 2013 වසරේ දී විදේශීය ණය ලෙස එ.ජ.ඩොලර් බිලියන 2.9 ක සැලකිය යුතු මූල්‍ය ලැබීම් ප්‍රමාණයක් ලැබුණි. විශේෂයෙන්ම, ප්‍රමුඛතා පදනමකින් සිදුකළ යුතු මාර්ග අලුත්වැඩියාව සහ දුම්රිය මාර්ග නැවත සකස් කිරීම හා දීර්ඝ කිරීම වැනි මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘතිවලට ලැබුණු ව්‍යාපෘති ණය ලෙස රජයට ලැබුණු ලැබීම් 2013 වසරේ දී පසුගිය වසරට සාපේක්ෂව සුළු අඩුවීමක් වාර්තා

කරන ලදී. මේ අතර, බැංකු කිහිපයක් ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ දිගුකාලීන ණය සුරැකුම්පත් නිකුත් කිරීමත් සමඟ තැන්පතු භාර ගන්නා ආයතන විසින් විදේශීය ණය මත රඳා පැවැත්ම අඩු විය.

**විදේශීය ජංගම ගිණුම් ශේෂයෙහි වර්ධනය සහ මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළ යාමත් සමඟ 2013 වසරේ දී ගෙවුම් තුලනය සැලකිය යුතු අතිරික්තයක් වාර්තා කළේය.** ගෙවුම් තුලනයේ සමස්ත අතිරික්තය 2012 වසරේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 151 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 985 ක් විය. ගෙවුම් ශේෂයේ වැඩිදියුණු වීම පිළිබිඹු කරමින් රටෙහි සංචිත වත්කම් තත්ත්වය 2012 වසර අවසානයේ පැවති එ.ජ.ඩොලර් බිලියන 7.1 ක සිට 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 7.5 දක්වා තවදුරටත් වර්ධනය විය. ඒ අනුව, සංචිත වත්කම් ප්‍රමාණය භාණ්ඩ ආනයනික මාස 5.0 කට සහ භාණ්ඩ හා සේවා ආනයනික මාස 4.2 කට සමාන විය. මීට අමතරව, තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය මූල්‍ය වත්කම්වල වර්ධනය හේතුවෙන් 2013 වසර අවසානයේ දී මුළු විදේශීය වත්කම් ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 8.6 ක් දක්වා වැඩි වූ අතර, එය භාණ්ඩ ආනයනික මාස 5.7 කට සහ භාණ්ඩ හා සේවා ආනයනික මාස 4.8 කට සමාන විය.

**පෞද්ගලික අංශයට සහ තැන්පතු භාර ගන්නා ආයතනයන් වෙත වූ ලැබීම් 2013 වසරේ මුළු විදේශීය ණය ප්‍රමාණය වර්ධනය වීම සඳහා හේතු විය.** පෞද්ගලික අංශය විසින් ලබාගත් විදේශීය ණය ප්‍රමාණය 2013 වසරේ දී සියයට 16 කින් වර්ධනය වූ අතර, බැංකු අංශයට වසර තුළ දී ණය සුරැකුම්පත් නිකුත් කිරීම මගින් ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ තුළ එ.ජ.ඩොලර් බිලියන 1.35 ක අරමුදල් රැස්කර ගැනීම සඳහා විනිමය පාලන රෙගුලාසි ලිහිල් කිරීම් සහ රටෙහි සාර්වආර්ථික කටයුතු වර්ධනය වීම උපකාරී විය. 2012 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 37.1 ක් ව පැවැති රටෙහි නොපියවූ මුළු විදේශීය ණය ප්‍රමාණය 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 39.7 දක්වා සියයට 7.1 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ දී සියයට 62.5 ක් වූ නොපියවූ මුළු විදේශීය ණය ප්‍රමාණය 2013 වසරේ දී සියයට 59.2 ක් දක්වා අඩු විය. රජය සහ පෞද්ගලික අංශය දිගුකාලීන ණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ බැවින්, මුළු විදේශීය ණයෙහි ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ දී සියයට 17.3 ක් වූ කෙටිකාලීන ණය ප්‍රමාණය 2013 වසරේ දී සියයට 16.4 ක් දක්වා අඩු විය. මේ අතර, මුළු විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2013 වසරේ දී ඉහළ ගියේය. මුළු විදේශීය ණය සේවා ගෙවීම්වල ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ දී සියයට 19.7 ක් වූ භාණ්ඩ හා සේවා අපනයන ලැබීම් 2013 වසරේ දී සියයට 25.3 ක් දක්වා වර්ධනය විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සම්පස්ථ ණය පහසුකමට අදාළ ණය ආපසු ගෙවීම්, රජයේ සුරැකුම්පත් කල්පිරීමේ ගෙවීම් ඉහළ යාම සහ පෞද්ගලික අංශයේ ණය ආපසු ගෙවීම් හා පොලී ගෙවීම් ඉහළ යාම මේ සඳහා මූලික වශයෙන් හේතු විය.

**විදේශ විනිමය අනුපාතික නිර්ණය කිරීමේ නම්‍යශීලීභාවය පවත්වා ගැනීම කෙරෙහි 2013 වසරේ දී විදේශ විනිමය ප්‍රතිපත්තිය තවදුරටත් යොමු විය.** වසරේ මුල් භාගයේ වැඩි කොටසක දී එ.ජ.ඩොලරයට එරෙහිව ස්ථාවරව පැවති රුපියල, ජුනි සහ ජූලි මාසවල දී ඉහළ ගිය ආනයන ඉල්ලුම සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ බැඳුම්කර මිලදී ගැනීමේ වැඩසටහන සීමා කිරීමේ ඉඩප්‍රස්ථාව මත රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ තුළින් විදේශීය ආයෝජකයන් ඉවත්ව යනු ඇතැයි යන අපේක්ෂාව හේතුවෙන්, ජුනි මස මැද සිට අගෝස්තු මාසය දක්වා කාලය තුළ දී රුපියල, එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 5 කින් අවප්‍රමාණය විය. කෙසේ වුවද, ඇමෙරිකා එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව මගින් ක්‍රියාත්මක කරන ප්‍රමාණාත්මක ලිහිල්කරණ වැඩසටහන හීන කිරීමට ඇති ඉඩප්‍රස්ථාව පිළිබඳ සඳහන් කිරීමෙන් අනතුරුව ඇඩි අවප්‍රමාණය වීම්වලට ලක් වූ ඉන්දියානු රුපියල සහ ඉන්දුනීසියා රුපියා වැනි නැගීඑන වෙළෙඳපොළවල්හි මුදල් ඒකක හා සැසඳීමේ දී ශ්‍රී ලංකා රුපියලෙහි අවප්‍රමාණය අවම තත්ත්වයක පැවතුණි. බැංකු අංශය වෙත වූ ලැබීම් ඉහළ යාම හේතුවෙන් සැප්තැම්බර් මස මුල සිට ශ්‍රී ලංකා රුපියල අධිප්‍රමාණය විය. සමස්තයක් ලෙස, 2013 වසර අග වනවිට, රුපියල එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 2.75 කින් රුපියල් 130.75 දක්වා අවප්‍රමාණය විය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා රුපියල 2013 වසරේ දී අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පෙන්වීය. මේ අතර, නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතිකයන් 2012 වසරේ දක්නට ලැබුණු අවප්‍රමාණය වීමට සාපේක්ෂව තරමක අධිප්‍රමාණය වීමක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2013 දෙසැම්බර් මස අවසානය වනවිට මුදල් වර්ග 24 කින් යුත් පැස මත පදනම් වූ නාමික හා මූර්ත සඵල විනිමය අනුපාතික සහ මුදල් වර්ග 5 කින් යුත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකය මධ්‍යස්ථ ප්‍රමාණයකින් අධිප්‍රමාණය වූ අතර, මුදල් වර්ග 5 කින් යුත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතිකය සුළු වශයෙන් අවප්‍රමාණය විය. තවද, නුදුරු අනාගතයේ දී රුපියල අධිප්‍රමාණය වනු ඇතැයි යන


වෙළෙඳපොළ අපේක්ෂාව පිළිබිඹු කරමින් මාස 3 සහ මාස 6 යන කාල පරාසයන් සඳහා වූ සාමාන්‍ය ඉදිරි විනිමය ගනුදෙනු අධිමිල පොලී අනුපාතික අන්තරයෙහි සාමාන්‍යයට වඩා පහළින් පැවතුණි.

### රාජ්‍ය මූල්‍ය අංශයේ වර්ධනයන්

රටේ මැදි හා දිගුකාලීන දැක්මට අනුව 2013 වසරේ දී **රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති උපාය මාර්ග ඉලක්කය වූයේ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරන අතර පුළුල් සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා සහාය දැක්වීමය.** ඒ අනුව, 2009 වසරේ සිට අනුගමනය කරන ලද අයවැය හිඟය අඩුකර ගැනීමේ ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වා ගනිමින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය 2012 වසරේ පැවති සියයට 6.5 සිට 2013 වසරේ දී සියයට 5.8 දක්වා අඩුකර ගැනීමට අපේක්ෂා කරන ලදී. ප්‍රදාන ඇතුළුව රාජ්‍ය ආදායමෙහි මෑත කාලයේ පැවති අඩුවීමේ ප්‍රවණතාවය වෙනස් කරමින්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2013 වසරේ දී එය සියයට 14.7 ක් දක්වා වැඩිකර ගැනීමට අපේක්ෂා කළ අතර, වියදම් හා ශුද්ධ ණයදීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 20.5 ක පමණ ප්‍රමාණයක පවත්වා ගැනීමට අපේක්ෂා කරන ලදී. මෙම පුරෝකථනයන් සපුරා ගැනීම සඳහා, රාජ්‍ය ආදායම සහ රාජ්‍ය වියදමට අදාළ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගණනාවක් ක්‍රියාත්මක කරන ලදී. කෙසේ වෙතත්, විශේෂයෙන්ම වසරේ මුල් භාගය තුළ ආනයන ආශ්‍රිත බදු ආදායමේ වර්ධනය මන්දගාමී වීම හේතුවෙන් රාජ්‍ය ආදායම පහළ යාම, රාජ්‍ය මූල්‍ය කටයුතුවල සුමට ක්‍රියාකාරිත්වයට බලපාන ලදී. වසර අවසානයේ දී ආනයන ආශ්‍රිත බදු වැඩිවීම සහ දේශීය ආර්ථික

**1.8 රූප සටහන**

**රාජ්‍ය ආදායම, වියදම සහ සමස්ත අයවැය හිඟය (ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස)**




ක්‍රියාකාරකම් පුළුල්වීමත් සමග රාජ්‍ය ආදායම අඩුවීමේ ප්‍රවණතාව නැවත යථා තත්ත්වයට පත් වෙමින් 2013 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් රාජ්‍ය අයවැය හිඟය ඇස්තමේන්තුගත ඉලක්කය වූ සියයට 5.8 ට වඩා සුළු ප්‍රමාණයකින් වැඩි වෙමින් සියයට 5.9 ක් ලෙස පවත්වා ගැනීමට හැකි වූ අතර, එමගින් මෑත කාලයේ සාක්ෂාත් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාව අඛණ්ඩව පවත්වා ගැනීමට හැකි විය. රාජ්‍ය ආදායම මන්දගාමීව වර්ධනය වුවද, රජය විසින් සැලසුම් සහගත ලෙස වියදම් කළමනාකරණය කිරීම, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයට හේතු විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් යන ද්විත්වයෙහිම සිදු වූ අඩුවීම හේතුවෙන් මුළු වියදම් හා ශුද්ධ ණයදීම් අඩු විය. කෙසේ වෙතත්, රාජ්‍ය ආදායම අපේක්ෂිත මට්ටමට වඩා පහළ මට්ටමක පැවති හෙයින් රජය විසින් රාජ්‍ය ආයෝජන, ප්‍රමුඛතාවය මත පදනම්ව දියත් කළ අතර, වසර තුළ දී රාජ්‍ය ආයෝජන සියයට 5.5 ක මට්ටමේ ම පවත්වා ගන්නා ලදී. ඒ තුළින් වසර තුළ දී යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති රැසක් ආරම්භ කිරීම සඳහා සහ විදේශ ආධාර මගින් මූල්‍යනය වන ව්‍යාපෘති අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා වූ රජයේ කැපවීම පිළිබිඹු කරයි. අයවැය හිඟය මූල්‍යනය සඳහා දේශීය මූලාශ්‍රවලින්, ප්‍රධාන වශයෙන් බැංකු අංශයෙන්, වූ දායකත්වය සියයට 76 ක් විය.


**නාමික වශයෙන් ආදායම 2012 වසරට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 8.2 කින් වැඩි වුවද, මුළු රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ පැවති සියයට 13.9 ට සහ අයවැය මගින් අපේක්ෂා කළ සියයට 14.5 ට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 13.1 දක්වා අඩු විය.** වසරේ පළමු භාගය තුළ දී ආනයන ආශ්‍රිත බදු ආදායම අඩුවීම සහ රජයට අයත් ව්‍යවසායයන් වෙතින් සිදු කරන ලද ලාභ පැවරීම් සැලකිය යුතු ලෙස අඩුවීම රාජ්‍ය ආදායමේ පහළ ක්‍රියාකාරිත්වයට හේතු විය. 2013 වසරේ දී මුළු ආදායම (රුපියල් බිලියන 1,137.4) වාර්ෂික ඇස්තමේන්තුගත අයවැයෙහි මට්ටමට වඩා සැලකිය යුතු ලෙස අඩු විය. බදු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ වාර්තා වූ සියයට 12.0 සිට සියයට 11.6 දක්වා අඩු විය. ආර්ථික සේවා ගාස්තු, වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද සහ ඛනිජතෙල් ආශ්‍රිත නිෂ්පාදන බද්ද සැලකිය යුතු ලෙස අඩුවීම රාජ්‍ය ආදායම් අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. බදු නොවන ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පෙර වසරේ වාර්තාගත සියයට 1.9 සිට සියයට 1.5 දක්වා පහළ ගිය අතර, රජයට අයත් ව්‍යවසායන් සහ මහ බැංකුව වෙතින් කරන ලද ලාභ සහ ලාභාංශ පැවරීම්වල සිදු වූ සැලකිය යුතු අඩුවීම පිළිබිඹු කරමින් නාමික වශයෙන් එය සියයට 7.7 ක් දක්වා අඩු විය.

රජයේ මුළු වියදම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් වශයෙන් 2012 වසරේ දී පැවති සියයට 20.5 සිට 2013 වසරේ දී සියයට 19.2 ක් දක්වා අඩු විය. මෙය රාජ්‍ය ආදායම් අංශයේ පහළ ක්‍රියාකාරිත්වයට ප්‍රතිචාරයක් ලෙස අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම් මත පැනවූ සීමාවන් සමඟ වර්තන වියදම අඩු වීම හා ප්‍රාග්ධන වියදම් ප්‍රමුඛතාගත කිරීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. වර්තන වියදම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ වූ සියයට 14.9 සිට 2013 වසරේ දී සියයට 13.9 ක් දක්වා පහළ වැටුණු අතර ප්‍රාග්ධන හා ශුද්ධ ණයදීම් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ පැවති සියයට 5.6 සිට 2013 දී සියයට 5.4 ක් දක්වා පහළ වැටුණි.

දේශීය සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ පැවති අඩු පොලී අනුපාතිකවල වාසිය ලබමින්, අයවැය හිඟය මූල්‍යනය කිරීමේ දී රජය විසින් දේශීය ණය උපකරණ මත වැඩි රුචියාවක් දැක්වීය. ඒ අනුව, පෙර වසරේ දී සමස්ත මූල්‍යයනයෙන් සියයට 41.4 ක් වූ ශුද්ධ දේශීය මූල්‍යනය මෙම වසරේ දී සියයට 76 ක් වූ අතර, ඉතිරි සියයට 24 විදේශීය මූලාශ්‍ර මඟින් මූල්‍යනය කරන ලදී. දේශීය බැංකු අංශයෙන් ලද ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් බිලියන 297 ක් වූ අතර, එය සමස්ත ශුද්ධ දේශීය මූල්‍යනයෙන් සියයට 75.7 ක් විය. මෙය 2013 අයවැයෙහි ඇස්තමේන්තුගත කළ රුපියල් බිලියන 70 සහ පෙර වසරේ බැංකු මූල්‍යනය වූ රුපියල් බිලියන 131.5 ද ඉක්මවා ගියේය. දේශීය බැංකු නොවන අංශයෙන් සිදු කළ සමස්ත මූල්‍යනය රුපියල් බිලියන 95.4 ක් විය. විදේශ ව්‍යාපෘති මූල්‍යනය හා රුපියල්වලින් වටිනාකම නාමනය කරන ලද දේශීය ණය උපකරණ මත සිදු කළ විදේශ ආයෝජන ඇතුළත් විදේශ මූල්‍යනය රුපියල් බිලියන 123.7 ක් විය.

නොපියවූ රාජ්‍ය ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2012 වසර අවසානය වනවිට පැවති සියයට 79.2 සිට 2013 දෙසැම්බර් අවසානය වනවිට සියයට 78.3 ක් දක්වා අඩු විය. නාමික වශයෙන් ගත්කල, 2013 වසර අවසානය වනවිට සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 6,793.2 ක් දක්වා සියයට 13.2 කින් වැඩි විය.

**1.9 රූප සටහන**
**රාජ්‍ය ණය**
**(ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස)**




### මුදල් අංශයේ වර්ධනයන්

ඉහළ ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා ආර්ථික කටයුතුවලට අනුබල සැපයීමේ අරමුණින්, 2012 දෙසැම්බර් මස දී ආරම්භ වූ මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම 2013 වසරේ දී ද අඛණ්ඩව ම ක්‍රියාත්මක වූ අතර, ඒ සඳහා උද්ධමනය අඩු මට්ටමක පැවතීම උපකාරී විය. මහ බැංකුව විසින් සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික 2013 වසරේ දී පියවර දෙකකදී පදනම් අංක 100 කින් පහත දමන ලදී. 2013 වසරේ මැයි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50 කින් අඩු කිරීමට කෙටිකාලීන වෙළෙඳපොළ පොලී අනුපාතික ක්ෂණිකව ප්‍රතිචාර දැක්වූවද, වසරේ පළමු භාගය තුළදී වෙළෙඳපොළ ණය පොලී අනුපාතිකවල අනම්‍ය ස්වභාවයක් දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2013 ඔක්තෝබර් මාසයේදී මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කරමින් ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50 කින් පහත දමන ලදී. මේ අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතික පහළ දැමීමට අනුපූරකයක් ලෙස මෙන්ම වාණිජ බැංකුවල තැන්පතු සහ ණය පොලී අනුපාතික අතර පරතරය අඩු කිරීම සඳහා, 2013 ජූලි මස සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකුව විසින් සිය ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 6 දක්වා ප්‍රතිශතාංක 2 කින් පහත දමන ලදී. ණය වර්ධනය, පුරෝකථනය කරන ලද මට්ටමට වඩා පහළ මට්ටමක පැවතුණද, මෙම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන්ට ප්‍රතිචාර දක්වමින් වෙළෙඳපොළ ණය පොලී අනුපාතික සැලකිය යුතු ලෙස පහළ ගියේය.


මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමට අනුව යමින්, දේශීය මුදල් වෙළෙඳපොළේ රුපියල් ද්‍රවශීලතාව සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගිය අතර, 2013 වසර මුළුල්ලේම ද්‍රවශීලතා අතිරික්තයක් පැවතුණි. වසර තුළ දී සාමාන්‍ය අතිරික්ත ද්‍රවශීලතාවය රුපියල් බිලියන 23 ක පමණ මට්ටමක පැවතුණි. බලපත්‍රලාභී බැංකු විසින් ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කිරීම හේතුවෙන් ඉහළ ගිය ප්‍රාග්ධන ලැබීම්, දේශීය සාංගමික ණය කිහිපයක් මත සිදුවූ විදේශ ආයෝජනයන් සහ කොටස් නිකුතුන් තුළින් ලැබුණු අරමුදල් මහ බැංකුව විසින් අවශෝෂණය කිරීම හේතුවෙන් දේශීය වෙළෙඳපොළ රුපියල් ද්‍රවශීලතාව ඉහළ ගියේය. 2013 ජූලි මාසයේ දී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීමත් සමඟ වෙළෙඳපොළට මුදාහරින ලද අතිරේක ද්‍රවශීලතාව

රුපියල් බිලියන 48 ක් පමණ විය. මහ බැංකුව විසින් එක්දින වෙන්දේසි හරහා අතිරික්ත ද්‍රවශීලතාව අඛණ්ඩව අවශෝෂණය කරන ලද අතර, වසරේ තුන්වන කාර්තුවේ සිට ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම සඳහා දිගුකාලීන පදනම මත කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි වැඩි වශයෙන් යොදාගන්නා ලදී. මෙම ක්‍රියාමාර්ගයන්ට අනුව ද්‍රවශීලතා අවශෝෂණය කිරීම සඳහා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ස්ථාවර පදනම මත විකිණීම අඛණ්ඩව යොදාගත් අතර, 2013 වසර අග භාගය වන විට මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය සම්පූර්ණයෙන්ම අවසන් විය. එමනිසා, විවට වෙළෙඳ කටයුතු හරහා අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම සඳහා මහ බැංකුව විසින් වෙනත් ආයතනවලින් ණයට ගත් සුරැකුම්පත් භාවිතා කරන ලදී.

**මෙහෙයුම් ඉලක්කය ලෙස සංචිත මුදල් ද, අතරමැදි ඉලක්කය ලෙස පුළුල් මුදල් ද යොදාගත් මුදල් සමස්ත ඉලක්ක කිරීමේ රාමුවක් මත පදනම්ව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වූ අතර, උද්ධමනය තනි අංකයක මට්ටමේ පවත්වා ගැනීම මුදල් ප්‍රතිපත්තියෙහි අරමුණ විය.** වසර ආරම්භයේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතයෙහි සියයට 7.5 ක අපේක්ෂිත වර්ධනයට සහ දළ දේශීය නිෂ්පාදිතයෙහි ගම්‍ය අවධමනකයෙහි සියයට 7.0 ක අපේක්ෂිත වර්ධනයට අනුකූලව මුදල් වැඩසටහන සකස් වූ අතර, 2013 වසරේ දී පුළුල් මුදල් සැපයුමෙහි අපේක්ෂිත වර්ධනය සියයට 15 ක් විය. 2012 වසරේ දී සංචිත මුදල් හි පැවති අඩු වර්ධන පදනමෙහි බලපෑම හේතුවෙන් සංචිත මුදල් හි සාමාන්‍ය වාර්ෂික වර්ධනය සියයට 16.5 ක් විය. කෙසේ වෙතත්, 2013 ජූලි මස 01 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩුකිරීම හා එහි ප්‍රතිඵලයක් ලෙස මුදල් ගුණකය ඉහළ යාම නිසා පුළුල් මුදල් ඉලක්කගත මට්ටමේ පවත්වාගෙනයාම සඳහා සංචිත මුදල් වර්ධනය සංශෝධනය කිරීම අවශ්‍ය විය. පළමු භාගය තුළදී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 10.7 ක් වූ සංචිත මුදල් හි සාමාන්‍ය වර්ධනය ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩුකිරීමත් සමග ඍණ අගයකට පත්වූ අතර එය වසර සඳහා සංශෝධනය කරන ලද පුරෝකථන සාමාන්‍යය වූ සියයට 5.5 ක මට්ටමේ පැවතුණි. පුළුල් මුදල් සැපයුම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2012 වසරේ පැවති සියයට 17.6 ට සාපේක්ෂව 2013 වසරේ අග භාගය වනවිට සියයට 16.7 ක් දක්වා අඩු වූ අතර වසර තුළ දී එහි සාමාන්‍යය සියයට 16.5 ක් විය.

**බැංකු අංශයෙහි වත්කම් සලකා බැලීමේ දී, පුළුල් මුදල් සැපයුමෙහි ප්‍රසාරණය සඳහා රජය විසින් ලබාගත් ණය ප්‍රමාණය ඉහළ යාම හේතු වූ අතර, පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය ප්‍රමාණය අඩු විය.** ප්‍රධාන වශයෙන් බැංකු අංශයෙහි රජයේ සුරැකුම්පත් තොගය ඉහළ යාම හේතුකොටගෙන 2013 වසරේදී රජය වෙත ලබාදුන් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් බිලියන 256 කින් ඉහළ ගිය අතර, රජය වෙත ලබාදුන් ණය සහ අත්තිකාරම්ද ඉහළ ගියේය. කෙසේ වෙතත්, මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය රුපියල් බිලියන 163 කින් පමණ අඩුවීම නිසා වාණිජ බැංකු විසින් රජය වෙත ලබාදුන් ණය ප්‍රමාණයෙහි ඉහළ ප්‍රසාරණාත්මක බලපෑම යම්තාක් දුරකට සමනය විය. ප්‍රධාන රාජ්‍ය සංස්ථා දෙකෙහි අභ්‍යන්තර පියවීම් හේතුකොට ගෙන රාජ්‍ය සංස්ථා වෙත ලබාදුන් ණයවල ඉහළ යාම 2012 වසරේ පැවති රුපියල් බිලියන 94 ට සාපේක්ෂව 2013 වසරේ දී රුපියල් බිලියන 72.6 ක් විය. වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය ප්‍රමාණයෙහි වර්ධනය අඩුවීම මෙම වසර තුළ දී සැලකිය යුතු කරුණක් විය. වෙළෙඳපොළ පොලී අනුපාතික පහත දැමීමේ මන්දගාමී ස්වරූපය සහ නිරපේක්ෂ අගය අනුව රන් උකස් අත්තිකාරම් සීඝ්‍රයෙන් පහළ යාම හේතුකොට ගෙන පෞද්ගලික අංශයට ලබාදුන් ණය ප්‍රමාණයෙහි වර්ධනය අඩු විය. දේශීය සහ විදේශීය ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමේ හැකියාව ඉහළයාම හේතුකොට ගෙන ද පෞද්ගලික අංශය විසින් බැංකු ණය සඳහා කරන ලද ඉල්ලුම අඩු විය. පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2012 වසර අවසානයේදී දක්නට ලැබුණු සියයට 17.6 ක වර්ධනයට සාපේක්ෂව 2013 වසරේ අග භාගයේ දී සියයට 7.5 ක් විය. වාණිජ බැංකුවල විදේශීය වත්කම් අඩුවීම හේතුකොට ගෙන 2013 වසරේ දී බැංකු පද්ධතියෙහි ශුද්ධ විදේශීය වත්කම් අඩු වූ අතර, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් වැඩි විය. දේශීය වත්කම්වලින් ආයෝජනය කළ විදේශයන්ගෙන් රැස්කරගත් අරමුදල් හේතුකොට ගෙන වාණිජ බැංකුවල


**1.10 රූප සටහන — මුදල් සහ ණය වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය)**



ශුද්ධ විදේශීය වත්කම් අඩු විය. වසරේ පළමු මාස හත තුළ දී පහළ ගිය මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඉන්පසුව වැඩි වූ අතර, එය 2013 වසරේ අග වන විට රුපියල් බිලියන 132.7 කින් ඉහළ යාමක් වාර්තා කළේය. දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළෙන් විදේශ විනිමය ශුද්ධ පදනම මත අවශෝෂණයකර ගැනීම මෙන්ම බැංකු සමඟ විදේශ විනිමය හුවමාරු ගිවිසුම්වලට එළඹීම වසරේ අග භාගය වන විට මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් වැඩිවීමට දායක විය.

**ප්‍රතිපත්ති පොලී අනුපාතික පහත දැමීම සහ මුදල් වෙළෙඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතාව හේතුකොටගෙන වසර තුළ දී වෙළෙඳපොළ පොලී අනුපාතික පහළ ගියේය.** දිගුකාලීන පොලී අනුපාතික පහළ යාමේ යම් මන්දගාමී ස්වරූපයක් පැවතුන ද, කෙටිකාලීන වෙළෙඳපොළ පොලී අනුපාතික සීඝ්‍රයෙන් පහළ ගියේය. 2013 ජූනි අවසානය වන තෙක් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව සමීපයේ විචලනය වූ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ඉන්පසුව ක්‍රමිකව ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ මධ්‍යය දෙසට විතැන් වූ අතර, වසර තුළ දී එය පදනම් අංක 217 කින් පහළ ගියේය. සතිපතා ගණනය කරනු ලබන බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය, 2013 වසරේදී පදනම් අංක 427 කින් පහළ ගියේය. මේ අතර, ප්‍රාථමික වෙළෙඳපොළෙහි සියලුම පරිණත කාලයන්ට අදාළ භාණ්ඩාගාර බිල්පත්හි ඵලදා අනුපාතික පහළ ගිය අතර ද්විතීයික වෙළෙඳපොළෙහි රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික වක්‍රයෙහි පහතට විතැන්වීම මඟින් පිළිබිඹු වන ආකාරයට ද්විතීයික වෙළෙඳපොළෙහි ද ප්‍රාථමික වෙළෙඳපොළට සමාන හැසිරීමක් පෙන්නුම්

**1.11 රූප සටහන** **ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව සහ තෝරාගත් වෙළෙඳපොළ පොලී අනුපාතික**




කළේය. 2013 වසරේ දී වාණිජ බැංකු තම තැන්පතු සහ ණය පොලී අනුපාතික ක්‍රමයෙන් පහළ දැමීය. ඒ අනුව, 2013 වසරේ දී බරිත සාමාන්‍ය ණය අනුපාතිකය පදනම් අංක 80 කින් අඩු වූ අතර, බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය වසර තුළ දී, පිළිවෙළින්, පදනම් අංක 73 කින් සහ පදනම් අංක 143 කින් අඩු විය. ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩවම ක්‍රියාත්මක වන බැවින් 2014 වසරේදී ද පොලී අනුපාතික අඛණ්ඩවම අඩුවීමේ ප්‍රවණතාවක් පවතින අතර, 2014 ජනවාරි මාසයේ දී නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝව සංකෝචනය කරමින් නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 50 කින් අඩු කළේය.

### මූල්‍ය අංශයේ වර්ධනයන්

**ආර්ථිකයේ සිදුවන වර්ධන ගම්‍යතාවට අනුබල සැපයීම සඳහා අවශ්‍ය ආයෝජන හා මූල්‍ය අවශ්‍යතාවලට පහසුකම් සලසමින්, මූල්‍ය අංශය ශක්තිමත්ව පැවතුණි.** මහ බැංකුව සිය නියාමන හා සුපරීක්ෂණ ප්‍රතිපත්ති සම්පාදනය තුළින් මූල්‍ය අංශයේ ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරන ලදී. ඒ අනුව, ආර්ථිකයේ නැගීඑන අවශ්‍යතාවන්ට සරිලන පරිදි මූල්‍ය ක්‍රමයේ කටයුතු හැඩගැස්වීම සඳහා බලපත්‍රලාභී බැංකු මෙන්ම බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සහ විශේෂිත කල්බදු සමාගම්වලින් සමන්විත බැංකු නොවන මූල්‍ය ආයතන අංශවල අවදානම් පාදක කරගත් සුපරීක්ෂණය සහ ව්‍යාපාරික කටයුතු හා ක්‍රියාවලීන් මනාව සිදු කිරීම සඳහා නියාමනය හා සුපරීක්ෂණය සිදුකරන ලදී. 2013 වසරේ දී මූල්‍ය වෙළෙඳපොළ බොහෝදුරට ද්‍රවශීලව පැවතුණු අතර, වෙළෙඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් පහළ යන ස්වභාවයක් පෙන්නුම් කළේය. මූල්‍ය ආයතනවල ණය කළඹ විවිධාංගීකරණය කිරීම, ප්‍රාග්ධනය ශක්තිමත්ව පැවතීම සහ ද්‍රවශීලතාව ඉහළ මට්ටමක පැවැතීම හේතුවෙන් එම ආයතන අඛණ්ඩවම ශක්තිමත්ව පැවතුණි. ගෝලීය වෙළෙඳපොළෙහි විචලතාවන් මධ්‍යයේ වුවද, අඛණ්ඩව ආයෝජක විශ්වාසය පිළිබිඹු කරමින්, කොළඹ කොටස් වෙළෙඳපොළ වෙතවූ ශුද්ධ ආයෝජන ගලාඒම් නොකඩවා සිදු වූ අතර, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ වෙතද සැලකිය යුතු ප්‍රාග්ධන ගලාඒම් පෙන්නුම් කරනු ලැබීය. දේශීය සාංගමික ණය වෙළෙඳපොළ තුළ දිගුකාලීන බැඳුම්කර රාශියක් නිකුත් කරනු ලැබීමත් සමඟ එම වෙළෙඳපොළෙහි කාර්යසාධනය ඉහළ නැගුණි. ගෙවීම් පද්ධතියේ යටිතල පහසුකම්වල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව විසින්ද ක්‍රියාමාර්ග ගනු ලැබීය. ජාත්‍යන්තර මූල්‍ය සම්බන්ධතා සහ සැලකිය

යුතු ජාත්‍යන්තර නියෝජනයක් හරහා ශක්තිමත්, ක්‍රියාශීලී සහ ජාත්‍යන්තර වශයෙන් තරඟකාරී මූල්‍ය පද්ධතියක් ගොඩනැගීමේ අපේක්ෂාවෙන් යුතුව වසර තුළදී මූල්‍ය අංශයෙහි මූල්‍ය ආයතන ඒකාබද්ධකරණය සඳහා වන ප්‍රධාන සැලැස්මක් මහ බැංකුව විසින් ඉදිරිපත් කරන ලදී.

**ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් පෙන්නුම් කරන පරිදි, මූල්‍ය අංශය ප්‍රසාරණය වූ අතර, මූල්‍ය ආයතනවල ශක්තිමත් බව වැඩි දියුණු විය.** 2013 වසර තුළ දී බැංකු අංශයේ ව්‍යාපාරික පරිමාව සහ ආවරණය යන ද්විත්වයම වර්ධනය විය. මූල්‍ය සේවාවන් සඳහා ඇති ඉඩප්‍රස්ථා පුළුල් කරමින් සහ ආර්ථිකයේ සියලුම අංශවල සහභාගිත්වයෙන් යුතු වර්ධනයක් ළඟ කර ගැනීමට සහය වෙමින් 2013 වසරේදී බැංකු අංශයේ ශාඛා ජාලය ව්‍යාප්ත වූ අතර, එම ශාඛා බස්නාහිර පළාතෙන් පිටත ප්‍රදේශවල ස්ථාපිත කරනු ලැබීය. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය අඛණ්ඩව පැවතීම, රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ උකස් ණය අත්තිකාරම් සඳහා වූ නිරාවරණය අඩුවීම හමුවේ බැංකු අංශයෙහි ණය වර්ධනය වසර තුළ දී මන්දගාමී විය. හිතකර ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටම්, වැඩිදියුණු වූ කළමනාකරණ කාර්යක්ෂමතාව සහ මනා යහපාලන පරිචයන් මඟින් බැංකු අංශයෙහි ශක්තිමත් බව තවදුරටත් තහවුරු කරන ලදී. වසර තුළ දී අක්‍රීය ණය ප්‍රමාණය ඉහළ ගිය ද, ප්‍රාග්ධනය ලෙස පැවති ප්‍රමාණවත් සම්පත් ප්‍රමාණය හේතුවෙන් බැංකු අංශයෙහි ණය අවදානම කළමනාකරණය කළ හැකි මට්ටමේ පැවතුණි. බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ වත්කම් ඉහළ ගිය අතර, ඒවායේ ශාඛා ජාලයේ ව්‍යාප්තිය පුළුල් විය. 2013 වසරේ දී, ප්‍රාථමික අලෙවිකරුවන්ගේ වත්කම්වල වර්ධනය, ප්‍රාග්ධනය සහ ලාභදායීත්වය තුළින් පිළිබිඹු කරන පරිදි එම අංශයේ කාර්යසාධනය ඉහළ ගියේය. ඵලදා වක්‍රය ක්‍රමිකව පහළට විතැන්වීම හේතුකොටගෙන ප්‍රාථමික අලෙවිකරුවන්ට ඒවායේ වෙළෙඳ කළඹවල් මත ප්‍රාග්ධන ලාභ උපයා ගැනීමට හැකි වූ අතර, එමඟින් එම අංශයේ ලාභදායීත්වය ඉහළ නැගුණි. මෙම අංශයේ තරගකාරීත්වය ඉහළ නැංවීමේ අරමුණින්, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා අදාළ වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවට යටත් නොවී රජයේ සුරැකුම්පත්හි ප්‍රාථමික අලෙවිකරුවන් ලෙස කටයුතු කිරීමට මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට අවසර ලබාදෙන ලදී. නව සමාගම් 16 ක් 2013 වසර තුළ දී ස්ථාපිත කිරීමත් සමඟ ඒකක භාර අංශය පුළුල් වූ අතර, මෙම අංශය සඳහා දෙනු ලැබූ බදු සහන නිසා එහි ලාභදායීත්වය ද ඉහළ නැගුණි. වසර තුළදී සමස්ත වත්කම්, වාරික ආදායම, ආයෝජන ආදායම සහ ලාභදායීත්වය යන ප්‍රධාන දර්ශකවලින් පිළිබිඹු කරන ලද වර්ධන ප්‍රවණතාව හේතුකොටගෙන රක්ෂණ සමාගම්, ඒවායේ ශක්තිමත් බව පවත්වාගෙන යනු ලැබීය. 2013 වසර තුළදී විශ්‍රාම අරමුදල් අංශයේ කළමනාකාරීත්වය යටතේ පවත්නා වත්කම්වල සහ සාමාජිකත්වයේ මනා කාර්යසාධනයක් පෙන්නුම් කරනු ලැබීය. පෞද්ගලික අංශය සඳහා ප්‍රධාන වශයෙන් විශ්‍රාම ප්‍රතිලාභ සලසන සේවක අර්ථසාධක අරමුදල, එහි ඵලදායී හා විචක්ෂණශීලී කළමනාකාරීත්වය තුළින් ජනනය කරනු ලැබූ ආදායම ඉහළ යාමත් සමඟ ප්‍රසාරණය වූ අතර, 2013 වසර අවසානයට එම අරමුදලේ සමස්ත වටිනාකම රුපියල් බිලියන 1,300 ක් දක්වා සියයට 13.6 කින් ඉහළ ගියේය.

**2013 වසරේ දී දේශීය මූල්‍ය වෙළෙඳපොළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් සහිතව ස්ථායීව පැවතුණි.** 2013 වසරේ දී දේශීය මුදල් වෙළෙඳපොළෙහි රුපියල් ද්‍රවශීලතාව බොහෝදුරට අතිරික්ත මට්ටමක පැවතුණි. දේශීය මුදල් වෙළෙඳපොළෙහි අතිරික්ත ද්‍රවශීලතාවට ප්‍රතිචාර දක්වමින්, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය වසර තුළ දී පහළ ගිය අතර, මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ ක්‍රියාවලියේ ඵලදායීතාව තහවුරු කරමින්, 2013 වසරේ අවසාන කාර්තුව තුළ දී බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍යය දෙසට ක්‍රමයෙන් විතැන් විය. පසුගිය වසර හා සැසඳීමේ දී 2013 වසරේ දී වාණිජ පත්‍ර වෙළෙඳපොළ මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරනු ලැබීය. 2013 වසරේ දී සාංගමික ණය වෙළෙඳපොළෙහි, ණයකර නිකුතුන්වල වටිනාකම සහ ණයකර නිකුතුන් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස ඉහළ යාමත් සමඟ ණයකර සඳහා වන වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වය සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2013 වසර සඳහා වූ රාජ්‍ය අයවැයෙන් ණයකර නිකුත් කිරීම සඳහා ලබාදුන් බදු නිදහස් කිරීම් හේතුවෙන් වසර තුළ දී ණයකර සැපයීමේ ඉහළ වර්ධනයක් දක්නට ලැබුණි. අනුගාමී වසර දෙකක් තුළ මන්දගාමී ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ කොළඹ කොටස් වෙළෙඳපොලෙහි සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) සහ එස්.ඇන්ඩ්.පී.එස්.එල්.20 දර්ශකය 2013 වසරේ ඉහළ යාමක් පෙන්නුම් කරනු ලැබීය. වසර තුළදී පොලී අනුපාතිකවල සැලකිය යුතු පහළ යාම, විනිමය අනුපාතික ස්ථායීව පැවතීම සහ ගෝලීය ආර්ථිකය ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීම දේශීය සාර්ව ආර්ථික කාර්යසාධනය මත හිතකර ලෙස බලපෑම කොටස් වෙළෙඳපොළෙහි මෙම ක්‍රියාකාරිත්වයට දායක වූ සාධක අතර වේ. දියුණු ආර්ථිකයන් හි මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ඉදිරි දැක්ම අනුව, කලාපීය වෙළෙඳපොළවල ශුද්ධ විදේශ විනිමය ගලායාම් වාර්තා කරන තත්ත්වයක් යටතේ, ආයතනික ආයෝජකයින්ද ඇතුළුව විදේශීය ආයෝජකයින්ගේ සහභාගිත්වය වැඩිවීම විශේෂයෙන් සැලකිය යුතු වේ.

2013 වසරේ දී මූල්‍ය අංශයට අදාළ නියාමන රාමුව, **අධීක්ෂණ සහ නීති බලාත්මක කිරීම යනාදිය තවදුරටත් ශක්තිමත් කරන ලදී.** බාසල් II ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවලට අනුගත වෙමින් බැංකු සඳහා අධීක්ෂණ විමසුම් ක්‍රියාවලීන් ක්‍රියාවට නැංවීම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් අනුව යමින් විනිවිදභාවය සහ සන්සන්දනාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් නිරාවරණ අවශ්‍යතාවන් වැඩිදියුණු කිරීම ඇතුළත් නියාමනයන් බැංකු අංශයෙහි ඇති විය හැකි අවදානම් හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වාදෙන ලදී. එම නියාමනයන් අතර බැංකු නොවන මූල්‍ය අංශයේ සම්බන්ධිත පාර්ශ්වයනට ලබාදෙන ණය පහසුකම් ලියා හැරීම සඳහා පූර්ව අනුමැතිය ලබාගැනීමට අදාළ විධිවිධාන නිකුත් කිරීම විශේෂයෙන්ම, ද්‍රවශීලතාව සහ පොලී අනුපාත වැනි ක්ෂේත්‍ර වලට අදාළව ක්‍රියාත්මක වන මුදල් සමාගම් විසින් නිකුත් කරන ලද ණය උපකරණවලට අදාළ වන නියාමන රාමුවක් ද හඳුන්වා දෙන ලදී. ආර්ථික කටයුතුවල ප්‍රසාරණයට සහයවීමට සහ අවදානම් කළමනාකරණය කර ගැනීම සහ අවදානම් දරාගැනීමේ හැකියාව ශක්තිමත් කිරීමට මහ බැංකුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්හි ධාරිතාව ගොඩනැංවීම සඳහා පියවර කිහිපයක් ගන්නා ලදී. මහ බැංකුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ඒකාබද්ධකරණ ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමට පියවර ගැනීම මේ අතර ප්‍රධාන වේ. මෙම ක්‍රියාමාර්ග මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කරමින් ආර්ථික කටයුතු තවදුරටත් පුළුල් කර ගැනීම සඳහා උපකාරී වනු ඇත.

**ජාතික ගෙවීම් පද්ධතියෙහි කාර්යක්ෂමතාව සුරක්ෂිතබව සහ ශක්තිමත්බව වර්ධනය කරගනිමින් 2013 වසරේදී රටේ ගෙවීම් යටිතල පහසුකම් පද්ධතිය තවදුරටත් වැඩිදියුණු විය.** ජාතික ගෙවීම් පද්ධතියේ අවදානම් කළඹ වෙනස් කිරීම සහ ගෙවීම් සහ පියවීම් පද්ධතිය වැඩිදියුණු කිරීමට මාර්ගෝපදේශනය ලබාදීමට මහ බැංකුව විසින් වසර තුළ දී රටේ ගෙවීම් සහ පියවීම් පද්ධතියට අදාළ වන නියාමන රාමුව සංශෝධනය කරන ලදී. මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ලංකාසෙට්ල් පද්ධතියට පවතින පද්ධති නීති, අන්තර්ජාතික සම්මතයන් සහ මනා පරිචයන්ට අනුව යාවත්කාලීන කරන ලදී. ජාතික ගෙවීම් පද්ධතියේ නියාමකයා ලෙස තම කාර්යභාරය ඉටු කරමින්, මහ බැංකුව විසින් ගෙවීම් සහ පියවීම් පද්ධතියේ ස්ථායීතාව, සුරක්ෂිතතාව සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම උදෙසා නියාමන රාමුව තවදුරටත් වැඩිදියුණු කිරීම පිළිබඳ අවධානය යොමු කරන ලදී. ගෙවීම් කාඩ්පත් සහ ජංගම ගෙවීම් පද්ධති පිළිබඳ නව නියාමන රාමුවක් හඳුන්වා දෙන ලදී. වසර තුළ දී ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් ලෙස ආයතන තුනකට බලපත්‍ර ලබා දෙන ලද අතර, ජංගම දුරකථන ජාල ක්‍රියාකරුවකුහට ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධතියක ක්‍රියාකරුවකු ලෙස කටයුතු කිරීමට බලපත්‍රයක් ලබා දෙන ලදී.

## 1.3 ගෝලීය ආර්ථික පරිසරය සහ ඉදිරි දැක්ම

වසරේ අගභාගය වනවිට ආර්ථික කටයුතු **ඉහළ යාමේ පැහැදිලි සලකුණු දක්නට ලැබුණ ද, 2013 වසරේ දී ගෝලීය ආර්ථිකය අඩු වේගයකින් වර්ධනය විය.** විශේෂයෙන්ම වසරේ දෙවන භාගයේ දී දියුණු ආර්ථිකයන්හි ආර්ථික කටයුතු ශක්තිමත්ව වර්ධනය වූ අතර, ඒ සඳහා දේශීය ඉල්ලුම පුළුල් වීම,

**1.4 සංඛ්‍යා සටහන** — **ගෝලීය ආර්ථික ප්‍රවණතා සහ ඉදිරි දැක්ම (අ)**

| ශීර්ෂය | 2011 | 2012 | 2013 ඇස්තමේන්තු | 2014 පුරෝකථන |
|---|---|---|---|---|
| **ලෝක නිෂ්පාදිතය** | **3.9** | **3.1** | **3.0** | **3.7** |
| සංවර්ධිත ආර්ථිකයන් | 1.7 | 1.4 | 1.3 | 2.2 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 1.8 | 2.8 | 1.9 | 2.8 |
| යුරෝ කලාපය | 1.5 | -0.7 | -0.4 | 1.0 |
| එක්සත් රාජධානිය | 1.1 | 0.3 | 1.7 | 2.4 |
| ජපානය | -0.6 | 1.4 | 1.7 | 1.7 |
| සංවර්ධනය වෙමින් පවතින රටවල් | 6.2 | 4.9 | 4.7 | 5.1 |
| සංවර්ධනය වන ආසියාව | 7.8 | 6.4 | 6.5 | 6.7 |
| චීනය | 9.3 | 7.7 | 7.7 | 7.5 |
| ඉන්දියාව | 6.3 | 3.2 | 4.4 | 5.4 |
| **ලෝක වෙළෙඳ පරිමාව (භාණ්ඩ හා සේවා)** | **6.1** | **2.7** | **2.7** | **4.5** |
| ආනයන | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 4.7 | 1.0 | 1.4 | 3.4 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 8.8 | 5.7 | 5.3 | 5.9 |
| අපනයන | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 5.7 | 2.0 | 2.7 | 4.7 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 6.8 | 4.2 | 3.5 | 5.8 |
| **මිල හැසිරීම** | | | | |
| පාරිභෝගික මිල | | | | |
| සංවර්ධිත ආර්ථිකයන් | 2.7 | 2.0 | 1.4 | 1.7 |
| සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් | 7.1 | 6.0 | 6.1 | 5.6 |
| වෙළෙඳ ද්‍රව්‍ය මිල (එ.ජ.ඩොලර්) | | | | |
| ඉන්ධන | 31.6 | 1.0 | -0.9 | -0.3 |
| ඉන්ධන නොවන | 17.9 | -10.0 | -1.5 | -6.1 |
| **එ.ජ.ඩොලර් තැන්පතු මත සය මාසික ලන්ඩන් අන්තර් බැංකු අර්පණ පොලී අනුපාතිකය (සියයට)** | **0.5** | **0.7** | **0.4** | **0.4** |

(අ) වෙනත් සඳහනක් නොමැති විට වාර්ෂික ප්‍රතිශත වෙනස

මූලය: World Economic Outlook, ජා.මු.අ. (2014 ජනවාරි සහ 2013 ඔක්තෝබර්)

මූල්‍ය වෙළෙඳපොළ තත්ත්වයන් යහපත් වීම සහ පාරිභෝගික සහ ව්‍යාපාරික විශ්වාසය ක්‍රමිකව වර්ධනය වීම දායක විය. මේ අතර, සමහර නැගීඑන වෙළෙඳපොළ ආර්ථිකයන්හි අපනයන සඳහා ඉහළ වර්ධන අපේක්ෂාවක් පැවතිය ද, අපේක්ෂිත මට්ටමට වඩා දේශීය ඉල්ලුම අඩුවීම හේතුවෙන් අඩු වර්ධනයක් දක්නට ලැබුණි. විශේෂයෙන්ම නැගීඑන ආර්ථිකයන්හි දේශීය ඉල්ලුම වඩාත් සීමා කරන දැඩි මූල්‍ය තත්ත්වයන් පැවැති අතර, දියුණු ආර්ථිකයන්හි සාම්ප්‍රදායික නොවන මුදල් ප්‍රතිපත්තීන් ඉවත් කිරීම හමුවේ ඇති වූ වෙළෙඳපොළ පීඩනය හේතුවෙන් ආයෝජනයට ඇති නැඹුරුව අඩු විය. රැකියා අවස්ථා උත්පාදනය, යටිතල පහසුකම් සංවර්ධනය සහ ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදනයන් කරා විවිධාංගීකරණය කිරීම යනාදී අභියෝග රැසක් හමුවේ වුව ද සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් විසින් තවදුරටත් ධනාත්මක වර්ධන වේගයක් පවත්වාගෙන යන ලදී.

**වර්ධන ප්‍රවණතාව සඳහා අවශ්‍ය සාධක ශක්තිමත්ව පැවති බව පෙනී ගියද, ගෝලීය වර්ධනය 2012 වසරේ පැවති සියයට 3.1 ට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 3 ක් දක්වා සුළු වශයෙන් පහත වැටෙනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.** දියුණු ආර්ථිකයන් හි වර්ධනය 2012 වසරේ පැවති සියයට 1.4 ට සාපේක්ෂව 2013 වසරේ දී සුළු වශයෙන් පහත වැටී සියයට 1.3 ක් වශයෙන් වාර්තා විය. පරිභෝජනය, ආයෝජනය සහ තොග සමුච්චිතවල ඉහළ දායකත්වය හේතුවෙන් එක්සත් ජනපදය 2012 වසරේ පැවති සියයට 2.8 ට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 1.9 කින් වර්ධනය විය. මේ අතර, දිගු කාලයක් මුළුල්ලේ පැවැති ආර්ථික අවපාතය අවසන් කරමින් යූරෝ කලාපයේ ආර්ථික කටයුතු 2012 වූ සියයට 0.7 ක අඩුවීමට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 0.4 දක්වා අඩු විය. ප්‍රධාන වශයෙන් ජර්මනියේ අපනයන වර්ධනය වීම සහ දේශීය ඉල්ලුම වර්ධනය වීම යූරෝ කලාපය යථා තත්ත්වයට පත්වීමට හේතු විය. පහසු ණය කොන්දේසි සහ ආයෝජක විශ්වාසය වැඩිවීම හේතුවෙන් එක්සත් රාජධානියේ ආර්ථික වර්ධනය 2012 වසරේ පැවති සියයට 0.3 ට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 1.7 ක් විය. ජපානය තුළ 2012 වසර අග භාගයේ සිට ආර්ථික කටයුතු උත්තේජනය කිරීම සඳහා ක්‍රියාත්මක වූ දැඩි ප්‍රතිපත්ති හේතුවෙන් 2012 වසරේ පැවති සියයට 1.4 සිට 2013 වසරේ දී සියයට 1.7 දක්වා ඉහළ ආර්ථික වර්ධනයක් ලබා ගැනීමට හැකි විය. කෙසේ නමුත්, 2014 අප්‍රේල් මස සිට ආරම්භ වී ඉදිරි අවුරුදු දෙක තුළ ක්‍රියාත්මක වීමට නියමිත පාරිභෝගික බදු අනුපාත වැඩි කිරීමේ සැලසුම ඇතුළු ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හේතුවෙන් ජපානය තුළ දේශීය ඉල්ලුම අඩුවිය හැක. මේ අතර, නැගීඑන වෙළෙඳපොළ ආර්ථිකයන් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල වර්ධනය 2012 වසරේ පැවති සියයට 4.9 සිට 2013 වසරේ දී සියයට 4.7 ක් දක්වා අඩු විය. විශේෂයෙන්ම වසරේ දෙවන භාගයේ පැවති ස්ථායී දේශීය ඉල්ලුමත් සමඟ චීනයේ ආර්ථික වර්ධනය පෙර වසරේදී මෙන්ම සියයට 7.7 ක මට්ටමේ පැවතුණි. හිතකර මෝසම් කාලගුණික තත්ත්වය සහ ඉහළ අපනයන වර්ධනය හේතුවෙන් ඉන්දියාවේ ආර්ථික වර්ධනය 2012 වසරේ පැවති සියයට 3.2 සිට 2013 වසරේදී සියයට 4.4 ක් දක්වා වර්ධනය විය. කෙසේ නමුත්, අනෙකුත් ප්‍රධාන නැගීඑන ආර්ථිකයන් අතර රුසියාව, දකුණු අප්‍රිකාව සහ මෙක්සිකෝව වැනි රටවල ආර්ථික කටයුතු 2013 වසරේ දී සැලකියයුතු ලෙස දුර්වල විය. ලතින් ඇමරිකානු සහ කැරිබියන් කලාපවල මෙන්ම මැදපෙරදිග සහ උතුරු අප්‍රිකානු කලාපවල ආර්ථික වර්ධන වේගයන් පිළිවෙලින් 2012 වසරේ දී පැවති සියයට 3.0 සහ සියයට 4.1 ට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 2.6 සහ සියයට 2.4 දක්වා අඩු විය.

**2013 වසරේ දී ප්‍රධාන මහ බැංකුවල ප්‍රතිපත්තින්හි ප්‍රධාන ලක්ෂණයක් වූයේ දිගුකාලීන කල්පිරීමක් සහිත වත්කම් විශාල වශයෙන් මිලදී ගැනීම සහ ප්‍රතිපත්ති උපකරණයක් ලෙස ඉදිරිගාමී ප්‍රතිපත්ති යොදා ගැනීමයි.** ආර්ථිකය උත්තේජනය කිරීම සඳහා ගන්නා ලද ප්‍රයත්නයන් ක්‍රමයෙන් ඉවත් කරගැනීමේ අරමුණින් එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව විසින් මාසිකව සිදු කරනු ලබන එ.ජ.ඩොලර් බිලියන 85 ක් වූ බැඳුම්කර මිලදී ගැනීම් 2014 ජනවාරි මස සිට එ.ජ.ඩොලර් බිලියන 10 කින් අඩු කිරීම පිළිබඳව 2013 දෙසැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලදී. තවදුරටත් එය 2014 පෙබරවාරි මාසයේ සිට බලපැවැත්වෙන පරිදි එ.ජ.ඩොලර් බිලියන 10 කින් අඩු කිරීමටත් අනතුරුව එවැනිම අඩු කිරීමක් 2014 අප්‍රේල් මාසයේ දී ප්‍රකාශයට පත් කිරීමටත් නියමිතය. මේ අතර, එංගලන්ත මහ බැංකුව විසින් ප්‍රමාණාත්මක ලිහිල්කරණ ක්‍රියා පිළිවෙත තවදුරටත් ඉදිරියට ගෙන ගිය අතර, 2014 ජනවාරි මාසය වනවිට දී අත්කරගත් ඉතිරි වත්කම් ප්‍රමාණයෙහි වටිනාකම බ්‍රිතාන්‍ය පවුම් බිලියන 375 ක් විය. මේ අතර, යුරෝපීය මහ බැංකුව ප්‍රධාන ප්‍රතිමූල්‍යකරණ මෙහෙයුම් සඳහා වන පොලී අනුපාතිකය 2013 නොවැම්බර් මස පැවැති සියයට 0.5 සිට සියයට 0.25 දක්වා අඩු කරමින් අපේක්ෂිත මට්ටමට වඩා අඩු මට්ටමක පවතින ආර්ථික කටයුතු දිරිමත් කිරීම සඳහා ලිහිල් මුදල් ප්‍රතිපත්තිය අඛණ්ඩවම ක්‍රියාත්මක කරන ලදී. එසේම, ජපාන මහ බැංකුව විසින් වාර්ෂිකව ජපාන යෙන් ට්‍රිලියන 60-70 ත් අතර වටිනාකමකින් යුතු තම වත්කම් මිලදී ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. රැකියා නියුක්තිය උපරිම කිරීම සහ මිල ගණන් ස්ථාවරව

පවත්වාගැනීමේ මූලික අරමුණ ඇතිව ප්‍රතිපත්ති අනුපාතික අවම මට්ටමක තබා ගැනීම සඳහා වන කැපවීම ඉදිරිගාමී දැක්මක් සහිතව එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් නැවත වරක් ප්‍රකාශයට පත් කරන ලදී. ෆෙඩරල් සංචිත බැංකුවේ ප්‍රතිපත්ති අනුපාතික තීරණය කිරීම සඳහා යොදාගත් නිර්ණායක වූයේ දිගුකාලීනව උද්ධමනය සියයට 2 ක සහ සේවා වියුක්ති අනුපාතය සියයට 6.5 ක මට්ටමකද පවත්වා ගැනීමයි. කෙසේ වෙතත්, සේවා වියුක්ති අනුපාතය අපේක්ෂිත මට්ටමට ළඟාවීමත් සමඟම, ෆෙඩරල් සංචිත බැංකුව, පොලී අනුපාතික අඛණ්ඩව අඩු මට්ටමක පැවතීම සඳහා ඉදිරිගාමී ප්‍රතිපත්ති, පොළී අනුපාතික තීරණය කිරීමේ නිර්ණායකයක් ලෙස යොදාගන්නා ලදී. ශ්‍රම වෙළෙඳපොළ තත්වයන්, උද්ධමන පීඩන හා ඉදිරි අපේක්ෂාවන් පිළිබඳ දර්ශක සහ මූල්‍ය වෙළෙඳපොළ වර්ධනයන් වැනි ආර්ථිකය පිළිබඳ තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි පුළුල් පරාසයක් සහිත දර්ශක ඇතුළත් කරමින් ඉදිරිගාමී ප්‍රතිපත්ති සංශෝධනය කරන ලදී. අපේක්ෂිත මට්ටමට වඩා වැඩි වේගයකින් සේවා වියුක්ති අනුපාතය පහළ යමින් පවතින වාතාවරණයක් තුළ සේවා වියුක්ති අනුපාතය සියයට 7 ක් දක්වා පහළ බසින තෙක් සියයට 0.5 ක් ව පැවති බැංකු අනුපාතය ඉහළ නොදමන බවට එංගලන්ත මහ බැංකුව කරන ලද ප්‍රකාශය වෙනසකට ලක් කරමින් සේවා වියුක්ති අනුපාතයට අමතරව අනෙකුත් පුළුල් පරාසයක වූ ක්‍රියාකාරකම් පිළිබඳව අධීක්ෂණය කර ඉදිරිගාමී ප්‍රතිපත්ති සකස් කිරීමට තීරණය කර ඇත. මේ අතර, යුරෝපා මහ බැංකුව විසින්, පවත්නා ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සඳහා සංඛ්‍යානමය ඉලක්කයන් නියම වශයෙන් සඳහන් නොකර, පවත්නා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගය වන අඩු පොලී අනුපාතික ක්‍රමය තවදුරටත් ඉදිරි කාලපරිච්ඡේදය සඳහා පවතින බව ප්‍රකාශ කර ඇත. ජපාන මහ බැංකුව විසින් ජපානයෙහි පාරිභෝගික මිල දර්ශකය මඟින් මනිනු ලබන උද්ධමනය අපේක්ෂිත පරිදි සියයට 2 ක් වනතුරු තම මුදල් ලිහිල්කරණ ප්‍රතිපත්තිය ස්ථාවරව තවදුරටත් පවත්වා ගන්නා ලදී. මීට වෙනස්ව, ප්‍රධාන මහ බැංකු විසින් සිදු කළ ප්‍රමාණාත්මක ලිහිල් කිරීම් හි ඇති කරන ලද වෙනස්වීම්වල බලපෑම, විනිමය අනුපාත උච්ඡාවචනයන්, ප්‍රාග්ධන ප්‍රවාහයන්හි වෙනස්වීම්, උද්ධමන වෙනස්වීම්, රැකියා වියුක්තිය හා ආර්ථික වර්ධනය වැනි අභියෝගවලට මුහුණදීමේ හැකියාව අනුව නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි මහ බැංකු කිහිපයක් විසින් මුදල් ප්‍රතිපත්තිය දැඩි කරන ලද අතර, ඇතැම් මහ බැංකු සිය මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කළ බැවින් නැගීඑන සහ දියුණු වෙමින් පවතින ආර්ථිකයන්හි මහ බැංකු විසින් අනුගමනය කරන ලද මුදල් ප්‍රතිපත්තීන්හි පොදු දිශාවක් හඳුනාගත නොහැක.

**දියුණු ආර්ථිකයන් වඩාත් සුරක්ෂිත මූල්‍ය අංශයක් කරා යාමට ප්‍රයත්නයක් දැරීම සහ නැගීඑන ආර්ථිකයන් අධික විචලතාවයෙන් යුත් විදේශීය අංශයන්ට සහ අධික අවදානම් වාරිකයන්ට මුහුණ දෙමින් සිටින බැවින් ගෝලීය මූල්‍ය පද්ධතිය පරිවර්තන ගණනාවකට ලක් වෙමින් පවතී.** ප්‍රධාන පෙළේ මහ බැංකු දිගුකාලීන වත්කම් මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රමිකව අඩු කරනු ඇතැයි වූ අපේක්ෂාව නැගීඑන ආර්ථිකයන්හි මිල මට්ටම කෙරේ බලපෑම් ඇති කළ අතර එය ආයෝජන කළඹ ප්‍රතිව්‍යුහගත කිරීමටත්, නැගීඑන ආර්ථිකයන්හි ප්‍රාග්ධනය ගලායාම් සිදු කිරීමටත් පාදක විය. නැගීඑන ආර්ථිකයන් විසින් නිකුත් කරන ලද ස්වෛරීත්ව බැඳුම්කරවල ඵලදායීතාවය සහ ප්‍රධාන සංවර්ධිත රටවල රජයේ බැඳුම්කරවල ඵලදායීතාවය අතර පරතරය, 2013 වසරේ මැයි මස ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව බැඳුම්කර මිලදී ගැනීම් අඩු කිරීමට ඇති හැකියාව පිළිබඳව ප්‍රකාශයට පත් කිරීමෙන් සති 2 කට පසුව පදනම් අංක 100 කින් ඉහළ ගියේය. නැගී එන ආර්ථිකයන් වෙත වූ ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් 2013 වසරේ දී සියයට 13 කින් පහළ යමින් 2012 වසරේදී පැවති එ.ජ.ඩොලර් ට්‍රිලියන 1.3 ට සාපේක්ෂව 2013 වසරේ දී එ.ජ.ඩොලර් ට්‍රිලියන 1.1 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. බැඳුම්කර මිලදී ගැනීමේ වැඩසටහන ක්‍රමානුකූලව අඩුකිරීමට ඇති හැකියාව පිළිබඳව ෆෙඩරල් සංචිත බැංකුව විසින් ප්‍රකාශ කිරීම, ප්‍රාග්ධන ගලාඒම්වලට තරමක් දුරට අහිතකර ලෙස බලපෑවද නැගීඑන ආර්ථිකයන්හි ඉදිරි ආර්ථික ප්‍රවණතා දුර්වල වීම ද ප්‍රාග්ධන ලැබීම් අඩුවීමට හේතු විය. මේ අතර නැගීඑන ආර්ථිකයන්හි ශුද්ධ ප්‍රාග්ධන ගලායාම් සියයට 1.3 කින් පමණ ඉහළ යමින් 2013 වසරේ දී එ.ජ.ඩොලර් ට්‍රිලියන 1.3 ක් වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. මේ සඳහා, හිතකර රාජ්‍ය ප්‍රතිපත්ති හේතුවෙන් චීනය බාහිර සෘජු ආයෝජන ඉහළ දැමීමත්, බ්‍රසීලය, චිලී රාජ්‍යය, කොලොම්බියාව, මෙක්සිකෝව සහ පේරු වැනි ලතින් ඇමෙරිකානු රටවල් ජාත්‍යන්තරව වත්කම්, විශේෂයෙන්ම ආයෝජන කළඹේ වූ වත්කම්, විවිධාංගීකරණය කිරීමේ අවශ්‍යතාව පිළිබිඹු කරමින් බාහිර ප්‍රාග්ධන ප්‍රවාහ ඉහළ නැංවීමත් හේතු විය.

**2013 වසරේ දී විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඇතැම් මුදල් වර්ග විශාල වෙනස්වීම්වලට භාජනය වූ අතර ලොවපුරා මුදල් ප්‍රතිපත්ති වෙනස් කරනු ඇතැයි පැවති අපේක්ෂාවන් මේ සඳහා හේතු විය.** විශේෂයෙන්ම වසරේ මුල් භාගයේ දී ජපාන යෙන් අගය විශාල ලෙස අඩු වී 2013 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 18.1 කින් අවප්‍රමාණය විය. අඛණ්ඩව පැවති අවධමන පීඩන තත්ත්වයන්ට පිළියමක් ලෙස ජපාන

රජය විශාල ලෙස මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම සහ දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රසාරණය නිසා 2013 වසරේ දී ජපාන යෙන්වල ක්‍රියාකාරිත්වය දුර්වල විය. මේ අතර, ප්‍රධාන මුදල් වර්ග අතරින් යූරෝ, එ.ජ. ඩොලරයට සාපේක්ෂව ඉහළ ප්‍රතිලාභ අත්කර ගනිමින් සියයට 4.4 කින් අධිප්‍රමාණය විය. එසේම, ආර්ථිකය කැපී පෙනෙන ලෙස යථා තත්ත්වයට පත්වීමත් සමඟ බ්‍රිතාන්‍ය පවුම එ.ජ. ඩොලරයට සාපේක්ෂව 2013 වසරේ දී සියයට 2.0 කින් අධිප්‍රමාණය විය. කෙසේ වෙතත්, වසර තුළ දී ඕස්ට්‍රේලියානු ඩොලරයේ වටිනාකම එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 14.2 කින් අඩු විය. ෆෙඩරල් සංචිත බැංකුව 2013 මැයි මාසයේ දී, බැඳුම්කර මිලදී ගැනීමේ වැඩසටහන සැලසුම් කළ කාලයට පෙරාතුව ක්‍රමයෙන් අඩු කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශයට පත්කිරීමත් සමඟ නැගීඑන සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් බොහොමයක මුදල් වර්ග විශේෂයෙන් 2013 මැයි මාසයේ අග සිට ජූනි මාසය දක්වා අවප්‍රමාණය විය. නැගීඑන ආර්ථිකයන් සම්බන්ධයෙන් ගත්කල, බ්‍රසීලය (සියයට 13), ඉන්දියාව (සියයට 11.7), ඉන්දුනීසියාව (සියයට 20.9), දකුණු අප්‍රිකාව (සියයට 19), සහ තුර්කිය (සියයට 16.4) වැනි රටවල ව්‍යවහාර මුදල් සැලකියු යුතු ලෙස අවප්‍රමාණය විය. මීට වෙනස්ව විශාල විදේශ සංචිත පැවතීම, දේශීය ඉතිරිකිරීම් ඉහළ මට්ටමක පැවතීම සහ ප්‍රාග්ධන ලැබීම් ඉහළ යාම ඇතුළු සාධක ගණනාවක් හේතුවෙන් එ.ජ. ඩොලරයට සහ අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට එරෙහිව චීනයේ ව්‍යවහාර මුදල් වන රෙමින්බි 2013 වසරේදී අඛණ්ඩව අධිප්‍රමාණය විය. මේ අතර, දකුණු ආසියාවේ අනෙකුත් ප්‍රධාන රටවල ව්‍යවහාර මුදල්වල මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබුණි. මීට අමතරව, 2013 වසරේ දී, ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රමාණාත්මක ලිහිල් කිරීම් අඩු කිරීම සඳහා වූ ප්‍රවණතාව සහ වර්තන ගිණුමේ හිඟය ප්‍රසාරණය වීම හේතුවෙන් ඉන්දියානු රුපියල අවප්‍රමාණය විය. බංගලාදේශයේ සිදු වූ කාර්මික අනතුරු කිහිපයක් නිසා සේවක අතියිවාසිකම් ජාත්‍යන්තර වශයෙන් දැඩි අවධානයට ලක් වුවද, 2013 වසරේ දෙවැනි සහ තෙවැනි කාර්තුවල රෙදිපිළි අපනයනයේ සිදු වූ සීඝ්‍ර වර්ධනයන් හේතුවෙන් 2013 වසරේදී දේශීය ව්‍යවහාර මුදල (ටකා) එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 3.1 කින් අධිප්‍රමාණය විය. 2013 වසරේ දී පකිස්තානු රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 7.9 කින් අවප්‍රමාණය විය.

**දියුණු ආර්ථිකයන්හි විශේෂයෙන්ම යුරෝ කලාපයේ අවධමන පීඩනයන් පිළිබඳව පැවති අපේක්ෂාවන් මෙන්ම ඉන්දියාව සහ බ්‍රසීලය වැනි රටවල් හැර අනෙකුත් නැගීඑන වෙළෙඳපොළ ආර්ථිකයන් සහ දියුණු වෙමින් පවතින ආර්ථිකයන්හි උද්ධමනය පාලනය කිරීම සම්බන්ධයෙන් දැඩි අභියෝග නොපැවතීම හේතුවෙන් 2013 වසරේ සමස්තයක් ලෙස ලොව පුරා උද්ධමනය අඩු මට්ටමක පැවතුණි.** දියුණු ආර්ථිකයන්හි පාරිභෝගික මිල උද්ධමනය 2012 වසරේ දී පැවති සියයට 2.0 සිට 2013 වසරේ දී සියයට 1.4 ක් වූ අතර නැගීඑන ආර්ථිකයන්හි සහ දියුණු වෙමින් පවතින ආර්ථිකයන්හි පාරිභෝගික මිල උද්ධමනය පසුගිය වසරට සාපේක්ෂව සියයට 6 ක මට්ටමේ නොවෙනස්ව පැවතුණි. අපේක්ෂිත මට්ටමට වඩා අඩු උද්ධමනය තුළින් අතිරික්ත ධාරිතාවක්, ඉහළ සේවා වියුක්තියක්, රාජ්‍ය මූල්‍ය සංකෝචනයක් සහ ප්‍රධාන සංවර්ධිත ආර්ථිකයන්හි සිදු වූ අඛණ්ඩ මූල්‍ය සකසුරුවම් බව පිළිබිඹු විය. මේ අතර, 2012 වසරේ දෙසැම්බර් මාසයේ සිට ජපාන අගමැති Shinzo Abe විසින් හඳුන්වා දෙන ලද Abenomics ලෙස බහුලව හඳුන්වනු ලබන විශාල වශයෙන් සිදු වූ මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමේ සහ ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ ව්‍යුහාත්මක වෙනස්කම් දශකයක් පුරා ජපානයේ පැවති අවධමනකාරී තත්ත්වය පාලනය කිරීමට උපකාරී විය. මැදපෙරදිග කලාපයේ ඛනිජතෙල් නිපදවන රටවල පැවති භූ-දේශපාලනික අවිනිශ්චිතතාවයන් හේතුවෙන් ඛනිජ තෙල් මිල ගණන් වරින්වර උච්ඡාවචනයන්ට ලක් වුවද සමස්තයක් ලෙස අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්වීය. විශේෂයෙන්ම ඉරානයේ පැවති භූ-දේශපාලනික ගැටළු හේතුවෙන් 2013 ජනවාරි සහ පෙබරවාරි මාසවල දී ඛනිජ තෙල් මිල ඉහළ යාමක් දක්නට ලැබුණු අතර, ජූලි සහ අගෝස්තු මාසවල සිරියානු අරාබි සමූහාණ්ඩුව තුළ පැවති භූදේශපාලනික අවිනිශ්චිතතාවයන් හේතුවෙන් නැවත වරක් ඛනිජතෙල් මිල ඉහළ යාමක් දන්නට ලැබුණි. UK Brent, Dubai Fatch, West Texas Intemediate (WTI) වැනි ඛනිජ තෙල්වල සාමාන්‍ය මිල 2012 වසරේදී පැවති බැරලයක මිල එ.ජ.ඩොලර් 105.01 ට සාපේක්ෂව 2013 වසරේදී බැරලයක මිල එ.ජ.ඩොලර් 104.11 ක් ලෙස වාර්තා විය. මන්දගාමී ගෝලීය වර්ධනය මෙන්ම ෂෙල් ගෑස් වැනි විකල්ප බලශක්ති භාවිතය වැඩිවීම හේතුවෙන් සමස්තයක් ලෙස ඛනිජ තෙල් සඳහා අඩු ඉල්ලුමක් පැවති අතර එය ඛනිජ තෙල් මිල මත පැවති පීඩනය අවම වීමට හේතු විය. එසේම, ඛනිජ වර්ග, ලෝපස් සහ ලෝහ මෙන්ම ආහාර සහ කෘෂිකාර්මික භාණ්ඩවල මිල ගණන් ද 2013 වසරේ දී පහළ ගියේය.

**2013 වසරේ දෙවන භාගයේ සිට ගෝලීය ආර්ථික වාතාවරණය වැඩිදියුණුවීමක් පැහැදිලිවම දැකිය හැකි විය.** නිවාස මිල යථා තත්ත්වයට පත්වීම සහ කොටස් මිලෙහි වැඩිවීම මෙන්ම සේවා නියුක්තිය ඉහළ යාම නිසා වැය කළ හැකි ආදායම ඉහළ යාම සංවර්ධිත ආර්ථිකයන්හි පෞද්ගලික පරිභෝජනය ක්‍රමිකව වැඩිවීමට හේතු විය. තවද, දිගුකාලීන වත්කම්

මිලදී ගැනීමේ වැඩසටහන් කිහිපයක් නවතා දැමීම හමුවේ වුව ද, ප්‍රධාන මහ බැංකු විසින් සිය ප්‍රතිපත්ති පොලී අනුපාතික දීර්ඝ කාලයක් පුරා අඩු මට්ටමක පවත්වා ගැනීමට කැප වී ක්‍රියා කිරීම ආයෝජක විශ්වාසය ශක්තිමත් වීමට හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. දියුණු රටවල ආර්ථික තත්ත්වයන් ඉහළ යාම හමුවේ, විශේෂයෙන්ම අපනයන ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් නැගීඑන වෙළෙඳපොළ ආර්ථිකයන් 2014 හා 2015 වසරවල දී තවදුරටත් සුළු වර්ධනයක් අත්කර ගනු ඇතැයි පුරෝකථනය කර ඇත. ස්ථාවර ශ්‍රම වෙළෙඳපොළ තත්ත්වයන්, අඩු උද්ධමනය, ප්‍රමාණවත් ලිහිල් මුදල් ප්‍රතිපත්ති සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සංකෝචනය අඩුවීම හේතුවෙන් නැගෙනහිර ආසියානු ආර්ථිකයන් බොහොමයක පෞද්ගලික පරිභෝජනය සහ ආයෝජන ශක්තිමත් ලෙස ප්‍රසාරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, ඉදිරි වසරවල දී දියුණු ආර්ථිකයන් හි ආර්ථික වර්ධනයේ ද කිසියම් වේගවත්භාවයක් ඇති වනු ඇති අතර, ඉහළ සේවා වියුක්තිය, යටිතල පහසුකම්වල හිඟය, ඉහළ එකතු කළ වටිනාකම් සහිත කටයුතු කරා ආර්ථික කටයුතු විවිධාංගීකරණය කිරීම අඩු මට්ටමක පැවතීම සහ ගෝලීය කම්පන හේතුවෙන් ඇතිවිය හැකි බලපෑම් විශේෂයෙන්ම, විදේශ ජංගම ගිණුමේ විශාල හිඟයක් පවතින ආර්ථිකයන් වෙත ප්‍රාග්ධන ගලායාම කළමනාකරණය කිරීම වැනි අභියෝග ජයගැනීම සඳහා ද පියවර ගත යුතුව ඇත.

**ගෝලීය ආර්ථික වාතාවරණය වැඩිදියුණුවීම හමුවේ, ගෝලීය ආර්ථික වර්ධනය 2013 වසරේ පැවති සියයට 3 ට සාපේක්ෂව 2014 වසරේදී සියයට 3.7 ක් දක්වා ද, 2015 වසරේ දී එය සියයට 3.9 ක් දක්වා ද ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත.** ඇමෙරිකා එක්සත් ජනපදයේ ආර්ථික වර්ධනය 2014 වසරේ දී සියයට 2.8 දක්වා ද, 2015 වසරේදී සියයට 3.0 ක් දක්වා ද ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, මුදල් ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යන දෙඅංශයෙන්ම ආර්ථික වර්ධනයට බලපෑම් ඇතිවීමේ අවධානමක් පවතී. මුදල් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් බලන කල, දිගුකාලීන වත්කම් මිලදී ගැනීම් දීර්ඝ කාලයක් පුරා අඛණ්ඩව පවත්වාගෙන යාම හේතුවෙන් වත්කම් බුබුළු ඇතිවිය හැකි අතර, එම කටයුතු කලින්ම නවතා දැමීම මූල්‍ය වෙළෙඳපොළ අස්ථාවරතා ඇතිවීමට හේතුවිය හැක. එසේම, උපරිම ණය සීමා සහ අයවැය ගැටලු පිළිබඳ දේශපාලන බෙදීම් පැවතුණහොත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ආශ්‍රිත අවදානම් තත්ත්වයන් තවදුරටත් උග්‍ර වීමේ හැකියාවක් පවතී. මේ අතර, යුරෝ කලාපයෙහි දිගු කාලයක් පුරා පැවති ආර්ථික අවපාතය අවසන් වීමත් සමඟ, සමස්තයක් ලෙස කලාපයෙහි ආර්ථිකය 2014 වසරේ දී සියයට 1.0 කින් සහ 2015 වසරේ දී සියයට 1.4 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ වුව ද, අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය සංකෝචනය හා බැංකු පද්ධතියේ පැවති ව්‍යාකූල ස්වභාවය හේතුවෙන් ආර්ථික වර්ධනය පහළ යාමට තිබෙන අවදානම් තවදුරටත් පවතී. 2012 වසර අවසානයේ සිට ක්‍රියාත්මක කරන ලද දැඩි ප්‍රතිපත්ති හේතුවෙන් ජපානයෙහි ආර්ථික වර්ධනය ඉහළ ගිය ද, ක්‍රියාත්මක කිරීමට නියමිත පරිභෝජන බදු අනුපාත ඉහළ දැමීම ද ඇතුළත් ව්‍යුහාත්මක වෙනස්කම්, ආර්ථික ප්‍රසාරණය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි අතර, ඒ හේතුවෙන් ආර්ථික වර්ධනය 2014 වසරේ දී සියයට 1.7 ක් සහ 2015 වසරේ දී සියයට 1.0 ක් දක්වා මන්දගාමී වනු ඇත. මේ අතර, ඉහළ යන පාරිභෝගික ඉල්ලුම හා අපනයන ස්ථිර ලෙස යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් නැගීඑන වෙළෙඳපොළවල් හා දියුණු වෙමින් පවතින ආර්ථිකයන් 2014 වසරේ දී සියයට 5.1 කින් සහ 2015 වසරේ දී සියයට 5.4 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායීතාව වෙත තිබෙන අවදානම් තත්ත්වයන් ඵලදායී ලෙස අඩු කිරීම සඳහා දේශීය ඉල්ලුම ආයෝජනවල සිට පරිභෝජනය වෙත නැවත සංතුලනය කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු කරමින් චීනයේ ආර්ථික වර්ධනය 2014 වසරේ දී අපේක්ෂිත සියයට 7.5 ක සිට 2015 වසරේ දී සියයට 7.3 ක් ලෙස මන්දගාමී වනු ඇතැයි පුරෝකතනය කර ඇත. ආයෝජන යථා තත්ත්වයට පත්වීම සහ ගෝලීය තත්ත්වයන් වැඩිදියුණු වීම හා දේශීය මුදල අවප්‍රමාණය වීම නිසා අපනයනවල සිදු වූ සීඝ්‍ර වර්ධනය හේතුවෙන් ඉන්දීය ආර්ථිකය 2014 වසරේදී සහ 2015 වසරේදී පිළිවෙලින් සියයට 5.4 කින් සහ සියයට 6.4 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. සමස්තයක් ලෙස ගෝලීය ආර්ථික වර්ධන අපේක්ෂා වැඩිදියුණු වන අතරම උද්ධමනය පහළ අගයක් ගැනීම හා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයක් අඛණ්ඩව පවතින නමුත් අතිරේක ධාරිතාවය තවදුරටත් ඉහළ මට්ටමක පවතින බැවින්, දියුණු ආර්ථිකයන්හි මුදල් ප්‍රතිපත්ති ලිහිල්කිරීම් නියමිත කාලයට පෙර ඉවත් කර ගැනීමෙන් වැලකී සිටීම ඉතා වැදගත් වනු ඇත. තවද, ආයෝජක විශ්වාසය ආරක්ෂා කළ හැකි සහ කෙටිකාලීන හා මැදිකාලීන ණය සඳහා වන ඉල්ලුම යථා තත්වයට පත් කළ හැකි ලෙස බැංකු ශේෂපත්‍ර ප්‍රකෘතිමත් කිරීම හා දුර්වල බැංකු වෙත ප්‍රාග්ධනය සැපයීම හරහා ආයෝජන ඉහළ දැමීම කෙරෙහි යොමු වූ ගෝලීය මූල්‍ය පද්ධතියෙහි ව්‍යුහාත්මක වෙනස්කම් රැසක් සිදු කිරීම මත ඉදිරි ආර්ථික වර්ධන අපේක්ෂාවන් බොහෝදුරට රැඳී පවතිනු ඇත.

## 1.4 මධ්‍යකාලීන සාර්ව ආර්ථික දැක්ම

**දේශීය ආර්ථික කටයුතු හිතකර වීමේ සහ ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ප්‍රතිලාභ ලබා ගනිමින්, ශ්‍රී ලංකා ආර්ථිකය මැදිකාලීනව තවදුරටත් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරේ.** 2013 වසරේ සියයට 7.3 ක වර්ධනයක් සහිතව ස්ථාවර වූ ආර්ථිකය, 2014 වසරේ දී සියයට 7.8 කින් ද මැදිකාලීනව සියයට 8 කට වඩා වැඩි වේගයකින් ද වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෘෂිකාර්මික, කාර්මික සහ සේවා යන සියලු ප්‍රධාන අංශයන්හි ධනාත්මක දායකත්වයත් සමඟ ඉදිරි වසරවල දී මෙම වර්ධනය, වඩාත් පුළුල් පදනමකින් සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම, කෘෂිකාර්මික හා කාර්මික අංශවල යටිතල පහසුකම් පුළුල් වීම සහ දියුණු තාක්ෂණය භාවිතා කිරීම මඟින් එම අංශවල ධාරිතාවය සහ ඵලදායීතාව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම සංචාරක, ප්‍රවාහන, සන්නිවේදන, වරාය සහ මූල්‍ය සේවා වැනි සේවා වෙළඳාම්හි වර්ධනය, අපේක්ෂිත වර්ධන ගම්‍යතාවයට අවශ්‍ය දායකත්වය සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආර්ථිකය ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීම හමුවේ ශ්‍රී ලංකාවේ විදේශීය ඉල්ලුම යහපත් මට්ටමකින් පවත්වා ගැනීමට හේතුවනු ඇති අතර එමඟින් මැදිකාලීනව ඉහළ වර්ධන වේගය තිරසාරව පවත්වා ගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉහළ වර්ධන වේගයක් පවත්වා ගැනීම සඳහා ආයෝජන මට්ටම, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 30 කට වඩා ඉහළ මට්ටමක පවත්වාගැනීම අත්‍යවශ්‍ය වේ. ආර්ථිකයේ ධාරිතා මට්ටම ඉහළ යාම සහ අඩු උද්ධමනයක් පවත්වා ගැනීම අරමුණු කරගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග, වඩා ඵලදායී ආයෝජන දිරිමත් කිරීමට හේතුවන අතර, එමඟින් මැදිකාලීනව ද.දේ.නි. අවධමනකය සියයට 5 කට පමණ අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථිකයේ හිතකර වර්ධනය සමඟ 2015 වසර වනවිට ඒක පුද්ගල ආදායම එ.ජ.ඩොලර් 4,000 සීමාව ඉක්මවා යනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එමඟින් ආර්ථිකයේ සියලුම අංශයන්හි වර්ධනය දිරිමත් කරමින් මැදි ආදායම් උගුලෙන් මිදීම සඳහා තවදුරටත් දූරදර්ශී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාව ඉස්මතු වේ.

**ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ ඉදිරි දැක්ම මැදිකාලීනව තවදුරටත් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2013 වසරේ දෙවන භාගයේ දී නැවත ශක්තිමත් ලෙස වර්ධනය වූ වෙළෙඳ භාණ්ඩ අපනයනය, විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වෙළෙඳ හවුල්කරුවන් වන ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝ කලාපීය ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වනු ඇතැයි වන අපේක්ෂාවන් සමඟ ඉදිරි වසර කිහිපය තුළ දී ද ඉහළ වර්ධනයක් පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, ''නිදහස් වරායයන්'' ඇති කිරීම, ''බන්ධිත කලාප'' ඇති කිරීම සහ අපනයන කර්මාන්තවලට බදු සහන සැලසීම වැනි ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් මැදිකාලීනව අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, අපේක්ෂිත වර්ධන වේගය පවත්වා ගෙනයාම සඳහා අවශ්‍ය වන ආයෝජන භාණ්ඩ ආනයන වැඩිවීම මූලිකව හේතුකොටගෙන ආනයන ද මධ්‍යස්ථව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, අපනයන ආදායමේ අපේක්ෂිත ඉහළ වර්ධනය හේතුවෙන් මැදිකාලීනව වෙළෙඳ ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පහළ යනු ඇත. මේ අතර, පසුගිය වසරවල දී මෙන්ම සංචාරක, වරාය හා ගුවන් තොටුපොළ ආශ්‍රිත සේවා වෙළෙඳාම් සහ තොරතුරු තාක්ෂණ සේවා ඉපැයුම් ඉහළ යාම සමඟ සේවා වෙළෙඳාමේ හිතකර කාර්යසාධනයක් තවදුරටත් පවත්වා ගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, දේශීය ශ්‍රම වෙළෙඳපොළෙහි තත්ත්වයන් වර්ධනය වීමත් සමඟ සංක්‍රමණය වන ශ්‍රමිකයන්ගෙන් සමහරක් මෙරට රැඳෙනු ඇතැයි යන අපේක්ෂාව හේතුවෙන් පසුගිය වසර කිහිපයේ දී අඛණ්ඩව වර්ධනය වූ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මධ්‍යකාලීනව සාපේක්ෂව අඩු වර්ධන වේගයකින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**යටිතල පහසුකම් සහ ව්‍යාපාර කිරීමේ පහසුව වැඩිදියුණු වීම සමඟ විනිමය පාලන රෙගුලාසි තවදුරටත් ලිහිල් කිරීම තුළින් මැදිකාලීනව ආයෝජන දිරිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ව්‍යාපාර සඳහා හිතකර පරිසරය පැවතීම සහ ප්‍රධාන ආර්ථික අංශ වෙත උපායමාර්ගික ආයෝජනයන් ආකර්ෂණය කරගැනීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් ගනු ලැබූ මූලික ක්‍රියාමාර්ග හේතුවෙන් මැදිකාලීනව, කොටස් සහ ණය සුරැකුම්පත් වෙත වූ ආයෝජන සහ විදේශීය සෘජු ආයෝජන ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, පුළුල් වෙමින් පවතින ව්‍යාපාරික කටයුතු සඳහා උපකාරී වීමට බැංකු සහ පෞද්ගලික අංශය ජාත්‍යන්තර වෙළෙඳපොළෙන් වැඩි ප්‍රාග්ධනයක් රැස් කිරීමට අපේක්ෂා කෙරේ. රජයට ලැබෙන දිගුකාලීන විදේශ ණය මැදිකාලීනව විදේශීය ප්‍රාග්ධනය රැස් කිරීමේ ප්‍රධාන ප්‍රභවය වනු ඇත. විදේශීය අංශයේ මෙම වර්ධනයන් ගෙවුම් තුලනයෙහි සැලකිය යුතු අතිරික්තයක් ලබා දෙමින්, රටෙහි විදේශීය සංචිත සතුටුදායක මට්ටමකට වර්ධනය කරනු ඇති අතර, එමඟින් දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළෙහි ස්ථායිතාව පවත්වා ගැනීමට සහ බාහිර කම්පනයන්ට මුහුණ දීමට රටට පවතින හැකියාව වැඩිදියුණු කිරීමට උපකාරී වේ.

**1.5 සංඛ්‍යා සටහන**

**මැදිකාලීන සාර්ව ආර්ථික රාමුව (අ)**

| දර්ශකය | ඒකකය | 2012 (ආ) | 2013 (ඇ) | පුරෝකථන | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 | 2015 | 2016 | 2017 |
| **මූර්ත අංශය** | | | | | | | |
| වෙළෙඳපොළ මිල අනුව ද.දේ.නි. | රුපියල් බිලියන | 7,579 | 8,674 | 9,911 | 11,314 | 12,860 | 14,637 |
| මූර්ත ද.දේ.නි. වර්ධනය | සියයට | 6.3 | 7.3 | 7.8 | 8.2 | 8.3 | 8.4 |
| ද.දේ.නි. අවධමනකය | සියයට | 8.9 | 6.7 | 6.0 | 5.5 | 5.0 | 5.0 |
| ඒක පුද්ගල ද.දේ.නි | එ.ජ.ඩොලර් | 2,922 | 3,280 | 3,718 | 4,243 | 4,825 | 5,485 |
| මුළු ආයෝජන | ද.දේ.නි.යේ % වශයෙන් | 30.6 | 29.6 | 31.0 | 32.0 | 33.1 | 34.0 |
| දේශීය ඉතිරි කිරීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 16.9 | 20.0 | 22.6 | 25.9 | 28.9 | 31.2 |
| ජාතික ඉතිරි කිරීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 24.0 | 25.7 | 28.4 | 31.1 | 33.2 | 34.2 |
| **විදේශීය අංශය** | එ.ජ.ඩොලර් මිලියන | | | | | | |
| වෙළෙඳ පරතරය | එ.ජ.ඩොලර් මිලියන | -9,417 | -7,609 | -8,364 | -7,959 | -7,326 | -6,501 |
| අපනයන | එ.ජ.ඩොලර් මිලියන | 9,774 | 10,394 | 11,854 | 13,671 | 15,915 | 18,521 |
| ආනයන | එ.ජ.ඩොලර් මිලියන | 19,190 | 18,003 | 20,218 | 21,630 | 23,242 | 25,023 |
| සේවා (ශුද්ධ) | එ.ජ.ඩොලර් මිලියන | 1,262 | 1,180 | 1,907 | 2,564 | 3,006 | 3,249 |
| භාණ්ඩ සහ සේවා අපනයන | එ.ජ.ඩොලර් මිලියන | 13,574 | 15,079 | 17,694 | 21,191 | 25,149 | 28,901 |
| භාණ්ඩ සහ සේවා අපනයන | ද.දේ.නි.යේ % වශයෙන් | 22.9 | 22.4 | 23.0 | 23.9 | 24.7 | 24.7 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | එ.ජ.ඩොලර් මිලියන | 5,985 | 6,407 | 6,999 | 7,632 | 8,287 | 8,825 |
| ජංගම ගිණුමේ ශේෂය | එ.ජ.ඩොලර් මිලියන | -3,982 | -2,607 | -1,949 | -831 | 101 | 268 |
| ජංගම ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -6.7 | -3.9 | -2.5 | -0.9 | 0.1 | 0.2 |
| සමස්ත ශේෂය | එ.ජ.ඩොලර් මිලියන | 151 | 985 | 1,510 | 2,185 | 2,967 | 3,606 |
| විදේශීය නිල සංචිත | එ.ජ.ඩොලර් මිලියන | 7,106 | 7,495 | 8,251 | 9,883 | 12,349 | 15,693 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | | | | |
| සමස්ත ආදායම් සහ ප්‍රදාන | ද.දේ.නි.යේ % වශයෙන් | 14.1 | 13.3 | 14.8 | 15.5 | 16.6 | 16.8 |
| සමස්ත ආදයම් | ද.දේ.නි.යේ % වශයෙන් | 13.9 | 13.1 | 14.5 | 15.3 | 16.5 | 16.6 |
| ප්‍රදාන | ද.දේ.නි.යේ % වශයෙන් | 0.2 | 0.2 | 0.3 | 0.2 | 0.2 | 0.2 |
| වියදම හා ශුද්ධ ණයදීම් | ද.දේ.නි.යේ % වශයෙන් | 20.5 | 19.2 | 20.0 | 19.9 | 20.4 | 20.6 |
| වර්තන ගිණුමේ ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -1.0 | -0.8 | 1.1 | 1.6 | 2.3 | 2.3 |
| සමස්ත අයවැය ශේෂය | ද.දේ.නි.යේ % වශයෙන් | -6.5 | -5.9 | -5.2 | -4.4 | -3.8 | -3.8 |
| දේශීය මූල්‍යනය | ද.දේ.නි.යේ % වශයෙන් | 2.7 | 4.5 | 2.3 | 2.2 | 2.2 | 2.3 |
| රජයේ ණය | ද.දේ.නි.යේ % වශයෙන් | 79.2 | 78.3 | 74.3 | 70.6 | 65.0 | 62.0 |
| **මූල්‍ය අංශය (ඈ)** | | | | | | | |
| සංචිත මුදල් වර්ධනය | සියයට | 10.2 | 0.9 | 14.0 | 14.0 | 14.0 | 14.0 |
| පුළුල් මුදල් වර්ධනය ($M_{2b}$) | සියයට | 17.6 | 16.7 | 14.0 | 14.0 | 14.0 | 14.0 |
| රාජ්‍ය අංශයට ශුද්ධ ණය දීම්වල වෙනස | රුපියල් බිලියන | 211.6 | 256.1 | 100.0 | 50.0 | 50.0 | 50.0 |
| පෞද්ගලික අංශයට ණය දීම්වල වෙනස | රුපියල් බිලියන | 352.6 | 175.9 | 355.0 | 433.0 | 498.0 | 573.0 |
| පෞද්ගලික අංශයට ණය දීම්වල වර්ධනය | සියයට | 17.6 | 7.5 | 14.0 | 15.0 | 15.0 | 15.0 |

(අ) 2014 මාර්තු මැදවන විට පැවති තොරතුරු මත පදනම් වී ඇත.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික
(ඈ) වසර අවසානයේ ලක්ෂ්‍යමය වර්ධනය

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

**මුදල් ප්‍රතිපත්තිය විචක්ෂණශීලීව මෙහෙයවීම තුළින් සහ සැපයුම් අංශයේ ඵලදායීතාව ඉහළ නැංවීමේ ක්‍රියාමාර්ගවල උපකාරයෙන් මහ බැංකුව මැදි කාලීනව උද්ධමනය මැදි තනි අංකයක පවත්වා ගැනීමට අපේක්ෂා කරයි.** වසර 5 කට වඩා වැඩි කාලසීමාවක් පුරා මතුපිට උද්ධමනය සහ මූලික උද්ධමනය තනි අංකයක පවත්වා ගැනීම, උද්ධමන අපේක්ෂාවන් මනාව පාලනය කරලීමට හේතු වූ අතර, එමගින් මැදිකාලීනව වෙළෙඳපොළ පොලී අනුපාතික පහළ සහ ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට ඉඩ සැලසෙනු ඇත. මීට අමතරව, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය පවත්වාගෙන යාම සඳහා වන රජයේ ප්‍රයත්නය තවදුරටත් ශක්තිමත් කිරීම සහ රාජ්‍ය සංස්ථාවන්හි මිල ගණන්, පිරිවැය පිළිබිඹු කෙරෙන අයුරින් සංශෝධනය කිරීම තුළින් බැංකු අංශයේ අමතර සම්පත් පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා ඵලදායී ලෙස මුදා හැරීමට හැකිවනු ඇත. මේ අතර, බැංකු අංශය වෙත වූ විදේශ ණය සහ කොටස් ප්‍රාග්ධන ලැබීම් ඉහළ යාම තුළින්, සංවර්ධන ක්‍රියාවලීන්

සඳහා දේශීය බැංකු අංශයෙන් වූ ණය සැපයුම වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**රාජ්‍ය මූල්‍ය පිළිබඳ සලකා බැලීමේ දී සංවර්ධන අරමුණු සඳහා පුළුල් පදනමකින් යුතුව දායක වීමට අයවැය හිඟය සහ රාජ්‍ය ණය හිතකර මට්ටමක් දක්වා තවදුරටත් අඩු කිරීම සඳහා මැදිකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව සකස් කර ඇත.** වර්තමාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය තුළින් මැදිකාලීනව ආදායම් වැඩිකර ගැනීමත්, පුනරාවර්තන වියදම්වල වර්ධනය පාලනය කිරීමත්, ඉහළ වර්ධන වේගයට උපකාරී වන මට්ටමක රාජ්‍ය ආයෝජන පවත්වා ගැනීමත් අපේක්ෂා කෙරේ. ඒ අනුව, වඩා සරල වූ සහ පුළුල් වූ බදු පදනමක් පැවතීම, බදු අනුකූලතාව ඉහළ යාම සහ බදු පරිපාලනයේ කාර්යක්ෂමතාව ඉහළ යාම තුළින් අපේක්ෂිත ආදායම් රැස්කිරීම ඉහළ යාම මගින් මැදිකාලීනව රාජ්‍ය ආදායම ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 15 සහ සියයට 16 අතර මට්ටමකට ළඟාවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, පුනරාවර්තන වියදම් මනාව පාලනය කිරීම සඳහා වූ අඛණ්ඩ ප්‍රයත්න සමඟ අපේක්ෂිත අඩු පොලී අනුපාතික වාතාවරණය මැදිකාලීනව පුනරාවර්තන වියදම් වැඩිවීම පාලනය කිරීමට උපකාරීවනු ඇත. ඒ අනුව, 2014 වසරේ ජංගම ගිණුමේ අපේක්ෂිත අතිරික්තය මැදිකාලීනව තවදුරටත් ශක්තිමත්වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා රජයේ අරමුදල්වලින් වැඩි ප්‍රමාණයක් වෙන් කිරීමට හැකි වනු ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, රාජ්‍ය ආයෝජන මැදිකාලීනව ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 6 කට වඩා වැඩි මට්ටමක පවත්වා ගැනීමට සහ රටේ සමස්ත ආයෝජන මට්ටම අපේක්ෂිත වර්ධනය දක්වා ගෙන ඒමට හැකිවනු ඇත. මෙම වර්ධනයන් සමග මැදිකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව තුළින් අපේක්ෂිත අයවැය හිඟය අඩුවීමේ මාවතට සමගාමීව 2016 වසර වනවිට අයවැය හිඟය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 4 කට වඩා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. අයවැය මූල්‍යනය කිරීමේ අවශ්‍යතාව පහළ යාම හේතුවෙන් රජය බැංකු ණය මත රඳා පැවැත්ම අඩු කෙරෙන අතර, එමඟින් පෞද්ගලික ආයෝජන සඳහා වැඩි ඉඩප්‍රස්ථාවක් ලැබෙනු ඇත. එමෙන්ම, උද්ධමනය මත ඉල්ලුමෙන් ඇතිවන පීඩනය අඩුවීම තුළින් මුදල් ප්‍රසාරණය යෝග්‍ය මට්ටමක පවත්වා ගැනීමට මහ බැංකුවට ඉඩප්‍රස්ථාව ලැබේ. මීට අමතරව, රාජ්‍ය සංස්ථා ඔවුන්ගේ ශේෂපත්‍ර ශක්තිමත් කිරීම සඳහා යොදාගත් මිල ක්‍රමෝපායයන් සහ ව්‍යාපාර ප්‍රතිසංවිධානය කිරීමේ ක්‍රියාවලීන් එම ආයතනවල මූල්‍යමය ශක්තිමත්භාවය වැඩිකිරීමට හේතුවනු ඇත. මේ අතර, රජයේ මැදිකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සකස් වී ඇත්තේ අපේක්ෂිත ඉහළ ආර්ථික වර්ධනය තුළින් අයවැය හිඟය අඩුවීම හරහා ණය ප්‍රමාණය ක්‍රමිකව අඩුකිරීම සඳහාය. ඒ අනුව, 2016 වසර වනවිට රාජ්‍ය ණය, ද.දේ.නි.යේ. ප්‍රතිශතයක් ලෙස සියයට 65 ක් පමණ දක්වා අඩු කිරීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, විචක්ෂණශීලී රාජ්‍ය ණය කළමනාකරණය, මැදිකාලීනව ණය ප්‍රමාණයේ සාමාන්‍ය කල්පිරීමේ කාලය දීර්ඝ කිරීමට සහ ණය සේවාකරණ පිරිවැය අඩුවීමට හේතුවනු ඇත.

## 1.5 ගැටලු සහ ප්‍රතිපත්ති

**කෘෂිකාර්මික අංශය ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ දී උපායමාර්ගික කාර්යභාරයක් ඉටු කරනු ලබන බැවින්, එම අංශයේ ඵලදායීතාවය සහ ලාභදායීත්වය ඉහළ නැංවීම අත්‍යවශ්‍ය වනු ඇත.** ද.දේ.නි.ට කෘෂිකාර්මික අංශයේ දායකත්වය සියයට 11 ක් පමණක් වුව ද එය ශ්‍රම බලකායෙන් සියයට 29 ක් පමණ ග්‍රහණය කරගෙන ඇත. කෘෂිකාර්මික අංශයේ අඩු ඵලදායීතාවය හේතුවෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ යන අතර, තරගකාරිත්වය ද අඩු වෙයි. නව තාක්ෂණය හඳුන්වා දීම තුළින් කෘෂිකාර්මික අංශය නවීකරණය කිරීම, එහි ඵලදායීතාවය ඉහළ නැංවීමට උපකාරී වන අතර, ගෝලීය නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වීම ඔස්සේ නව තාක්ෂණය උපයෝගී කර ගැනීමට ද හැකිවනු ඇත. කෘෂිකාර්මික අංශයේ ඵලදායිතාව වර්ධනවීම තුළින් කෘෂිකාර්මික කටයුතුවල දැනට යෙදී සිටින ශ්‍රමිකයින් ආර්ථිකයේ නැගී එන අනෙකුත් අංශයන් කරා යොමු කරවීමට හැකිවනු ඇත. නිෂ්පාදිත ඒකක ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පුද්ගලයකු සතු වන ඉඩම් වපසරිය වැඩි කිරීම සහ වඩා යහපත් ගොවිපොල කළමනාකරණ ක්‍රියාපටිපාටි සඳහා දිරිගැන්වීම, ඉඩම්-ශ්‍රමික අනුපාතය වර්ධනය කිරීමට දායක වන අතර, කෘෂිකාර්මික අංශයේ ඵලදායීතාවය වර්ධනයට ද ඉවහල් වේ. යෙදවුම් වඩාත් කාර්යක්ෂම ලෙස භාවිතය සහ දේශීය අමුද්‍රව්‍ය කර්මාන්තවල වර්ධනය තුළින් ආනයනය කරනු ලබන යෙදවුම් එනම් පොහොර, කෘෂිරසායන, බීජ සහ යන්ත්‍රෝපකරණ මෙන්ම ආහාර සැකසුම් හා සත්ත්ව ආහාර නිෂ්පාදනවලට යෙදවුම් ලෙස යොදාගන්නා වෙනත් බෝගවලද ආනයන මිල ගණන් උච්චාවචනය හේතුවෙන් නිෂ්පාදන වියදම මත ඇතිකරන පීඩනය පාලනය කර ගැනීමට හැකිවනු ඇත. කෘෂිකාර්මික අපනයනය වැඩි කිරීම සඳහා වෙළෙඳ භාණ්ඩ මත පදනම් වූ කර්මාන්තවලට වඩා නිෂ්පාදන මත පදනම් වූ කර්මාන්ත සංවර්ධනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, ගෝලීය නිෂ්පාදන දාමය මගින් නිෂ්පාදනවලට ඉහළ එකතු කළ අගයක් ලැබෙන අතර, එය ජාතික

ආදායමට සහ අපනයන ආදායමට මෙම අංශයේ දායකත්වය උපරිම ලෙස යොදාගැනීමටත්, මෙම අංශයේ කටයුතුවල නියුතුවන්නන්ගේ ආදායම වැඩි කිරීමටත් හේතුවනු ඇත.

**රක්ෂණ හා ණය ආරක්ෂණ යෝජනා ක්‍රම ප්‍රමාණවත්ව නොපැවතීම හේතුවෙන්, කෘෂිකාර්මික අංශයේ නිරත ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාර, බැංකු ණය ලබා ගැනීමට යාමේ දී අපහසුතාවන්ට මුහුණ දෙනු ලබයි.** මේ වනවිට කෘෂිකාර්මික අංශයේ වගා රක්ෂණ ආවරණය පහළ මට්ටමක පවතී. එමනිසා, කෘෂිකාර්මික අංශයේ අවදානම අවම කිරීම සඳහා සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන රක්ෂණ ක්‍රම සහ ණය ආරක්ෂණ යෝජනාක්‍රම ප්‍රවර්ධනය කිරීම වැදගත් වන අතර, එමගින් මෙම අංශය වෙත ණය ලබාදීම ව්‍යාප්ත කිරීම ද ධෛර්යමත් කළ හැකිය. ඇතැම් රටවල් විසින් ණය ව්‍යාප්ත කිරීමට පහසුකම් සැලසීම සඳහා දර්ශක පදනම් කරගත් රක්ෂණ උපකරණ සහ ණය ඇප අරමුදල් වැනි අවදානම් පැවරීමේ නව මූල්‍ය උපකරණ සකස් කර ඇත. රක්ෂණ උපකරණ, බෝග හානිවීම්වලට වඩා වර්ෂාපතනය වැනි කාලගුණික දර්ශක සමග සම්බන්ධ කර ගැනීම වඩා යෝග්‍ය වේ. මෙවැනි උපකරණයන්හි ගනුදෙනු පිරිවැය අඩු හෙයින් ඒවා දැරිය හැකි මට්ටමක පවතින අතර, වගා කරන බෝග වර්ගය තෝරා ගැනීමේ දී වඩාත් සුදුසු තීරණය ගැනීම සඳහා ගොවීන් දිරිමත් කෙරෙනු ඇත. එසේ ම, ණය දෙන්නන් ද ණය නොගෙවීමේ අවදානමෙන් ආරක්ෂා වේ. යහපත් මට්ටමක ප්‍රාග්ධනයක් සහ මනා කළමනාකරණයක් සහිත සමුපකාර, රාජ්‍ය නොවන සංවිධාන, සංවර්ධන බැංකු සහ ඉඩම් බැංකුවල දායක මුදල් ඒකාබද්ධ කිරීමෙන් ණය ඇප අරමුදල් පිහිටුවා ඇත. සමුපකාර හෝ රාජ්‍ය නොවන සංවිධානවල සාමාජිකයන් වෙනුවෙන් ණය ලබා දෙනු ලබන බැංකු සඳහා එම ණය වෙනුවෙන් ණය ඇප ක්‍රමය මගින් ඇප ආවරණයන් නිකුත් කරනු ලබයි. සමුපකාර සහ රාජ්‍ය නොවන ආයතනයන්ට බැංකු විසින් නොපිළිගන්නා ඇප වර්ග වන වෙළෙඳ තොග, කෘෂිකාර්මික ඉඩම්, චංචල දේපොළ සහ වාහන මෙම ආයතන විසින් ඇපයක් ලෙස පිළිගෙන ණය ඇප නිකුත් කරන බැවින්, බැංකුවලින් සෘජුව ම ණය ලබා ගැනීම සමග සැසඳීමේ දී ණය ඇපකරු ක්‍රමය හරහා ණය ලබා ගැනීමේ වාසි පවතී. තවද, සමුපකාරයක් හෝ රාජ්‍ය නොවන සංවිධානයක් විසින් ඇපකරයක් දරන බැවින්, ණය දෙන ආයතන වෙත උකස් තැබීමක් ද අවශ්‍ය නොවේ. මෙවැනි යෝජනා ක්‍රම ඇතැම් නැඟී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි ජනප්‍රිය වී ඇති අතර, කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය තහවුරු කිරීම සඳහා මෙවැනි ක්‍රම ශ්‍රී ලංකාවේ ද සාර්ථකව ක්‍රියාත්මක කළ හැකිය.

**අතීතයේ සිට ම ශ්‍රී ලංකාව තුළ කාර්යක්ෂම ජල කළමනාකරණයක් පැවැති බව පිළිගනු ලැබුව ද, ආර්ථික කටයුතුවල ප්‍රසාරණයත් සමග බහුවිධ අවශ්‍යතා සඳහා ඉහළ යන ඉල්ලුම හමුවේ ජල සම්පාදනය ඉතා අභියෝගාත්මක වී ඇත.** එබැවින් අනෙකුත් රටවල සේ ම ශ්‍රී ලංකාව ද තිරසාර ජල කළමනාකරණ උපාය මාර්ගයක් සැකසීම සඳහා වන අභියෝගයට මුහුණ පා සිටී. ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වාරිමාර්ග අමාත්‍යාංශය සහ මහවැලි සංවර්ධන අධිකාරිය ඇතුළු රජයේ නියෝජිත ආයතන ගණනාවක් රටෙහි ජල කළමනාකරණ කාර්යයෙහි නියුතුව සිටී. මෙයින් වාරිමාර්ග අමාත්‍යාංශය සහ මහවැලි සංවර්ධන අධිකාරිය, සෘතු මත පදනම් වූ මෙහෙයුම් සැලැස්මකට අනුව වාරි කර්මාන්ත සඳහා ජල සම්පාදනය කරනු ලබන අතර, අවසාන බෙදුම් තීරණය වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මෙන්ම ලංකා විදුලිබල මණ්ඩලයෙහි නියෝජිතයන්ගෙන් ද සැදුම්ලත් මණ්ඩලයක් මගින් සිදු කෙරේ. තිබෙන ජල ප්‍රමාණය මත වගා සැලැස්ම තීරණය වන අතර, නියමිත සෘතුවේ දී අනුමත කරන ලද හෙක්ටයාර ප්‍රමාණයක් පමණක් වගා කිරීම සඳහා ගොවියන් යොමු කරනු ලැබේ. අතිරික්ත ජලය පවතී නම් විදුලිබල ජනනයට ප්‍රමුඛතාව හිමි වේ. විවිධ විධිවිධානයන් යටතේ ක්‍රියාත්මක වන ආයතන රැසක් ක්‍රියාවලිය තුළ දී සම්බන්ධ වන බැවින් ශ්‍රී ලංකාවේ ජල කළමනාකරණ කටයුතු සංකීර්ණ වී ඇත. ජල විදුලිබල ජනනය හා වාරි කර්මාන්ත සඳහා නිකුත් කරන ජලය පොදු භාණ්ඩයක් ලෙස සැලකෙන අතර, රජය එහි භාරකරුවා ලෙස කටයුතු කරයි. පොදු භාණ්ඩයක් ලෙස, ජලය බොහෝ පිරිසක් භාවිතා කරන අතර, එය ''පොදුජන ව්‍යසන'' තත්ත්වයක්, එනම් පෞද්ගලික සුභසිද්ධිය සඳහා තම අභිමතය පරිදි පරිභෝජනය කිරීම හේතුවෙන් ජලය ක්ෂයවීම හෝ විනාශවීම සිදු වේ. එබැවින්, සම්පත් භාවිතය පිළිබඳ වගකීමක් සහිත ඒකාබද්ධ ප්‍රවේශයක් සහ මධ්‍යගත ක්‍රමයක් හැකි සෑම අවස්ථාවක ම ඇති කිරීම වැදගත් වන අතර, එමගින් ජලය පිළිබඳ අයිතිය හා භාවිතය යම් පාර්ශ්වයක් වෙත සුදුසු ලෙස පැවැරිය යුතු වේ. එමෙන්ම, එම පාර්ශ්වය වෙතින් සුදුසු ගෙවුම් යාන්ත්‍රණයක් ඔස්සේ නැවත අදාල මුදල් අය කරගත යුතුය. මෙම යාන්ත්‍රණය ඔස්සේ දුර්ලභ ජල සම්පත හොඳින් කළමනාකරණය වීමට අමතරව, රටෙහි සංවර්ධනයේ තිරසාරභාවයට ද දායක වේ. ගෘහස්ත හා කර්මාන්ත ක්ෂේත්‍රයේ පරිභෝජනය සඳහා ජලය සැපයීම හා බෙදාහැරීම පිළිබඳව සැලකූ විට, ජල කාන්දුවීම් අවම කිරීම සඳහා දැනට පවතින බෙදාහැරීමේ සහ සම්පාදනය කිරීමේ ජලනල පද්ධතිය පුනරුත්ථාපනය කිරීම සහ ජල මනු පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා උත්සාහ දැරිය යුතුය.

**ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් තත්ත්වයට ගමන් කරන බැවින් නිෂ්පාදන කටයුතු, ඉහළ එකතු කළ අගය සහිත නිෂ්පාදන බවට විවිධාංගීකරණය කිරීම සඳහා නවෝත්පාදන සහ පර්යේෂණ හා සංවර්ධන කටයුතු කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාවයක් පවතී.** වැටුප් ඉහළ යාමත් සමඟ ආර්ථිකයේ ශ්‍රම සූක්ෂම කර්මාන්තවලට හිමි සාපේක්ෂ වාසිය අහිමි වන අතර, ඒ අනුව දැනට පවතින ශ්‍රම සූක්ෂම කර්මාන්තවල සිට දැනුම පදනම් කරගත් තාක්ෂණ සූක්ෂම කර්මාන්ත වෙත පරිවර්තනය කිරීම අවශ්‍ය වේ. මෙමඟින් කාර්මික නිෂ්පාදනයන්, ඉහළ එකතු කළ අගය සහිත නිෂ්පාදන බවට විවිධාංගීකරණය කිරීමේ හැකියාව ඇති, රටට සැලකිය යුතු මට්ටමේ විදේශ විනිමය උපදවනු ලබන නැනෝ තාක්ෂණය යොදාගත් නිෂ්පාදන, ජෛව තාක්ෂණ නිෂ්පාදන, විදුලි නිෂ්පාදන හා ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන වැනි උසස් තාක්ෂණික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය මතු කරයි. රජය විසින් කර්මාන්ත ක්ෂේත්‍රයේ නවෝත්පාදන ධෛර්යයමත් කිරීමේ අරමුණ ඇතිව, පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා මෑත වසරවල දී විවිධ දිරිගැන්වීම් ලබා දී ඇත. ආදායම් බදු අනුපාත අඩුකිරීම, පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දරනු ලබන පිරිවැය සඳහා වන බදු අඩු කිරීම්, විද්‍යාත්මක පර්යේෂණ සඳහා භාවිතා කරනු ලබන උපකරණ හා මෙවලම් සඳහා වන රේගු බදු ඉවත් කිරීම, පර්යේෂණ දීමනා හා පර්යේෂණ සඳහා අරමුදල් ලබාදීම වැනි විවිධාකාරයෙන් මෙම දිරිගැන්වීම් සිදු කරන ලදී. ''නැනෝ තාක්ෂණ හා විද්‍යා උයන'' ස්ථාපිත කිරීම ද මෙම තාක්ෂණය භාවිතයෙන් කර්මාන්තයන් සංවර්ධනය වීම සඳහා අනර්ඝ අවස්ථාවක් විවර කර ඇත. තවද, නවෝත්පාදන පදනම් කරගත් ව්‍යාපාර සංවර්ධනය කිරීම සඳහා, විවිධ රාජ්‍ය ආයතන විසින් විවිධ ජාත්‍යන්තර නියෝජිත ආයතනවල උපකාර ඇතිව, තාක්ෂණ ව්‍යාපාර ඉන්කියුබේටර හා තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. උදාහරණයක් ලෙස, ජාතික ව්‍යවසායය සංවර්ධන අධිකාරිය, රාජ්‍ය අංශයේ විශ්වවිද්‍යාල දෙකක සහ මොරටුව විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ ව්‍යාපාර ඉන්කියුබේටරයේ සහයෝගය ඇතිව තාක්ෂණ ව්‍යාපාර ඉන්කියුබේටර පිහිටුවීමට මෑතක දී පියවර ගන්නා ලදී. මෙම තාක්ෂණ ව්‍යාපාර ඉන්කියුබේටර සහ තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථාන මගින් මෙතෙක් තාක්ෂණික හා ව්‍යාපාර කටයුතු සඳහා ලබා දුන් සහාය සීමිත මට්ටමක පැවතිය ද, මෙම සහයෝගීතාවය උපයෝජනය කිරීම තුළින් කර්මාන්ත අංශය තවදුරටත් විවිධාංගීකරණය කිරීමට යොමු කළ හැකි වනු ඇත. වෙනත් රටවල අත්දැකීම් මගින් අනාවරණය වන පරිදි, නිෂ්පාදන විවිධාංගීකරණය කිරීමට මෙන්ම අපනයන වෙළෙඳපොළ ග්‍රහණය කර ගැනීම සඳහා නවෝත්පාදනයන් සහ සංවර්ධනයන් සිදු කිරීමේ වැදගත්කම තහවුරු වේ. මෙම කාරණය පිළිබඳව සැලකූ විට, උසස් තාක්ෂණය මත පදනම් වූ ව්‍යවසායකත්ව සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ නවෝත්පාදන පාදක කරගත් කාර්මික අපනයන ඉහළ නැංවීම සඳහා මුලපිරීම් සිදු කිරීම ප්‍රවර්ධනය කළ යුතුව ඇත. නිෂ්පාදනය, වටිනාකම් දාමයේ ඉහළ ස්ථානයක් කරා ගෙනයාම සඳහා ද ක්ෂේත්‍රයට අවශ්‍ය නිපුණතා පිළිබඳ පුහුණුවක් ලද ශ්‍රම බලකායක් සිටීම අවශ්‍ය වේ. ඉංජිනේරු හා තාක්ෂණය ආශ්‍රිත විෂයයන්හි අධ්‍යාපනය ප්‍රවර්ධනය කරන අතර ම, කාර්යය කිරීම තුළින් ඉගෙන ගැනීමේ ඇති වටිනාකම ද ප්‍රතික්ෂේප කළ නොහැක. එමෙන් ම, කර්මාන්ත අංශය මීළඟ මට්ටම කරා ඉහළ නැංවීමට හැකියාව සලසන්නා වූ නිපුණතා හිමිකර ගැනීම සඳහා දිරිගන්වන දැනුම ලබා ගැනීමේ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ව්‍යාපාරික ආයතන දිරිගැන්විය යුතුය.

**කාර්මික පර්ෂද පිහිටුවීමේ උපාය මාර්ගය ක්‍රියාවට නැංවීම තුළින් නිෂ්පාදන අංශයේ අභිවෘද්ධියක් ඇතිකිරීමට සහ අපනයන ඉහළ නැංවීමට සැළකියයුතු දායකත්වයක් ලබාදෙනු ඇති අතර එමඟින් 2016 වසර වන විට එ.ජ. ඩොලර් බිලියන 100 ක ආර්ථිකයක් කරා වර්ධනය වීමට උපකාරී වනු ඇත.** ඇඟළුම්, රබර්, පිඟන් මැටි සහ තේ වැනි ක්ෂේත්‍ර කිහිපයක කර්මාන්ත පර්ෂද ශ්‍රී ලංකාව තුළ දැනටමත් පිහිටුවා ඇත. තවද, මොරටුව විශ්ව විද්‍යාලය සහ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය, ජපානයේ ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සියේ (JICA) මඟ පෙන්වීම යටතේ, ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික කර්මාන්ත පර්ෂදයක් ඇති කිරීමට කටයුතු කරමින් සිටී. කාර්මික පර්ෂද ක්‍රියාවට නැංවීමත් සමග කර්මාන්තයේ ප්‍රමුඛ ගෝලීය තරගකරුවන් සමග කටයුතු කිරීමට ළදරු කර්මාන්තයන් සඳහා අවස්ථාව ලැබෙයි. තවද, පර්ෂදයන්හි කටයුතු කිරීම මගින් නවෝත්පාදන දිරිමත් වීමත්, විශේෂ නිපුණතා වර්ධනය වීමත් සිදුවන අතර, කර්මාන්ත අංශයෙහි කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය පිළිබඳ ගැටලු නිරාකරණය කර ගැනීමට ද අවස්ථාව සැලසෙනු ඇත. ශක්තිමත් දේශීය කාර්මික පර්ෂද පැවතීම, ඍජු විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ද උපකාරී වේ. අනූව දශකයේ මැද භාගයේ පටන්, රටවල් විසින් ව්‍යාපාර තරගකාරිත්වය වැඩි කර ගැනීමටත්, ශක්තිමත් කලාපීය ආර්ථිකයන් ඇති කර ගැනීමටත් කාර්මික පර්ෂද ප්‍රතිපත්තීන් යොදාගන්නා ලදී. දියුණු රටවල් විසින් තම රටේ කාර්මික අංශයේ තරගකාරිත්වය ශක්තිමත්

කිරීම සඳහා පිහිටුවන ලද මහා පරිමාණ පර්ෂද සඳහා උදාහරණ ලෙස, එක්සත් ජනපදයේ සිලිකන් වැලි, ජපානයේ ටොයොටා පර්ෂදය, ජර්මනියේ Baden-Wuerttemberg පර්ෂදය, චීනයේ Hsinchu විද්‍යාත්මක සහ කාර්මික උද්‍යානය, සහ එක්සත් රාජධානියේ Cambridge Technopole යනාදිය දැක්විය හැක. ශ්‍රී ලංකාවට ද කර්මාන්ත පර්ෂද පිහිටුවීම තුළින් තම තාක්ෂණය පදනම් කරගත් කර්මාන්ත නගාසිටුවීමටත්, එමගින් ඉහළ එකතු කළ අගයක් සහිත නිෂ්පාදන කරා ගමන් කිරීමටත්, අපනයන සහ කර්මාන්ත පදනම විවිධාංගීකරණය කිරීමටත් හැකිවනු ඇත.

**ශ්‍රී ලංකාව අන්තර්ජාතික වශයෙන් තරගකාරී වාණිජ කේන්ද්‍රයක් බවට පරිවර්තනය කිරීමේ දී, දැනට පවතින පොදු උපයෝගීතා සේවා සහ යටිතල පහසුකම් කෙරෙහි දැඩි පීඩනයක් ඇතිවනු ඇත.** සමස්ත නිෂ්පාදනයෙන් සියයට 6 කට හා ගෝලීය අපනයනයන්ගෙන් සියයට 19 ක් වන සේවා අංශය, ගෝලීය ආර්ථිකය තුළ සීඝ්‍ර වර්ධනයක් අත්පත් කර ගන්නා අංශයක් බවට පත්ව ඇත. ශ්‍රී ලංකාවෙහි, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සේවා අංශයෙහි දායකත්වය සියයට 60 ක් වන අතර, මුළු භාණ්ඩ හා සේවා අපනයනවලින් සියයට 30 ක් සේවා අපනයන වේ. පසුගිය දශකය පුරාවට පැවැති සේවා අපනයන වර්ධනය තුළින්, ඉදිරි වර්ධන අපේක්ෂාවන් ළගාකර ගැනීමේ දායකත්වය සපයන ප්‍රධාන අංශය බවට සේවා අපනයන පත්වීමට ඇති හැකියාව පෙන්නුම් කරනු ලබයි. රටෙහි වාසිදායක පිහිටීම සහ සාපේක්ෂ ප්‍රතිලාභ ප්‍රයෝජනයට ගනිමින් පංචබල කේන්ද්‍රයන් සහ සංචාරක ව්‍යාපාරය සංවර්ධනය කිරීමේ රජයේ උපායමාර්ගික සැලසුම ද, සේවා අංශය මැදිකාලීන වශයෙන් ආර්ථික වර්ධනයේ ප්‍රධාන මෙහෙයුම්කරු ලෙස පත්වීමට ඇති හැකියාව තහවුරු කරයි. කලාපය තුළ ශ්‍රී ලංකාව වෙළෙඳ කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම සඳහා සිදු කෙරෙමින් පවතින සීඝ්‍ර සංවර්ධන කටයුතු සමඟ, ජලය, විදුලිය, අපවහන මාර්ග, ගිනි ආරක්ෂක සේවා සහ ගමනාගමන යටිතල පහසුකම් වැනි පොදු උපයෝගීතා සේවා සහ යටිතල පහසුකම් නැගී එමින් පවතින ආර්ථික ක්‍රියාකාරකම් තුළින් ඇතිවන ඉල්ලුමට සරිලන පරිදි සංවර්ධනය කිරීම අත්‍යවශ්‍යව ඇත.

**තොරතුරු තාක්ෂණ සේවා සහ ව්‍යාපාර ක්‍රියාවලි හා දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවැරීම පිළිබඳව ශ්‍රී ලංකාවට ඉහළ පිළිගැනීමක් පවතින බැවින්, එම ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය උදෙසා රටට ආවේණික වූ අනන්‍යතාවයක් හා කුසලතා සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.** මහා පරිමාණ ලෙස, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ කටයුතුවල නිරත වන්නා වූ ඉන්දියාව වැනි අනෙකුත් තරගකරුවන්ට සාපේක්ෂව ශ්‍රම බලකාය සීමිත වුවද, ශ්‍රී ලංකාව, මෘදුකාංග තත්ත්ව පරීක්ෂාව, මූල්‍ය සහ ගණකාධිකරණය වැනි ක්ෂේත්‍රයන්හි මනා පුහුණුවකින් යුත් ශ්‍රම බලකායකට හිමිකම් කියයි. එමෙන් ම, ඉතා ඉහළ මට්ටමේ ගුණාත්මක භාවයකින් යුතු, සාපේක්ෂව ලාභදායී සහ සදාචාරාත්මක ශ්‍රම ප්‍රතිපත්තිවලින් යුතු ශ්‍රම බලකායක් සමඟ ශ්‍රී ලංකාව බාහිර මූලාශ්‍ර වෙත සේවා පැවරීමේ ආකර්ෂණීය මධ්‍යස්ථානයක් බවට පත් වී ඇත. කෙසේ වුවද, ශ්‍රී ලංකාව තොරතුරු තාක්‍ෂණ සේවා සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම, 2015 වසර වනවිට, එ.ජ. ඩොලර් බිලියන එකක ආදායමක් උපයන කර්මාන්තයක් දක්වා ඉහළ නැංවීමේ අපේක්‍ෂාව හමුවේ අභියෝග රැසකට මුහුණදෙනු ඇත. ශ්‍රී ලංකාව කලාපයේ ප්‍රධාන සැපයුම්කරුවෙකු ලෙස හා සේවා සඳහා රටටම ආවේණික වූ අනන්‍යතාවයක් ඇති කරගැනීම, මෙම අංශයේ වර්ධන විභවතාව තවදුරටත් ඉහළ නංවා ගැනීමට උපකාරි වනු ඇත. බාහිර මූලාශ්‍රවලට සේවා පැවරීමේ නැගීඑන මධ්‍යස්ථානයක් ලෙස රට ස්ථානගත කිරීම සඳහා ලෝකයේ ප්‍රධාන නගරවල තොරතුරු තාක්‍ෂණ වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම වැදගත් ක්‍රමෝපායක් වනු ඇත. තොරතුරු තාක්‍ෂණය පදනම් කරගත් සේවා අපනයන පුළුල් කිරීම සඳහා ශ්‍රම කුසලතා සහිත බලකායක් ඇතිකර ගැනීම පූර්ව අවශ්‍යතාවයකි. මෙම අභියෝග ජය ගැනීම සඳහා, ශ්‍රී ලංකාවේ දක්‍ෂයින් තොරතුරු තාක්‍ෂණය සහ ඒ ආශ්‍රිත අංශයන්හි පවතින රැකියා අවස්ථා පිළිබඳ දැනුම්වත් කිරීමත්, අවශ්‍ය දැනුම සහ පුහුණුව මෙන්ම හැකියාවන් නගා සිටුවීම සඳහා විශ්වවිද්‍යාල සමඟ ඒකාබද්ධව උපාධි වැඩසටහන් දියත් කිරීමත් අනාගතයේ දී මෙම අංශය පුළුල් කිරීම සඳහා අවශ්‍ය වේ. සේවා අපනයනයන්හි තිරසාර වර්ධනය, බුද්ධිගලනය ආපසු හැරවීමටත්, එමගින් නැගී එමින් පවතින ක්ෂේත්‍රයන්හි ඇති පුහුණු සේවක අවශ්‍යතාවය සපුරා ගැනීමටත් හැකි වනු ඇත.

**ආර්ථිකයේ සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතින අංශයන්ගෙන් එකක් වන සංචාරක කර්මාන්තයට 2016 වසරේ දී මිලියන 2.5 ක සංචාරක පැමිණීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා වෙළෙඳපොළ අරමුණු කරගත් පැහැදිලි උපායමාර්ගයක් පැවැතීම අවශ්‍ය වේ.** ගැටුම් නිමවීමත් සමග මෙම කාලපරිච්ඡේදය තුළ දී සංචාරක පැමිණීම් දෙගුණයකටත් වඩා වැඩිවීම මගින් සංචාරක කර්මාන්තයේ පවතින සීඝ්‍ර දියුණුව පෙන්නුම් කරයි. කෙසේ වුවද, සංචාරක කර්මාන්තය තවදුරටත් පුළුල් කිරීමේ දී, මනා පුහුණුවක් ලද සේවක මණ්ඩලයක අවශ්‍යතාවය, සේවා සැපයීමේ ප්‍රමිතිය වැඩි දියුණු කිරීම, හෝටල් කාමර ප්‍රමාණය වැඩි කිරීම සහ විශේෂයෙන් ම සාම්ප්‍රදායික නොවන වෙළෙඳපොළ වෙත සිදුකරනු

ලබන ප්‍රවර්ධන වැඩසටහන් කෙරෙහි වැඩි පරිශ්‍රමයක් යොමු කිරීම වැනි නොයෙකුත් අභියෝගයන්ට මුහුණදීමට සිදු වේ. ආගන්තුක සත්කාරය පිළිබඳ පුහුණුවක් ලද සේවක සංඛ්‍යාව දියුණුවෙමින් පවතින මෙම ක්ෂේත්‍රයේ අවශ්‍යතාවය සඳහා ප්‍රමාණවත් නොවේ. එම නිසා, නව පුහුණු කිරීමේ පාසල් ස්ථාපිත කිරීමේ, උසස් සුදුසුකම් ලබා ගැනීම සහ විවිධ අංශයන්ගෙන් කුසලතා සංවර්ධනය කිරීම සඳහා වර්තමාන ශ්‍රමිකයින් උනන්දු කිරීමේ සහ වෙනත් රටවල සේවය කරන්නා වූ ශ්‍රී ලාංකීය හෝටල්කරුවන් මෙරටට පැමිණීම සඳහා දිරිගැන්වීමේ ඉහළ අවශ්‍යතාවක් පවතී. මෙය පුහුණු ශ්‍රමිකයන් ප්‍රමාණය වැඩි කිරීමටත් එමගින් මෙම ක්ෂේත්‍රයේ සේවා සැපයීමේ ප්‍රමිතිය වැඩි දියුණු වීමටත් හේතුවනු ඇත. හෝටල් ක්ෂේත්‍රයේ දැනට සිදු කෙරෙමින් පවතින මහා පරිමාණ ව්‍යාපෘතීන් මගින් ඉලක්කගත සංචාරක පැමිණීම් ප්‍රමාණයට අවශ්‍ය වන පරිදි ක්ෂේත්‍රයේ ධාරිතාවය වැඩි කිරීමට හැකිවනු ඇති අතර එම නිසා මෙම ව්‍යාපෘතීන් නියමිත කාලයේ දී සම්පූර්ණ කිරීම වැදගත් වේ. මෙම ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සහයෝගී ක්‍රියාකාරිත්වය අඛණ්ඩව පවත්වා ගැනීම අවශ්‍ය වනු ඇත. තවද, මෙතෙක් අවධානය යොමු නොවූ නමුත් විභවතාවයක් පවතින වෙළෙඳපොළවල ප්‍රවර්ධන වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක කිරීම හරහා පුළුල් භූගෝලීය පදනමක් ඔස්සේ සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කරන අතර එමගින් සංචාරක ව්‍යාපාරය තුළ බාහිර කම්පනයන්ට මුහුණදීමට ඇති හැකියාව ශක්තිමත් කිරීමට හැකිවනු ඇත.

**බාහිර කම්පන හේතුවෙන් රටට සිදුවිය හැකි බලපෑම අවම කිරීම සඳහා අපනයන නිෂ්පාදිත සහ වෙළෙඳපොළ විවිධාංගීකරණය අත්‍යවශ්‍ය වේ.** 1960 දශකයෙහි ශ්‍රී ලංකාවේ පැවැති කෘෂිකර්මාන්තය පදනම් කරගත් අපනයන ව්‍යුහය, රෙදිපිළි හා ඇඟළුම් සහ රබර් නිෂ්පාදිත ඇතුළත් සරල නිෂ්පාදන මූලික කරගත් අපනයන ව්‍යුහයක් වෙත යොමු වී ඇත. කෙසේ වුවද, අපනයන ආදායම තවදුරටත් වෙළෙඳ භාණ්ඩ කිහිපයක් මත රඳා පවතී. 1960 ගණන්වල දී තේ වැනි ප්‍රාථමික වෙළෙඳ භාණ්ඩ, මුළු අපනයන ආදායමෙන් සියයට 60 ක් පමණ වූ අතර, 2013 වසරේ දී, තේ සහ රෙදිපිළි හා ඇඟළුම් අපනයන යන දෙකෙහි ම වටිනාකම මුළු අපනයන ආදායමෙන් සියයට 58 ක් පමණ විය. අපනයන ක්ෂේත්‍රයේ නිෂ්පාදිත විශාල ලෙස විවිධාංගීකරණය කිරීම, ජාත්‍යන්තර වෙළෙඳපොළේ භාණ්ඩ මිල ගණන් තියුණු ලෙස පහත වැටීම හෝ ගෝලීය ආර්ථික අවපාතයක් ඇතිවීම වැනි අහිතකර බාහිර කම්පන මෙන්ම දැඩි නියගයන් වැනි අනපේක්ෂිත දේශීය කම්පන හේතුවෙන් අපනයන ආදායමට එල්ල විය හැකි අහිතකර බලපෑම් අවම කිරීම සඳහා උපකාරීවනු ඇත. එකතු කළ අගය ඉහළ නැංවීමට සහ නිෂ්පාදන යෙදවුම් මෙරට නිෂ්පාදනය සඳහා දිරිගැන්වීමට සහන ලබාදීම මෙන් ම නවෝත්පාදනය උදෙසා ආයතනික සහාය ලබාදීම, නිෂ්පාදන පදනම පුළුල් කිරීම සඳහා ගන්නා ලද ප්‍රතිපත්ති අතරින් කිහිපයක් වේ. මැදිකාලීනව අපනයන ආදායම පුළුල් කිරීම සඳහා සහ ආර්ථික කටයුතු විවිධාංගීකරණය කිරීම සඳහා පංචබල කේන්ද්‍රීය සංකල්පය හඳුන්වාදීම රජය විසින් ගනු ලැබූ ප්‍රශංසනීය ක්‍රියාමාර්ගයක් වේ. විශේෂයෙන් නැගී එන ආර්ථිකයන් වැනි සාම්ප්‍රදායික නොවන වෙළෙඳපොළවල් වෙත ප්‍රවේශවීමට ඇති හැකියාව වැඩිදියුණු කිරීමේ වැදගත් උපක්‍රමයක් ලෙස දේශීය සමාගම් වෙත ජාත්‍යන්තර ලෙස පිළිගත් සන්නාම හිමිකර ගැනීම සඳහා දිරි දීමනා ලබාදීම සැලකිය හැකිය. සාම්ප්‍රදායික නොවන වෙළෙඳපොළ තුළ ඇඟළුම් කර්මාන්තයේ වෙළෙඳපොළවල් ග්‍රහණයේ වැඩිවීමක් දක්නට ලැබුණ ද, මුළු රෙදිපිළි හා ඇඟළුම් අපනයනයෙන් සියයට 89 කට දායකත්වය ලබාදෙමින් යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ රෙදිපිළි හා ඇඟළුම් සඳහා ප්‍රධාන වෙළෙඳපොළවල් ලෙස තවදුරටත් පවතී. එසේම, තේ පිළිබඳව සලකා බැලූ විට, මුළු තේ අපනයනයෙන් සියයට 70 ක් පමණ මැදපෙරදිග හා ස්වාධීන පොදුරාජ්‍ය මණ්ඩලීය රටවලට සිදු කරනු ලබයි. අපනයන ගමනාන්ත භූගෝලීය වශයෙන් විවිධාංගීකරණය කිරීම මෑත කාලීන වශයෙන් අවධානයට යොමු වූ තවත් කරුණක් වේ. ද්විපාර්ශ්වීය සහ බහුපාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්වල භාවිතය ඉහළ නැංවීම, මූලාරම්භය පිළිබඳ නීති, තීරුබදු සහ තීරුබදු නොවන බාධක සහ වෙළෙඳ ගිවිසුම් ඔස්සේ නව වෙළෙඳපොළවල් වෙත ළඟාවීමේ අවස්ථාවන් උදාකර ගැනීම ආදිය පිළිබඳව අපනයනකරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම තුළින් නව වෙළෙඳපොළවල් වෙත ප්‍රවේශවීමේ අවස්ථා සැලකිය යුතු ලෙස වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, දැනට පවතින මෙන්ම නව නිදහස් හා වරණීය වෙළෙඳ ගිවිසුම් වලට අඛණ්ඩව සහ ක්‍රියාශීලීව සහභාගීවීම තුළින් එම ගිවිසුම් මගින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට හැකිවනු ඇත. නැගීඑන වෙළෙඳ ආර්ථිකයන්හි පවතින සීඝ්‍ර වර්ධනය සහ මැදි ආදායම් ලබන පුද්ගල බාණ්ඩයන්ගේ ඉහළයාම හේතුවෙන් විදේශ වෙළෙඳ ප්‍රවාහ සැලකිය යුතු ලෙස මෙම රටවලට යොමු වී ඇත. මෙම සංවර්ධනයන් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සංයුතිය සහ අපනයන ගමනාන්තයන් නැගීඑන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් වෙත ක්‍රමයෙන් යොමුවෙමින් එම ආර්ථිකයන් සමඟ කරනු ලබන වෙළෙඳාම වැඩිවෙමින් පවතී. නිෂ්පාදන සහ වෙළෙඳපොළ කිහිපයකට සීමා වූ

අපනයන හේතුවෙන් ඇති විය හැකි අහිතකර බලපෑම අවම කරමින් රටේ අපනයන විභවතාව වර්ධනය කිරීමට මෙය උපකාරී වනු ඇත.

**ඉහළ මැදි ආදායම්ලාභී තත්ත්වය කරා ළඟාවීමට හා ඉන් ඔබ්බට ගමන් කිරීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව මූල්‍ය පද්ධතියේ ශක්තිමත්භාවය හා නම්‍යශීලීත්වය මත බොහෝ දුරට රඳා පවතී.** ගනුදෙනු හා තොරතුරු ලබා ගැනීමේ පිරිවැය අඩු කිරීමට සහ ණයදීම් වැඩි කිරීම සඳහා මූල්‍ය ආයතන, වෙළෙඳපොළවල් සහ උපකරණ සංවර්ධනය කිරීම අවශ්‍ය වේ. මූල්‍ය සේවා වඩාත් විවිධාංගීකරණය කිරීම සහ ඒවා වෙත ප්‍රවේශ වීමේ හැකියාව වැඩි කිරීම මගින් ඵලදායී ආයෝජන සඳහා විශාල ප්‍රමාණයක ඉතුරුම් යොදා ගැනීමට හැකි වේ. සම්පත් ඒකරාශී කිරීම සහ ඒවා විවිධ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා යොමු කිරීම තුළින් මූල්‍ය ආයතන, වෙළෙඳපොළ සහ උපකරණ ඇතුළත් මූල්‍ය අංශයේ ප්‍රවණතා ආර්ථික වර්ධනය සඳහා ඉහළ කාර්යභාරයක් ඉටුකර තිබේ. කෙසේ වුවද, ඉහළ තිරසාර ආර්ථික වර්ධනයක් කරා ගමන් කිරීමට උපකාරී වීම සඳහා තවදුරටත් මූල්‍ය අංශය පුළුල් කිරීමේ විශාල විභවතාවක් පවතී. ගෝලීය සම්බන්ධතා ඉහළ නංවා ගැනීමත් සමඟම වර්ධනය වන ආර්ථිකයෙහි මූල්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීමට මෙන්ම මූල්‍ය ස්ථායිතාවය තවදුරටත් ශක්තිමත් කිරීමට හැකිවන පරිදි මූල්‍ය ආයතන ශක්තිමත් කිරීම, මහ බැංකුව විසින් හඳුන්වා දුන්, දැනට ක්‍රියාත්මක වෙමින් පවතින මූල්‍ය අංශ ඒකාබද්ධකරණ ක්‍රියාවලියේ අරමුණ වේ. මූල්‍ය ආයතන ඒකාබද්ධකරණය මගින් වඩාත් කාර්යක්ෂම හා ලාභදායී මූල්‍ය ආයතන ඇති කිරීම හරහා පරිමාණානුකූල ඵල ලබා ගැනීමට අපේක්ෂා කෙරෙන අතර, එමගින් මූල්‍ය අංශයේ ධාරිතාව සහ කුසලතා වර්ධනය වීම, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත යටිතල පහසුකම් මෙන්ම ජාත්‍යන්තර සබඳතා වැඩිදියුණු කරගැනීම මූල්‍ය අංශය සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ක්‍රියාවලීන් යොදා ගැනීම සහ යහපාලන පුරුදු වැඩිදියුණු කිරීම නව මූල්‍ය උපකරණ හඳුන්වාදීම සහ දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වෙළෙඳපොළ වෙත පිවිසීමේ හැකියාව වර්ධනය කිරීම වැනි කාරණා තුළින් මෙම අංශයෙහි කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**ශ්‍රී ලංකාව ඉහළ ආර්ථික වර්ධන මාවතකට යොමුවීම නිසා, ශ්‍රී ලංකාවේ ව්‍යවසායයන්ගේ ප්‍රධාන මූල්‍යයන ප්‍රභවය ලෙස පෞද්ගලික කොටස් ආයෝජනයන්හි කාර්යභාරය ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය වේ.** වර්තමානයේ ශ්‍රී ලංකාවේ සමාගම්වල ප්‍රධාන මූල්‍යයන මූලාශ්‍රය බැංකු ණය වේ. නව ව්‍යාපෘති සඳහා ආයෝජන මෙන් ම කාරක ප්‍රාග්ධන අවශ්‍යතා, මූල්‍යනය බැංකු ණය මත බොහෝ දුරට රඳා පවතී. කෙසේ වුවත්, බැංකු ණය ගැනීම් වැඩිවීම තුළින් ව්‍යවසායයන්ගේ ශේෂ පත්‍ර තුළ ණය ගැනීම් පිළිබිඹු කරන තෝලන අනුපාතය වැඩිවීම තුළින් සමස්ත අවදානම වැඩිවන අතර, මෙම ආයතන විසින් තම කටයුතු තවදුරටත් පුළුල් කරමින් නව ව්‍යාපෘතිවල ආයෝජනය කිරීමට ඇති හැකියාව මෙමඟින් සීමාවනු ඇත. ව්‍යාපාර සඳහා පෞද්ගලික කොටස් ආයෝජන මූල්‍යනය පැවතීම තුළින් ව්‍යවසායයන් වේගවත්ව වර්ධනය වීමට සහ දේශීය හා ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ තරගකාරීත්වය වර්ධනය කර ගැනීමට හැකි වේ. පෞද්ගලික කොටස් ආයෝජන ආයතන පිහිටුවීම මගින් පෞද්ගලික කොටස් ආයෝජනය ධෛර්යමත් කළ හැක. ප්‍රධාන වශයෙන් වර්ධනයවීම සඳහා ශක්‍යතාවක් පවතින කොටස් වෙළෙඳපොළ තුළ ලියාපදිංචි කර නොමැති ව්‍යවසායයන්හි ආයෝජනය කිරීම සඳහා දේශීය සහ විදේශීය වශයෙන් ඉහළ ශුද්ධ වත්කම් ඇති පුද්ගලයින් හා ආයතනයන්හි අරමුදල් එක්රැස් කරන ආයෝජන මාධ්‍යයක් ලෙස පෞද්ගලික කොටස් ආයෝජන ආයතන කටයුතු කරනු ලැබේ. ප්‍රාග්ධනය සැපයීමට අමතරව, මෙම පෞද්ගලික කොටස් ආයෝජන ආයතන විසින්, අවදානම් කළමනාකරණය, ව්‍යාපාර සංවර්ධනය, වෙළෙඳපොළ විශේෂීකරණය සහ ආයතනික යහපාලනය වැනි විවිධ ක්ෂේත්‍රයන්ට අදාළව විශේෂඥතාවන් සපයන අතර, එම විශේෂඥතාවයන් ආයෝජන ක්‍රියාවලිය සඳහා ද එක්වනු ඇත. මෙම ආයතන විසින් සමාගමක් වැඩි මිලකට විකිණීමට පෙර වසර ගණනාවක් පුරා තෝරාගත් සමාගමෙහි ආයෝජනය කරමින් එම සමාගම වැඩි වටිනාකමක් සහිත සමාගමක් බවට පත් කිරීමට කටයුතු සිදු කරනු ලබයි. එසේ සාර්ථක වූ ආයෝජන සමාගම් නිරායාසයෙන් ම කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත සමාගමක් බවට පත් වේ. තවදුරටත්, එම සමාගම ආර්ථික වර්ධනය සඳහා දායකත්වය සපයමින් දේශීය සහ විදේශීය වශයෙන් වඩා තරගකාරී ආයතන බවට පත් වේ. මෙවැනි අරමුදලකින් ලැබීමට අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ අතර දේශීය සමාගම් සඳහා ඇති මූල්‍යනය කිරීමේ මූලාශ්‍ර විවිධාංගීකරණය වීම, අරමුදල් ඒකරාශි කිරීම තුළින් මහා පරිමාණ වශයෙන් අරමුදල සැපයිය හැකිවීම සහ විදේශීය ආයතනික ආයෝජකයින්ගේ අරමුදල් ආකර්ෂණය කර ගැනීමට හැකිවීම තුළින් විදේශ ප්‍රාග්ධනය රට තුළට ලබා ගැනීමට හැකිවීම ප්‍රධාන වේ.


## විශේෂ සටහන 1 — ආර්ථික විවිධාංගීකරණය සහ තිරසාර වර්ධනය

### තිරසාර වර්ධනය සඳහා විවිධාංගීකරණය

ලොව බොහොමයක් රටවල ප්‍රධානම අරමුණ වනුයේ, ආර්ථික වර්ධනය තිරසාර මට්ටමක පවත්වා ගැනීමයි. බොහෝ සංවර්ධනය වන රටවලට කෙටි කාල පරිච්ඡේදයක් තුළ දී ඉහළ ආර්ථික වර්ධන වේගයක් ළඟා කර ගැනීමට හැකියාව ලැබී ඇති නමුදු එවැනි ආර්ථික වර්ධන වේගයක් සැලකිය යුතු කාල පරිච්ඡේදයක් තුළ පවත්වාගෙන යාම තුළින් අවසානයේ දී ඉහළ ආදායම් මට්ටමක් කරා ළඟා වීමට හැකි වී ඇත්තේ රටවල් සීමිත සංඛ්‍යාවකට පමණි. වර්ධන පරතරය කෙතරම් කුඩා වුවද, වසර ගණනාවක් පුරා එය සංයුක්ත වීම තුළින් ඒක පුද්ගල ආදායම් මට්ටම්වල විශාල පරතර ගොඩනැගෙන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස විවිධ රටවල ජීවන තත්ත්වයන්හි සැලකිය යුතු වෙනස්වීමක් සිදු කරනු ලබයි.[1] එම නිසා විශේෂයෙන් ම නැගී එන ආර්ථිකයන් සඳහා කෙටි කාලීනව ඇති වන්නා වූ අක්‍රමවත් අසාමාන්‍ය ඉහළ වර්ධනයකට වඩා තිරසාර ඉහළ වර්ධනයක් ළඟා කර ගැනීම වැදගත් වේ.

ස්වභාවයෙන්ම විවිධ රටවල් විවිධ වර්ගයේ සම්පත් හා ඒවායේ විවිධ මට්ටම් වලින් පොහොසත් වන අතර, එම නිසා එම රටවල ආර්ථික ක්‍රියාකාරකම් අංශ එකක් හෝ කිහිපයක් වෙත සංකේන්ද්‍රණයවී ඇත. එමගින් විවිධ රටවල් ක්ෂේත්‍ර කිහිපයක් සඳහා විශේෂීකරණය වීමට සහ ඒ හරහා අන්තර්ජාතික වෙළෙඳාම ශක්තිමත් කිරීමට හේතු වී ඇත. කෙසේ වෙතත්, සමහර රටවලට ඔවුන්ගේ ආර්ථිකයන් විවිධාංගීකරණය කිරීම තුළින් විශේෂීකරණය වූ අංශයන් එකක් හෝ කිහිපයක් මත යැපීම සීමා කිරීමට හැකියාව ලැබී ඇත. එවැනි

#### රූප සටහන වි.ස. 1.1 — සංකේන්ද්‍රණ අනුපාතිකය සහ ආර්ථික වර්ධනයේ විචලතාව




මූලාශ්‍ර:National Accounts Official Country Data - United Nations Statistics Division (UNSD), World Economic Outlook Database - October 2013 – International Monetary Fund (IMF)

#### සංඛ්‍යා සටහන වි.ස. 1.1 — තෝරාගත් රටවල සංකේන්ද්‍රණ අනුපාතය (2011 ද.දේ.නි. (රටවල්හි මුදල් ඒකකයන්ගේ ස්ථාවර මිල) පදනම් කර ගණනය කර ඇත)

**(අ) කාණ්ඩය**

| රට | සංකේන්ද්‍රණ අනුපාතය |
|---|---|
| චිලී | 13.85 |
| ජැමෙයිකාව | 13.87 |
| කුවේටය | 19.46 |
| මැලේසියාව | 14.50 |
| කටාර් රාජ්‍යය | 24.26 |
| දකුණු අප්‍රිකාව | 14.59 |
| **ශ්‍රී ලංකාව** | **14.46** |
| තායිලන්තය | 16.63 |
| වියට්නාමය | 16.00 |

**ජා.ප්‍ර.කා.ව. හි 3 වන සංශෝධනය භාවිතා කරන රටවල් සඳහා :**

- කෘෂිකර්මය, දඩයම්, දැව ආදී වන ද්‍රව්‍ය, ධීවර කර්මාන්තය
- පතල් හා කැණීම්
- නිෂ්පාදන කර්මාන්ත
- විදුලිය, ගෑස් සහ ජල සැපයුම
- ඉදිකිරීම්
- තොග සහ සිල්ලර වෙළෙඳාම, මෝටර් වාහන, යතුරු පැදි, පෞද්ගලික සහ කුටුම්භ භාණ්ඩ අලුත්වැඩියාව, හෝටල් සහ ආපන ශාලා
- ප්‍රවාහනය, ගබඩා කිරීම සහ සන්නිවේදනය
- මූල්‍ය අතරමැදිකරණය, දේපොළ වෙළෙඳාම්, කුලියට ලබාදීම් සහ වෙළෙඳ ක්‍රියාකාරකම්
- රාජ්‍ය පරිපාලන සහ ආරක්ෂක, අනිවාර්ය සමාජ ආරක්ෂණය
- අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ කටයුතු, වෙනත් ප්‍රජා, සමාජ සහ පෞද්ගලික සේවාවන්
- රැකියාවේ නියුතු පුද්ගලයින් සහිත පෞද්ගලික කුටුම්භ

**(ආ) කාණ්ඩය**

| රට | සංකේන්ද්‍රණ අනුපාතය |
|---|---|
| ඔස්ට්‍රේලියාව | 11.60 |
| ෆින්ලන්තය | 14.71 |
| ප්‍රංශය | 13.66 |
| ජර්මනිය | 14.09 |
| ග්‍රීසිය | 14.66 |
| ඉතාලිය | 13.32 |
| කොරියාව | 16.74 |
| නෝර්වේ | 13.99 |
| පෘතුගාලය | 14.51 |

**ජා.ප්‍ර.කා.ව. හි 4 වන සංශෝධනය භාවිතා කරන රටවල් සඳහා :**

- කෘෂිකර්මය, දැව ආදී වන ද්‍රව්‍ය සහ ධීවර කර්මාන්තය
- නිෂ්පාදන
- පතල් හා කැණීම් සහ අනෙකුත් කාර්මික කටයුතු
- ඉදිකිරීම්
- තොග සහ සිල්ලර වෙළෙඳාම, ප්‍රවාහනය හා ගබඩා කිරීම්, නවාතැන් හා ආහාර පාන සැපයීම් කටයුතු
- තොරතුරු හා සන්නිවේදනය
- මූල්‍ය හා රක්ෂණ කටයුතු
- දේපොළ වෙළෙඳාම් කටයුතු
- වෘත්තීයමය, විද්‍යාත්මක, තාක්ෂණික, පරිපාලන සහ ආධාරක සේවා කටයුතු
- රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක, අධ්‍යාපන, මානව සෞඛ්‍ය සහ සමාජ සේවා කටයුතු
- වෙනත් සේවා කටයුතු


(අ) සහ (ආ) කාණ්ඩවල රටවල් සඳහා වන දත්ත ජාත්‍යන්තර ප්‍රමිති කාර්මීකරණ වර්ගීකරණයේ 3 සහ 4 සංශෝධනය අනුව වර්ග කර ඇත.

මූලාශ්‍ර : National Accounts Official Country Data – United Nations Statistics Division (UNSD)
සටහන : "රැකියාවේ නියුතු පුද්ගලයින් සහිත පෞද්ගලික කුටුම්භ" කාණ්ඩය චිලී රාජ්‍යයෙහි දත්තයන්හි අඩංගු නොවේ.

1. *Pritchett (1998)*

**රූප සටහන වි.ස. 1.2**

**දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අපනයනයන් සහ ආර්ථික වර්ධනයේ විචලතාව**




මූලාශ්‍ර: World Economic Outlook Database - October 2013 – International Monetary Fund (IMF), World Development Indicators – The World Bank

විවිධාංගීකරණය වූ ආර්ථිකයක්, දීර්ඝ කාලීන වර්ධන වේගයන් පවත්වාගෙන යාම සඳහා ඉහළ දායකත්වයක් ලබාදෙන බව නිරන්තරයෙන් සලකනු ලබයි.

විවිධාංගීකරණ මට්ටම හා ආර්ථික වර්ධනයේ විචලතාව, රටවල් කිහිපයක් යොදා ගනිමින් විශ්ලේෂණය කරන්නේ නම් මෙය පැහැදිලි වේ. එවැනි විශ්ලේෂණයක් සංකේන්ද්‍රණ අනුපාතිකය සහ ආර්ථික වර්ධනයේ විචලතාව සඳහා මිනුමක් ලෙස දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගයේ සම්මත අපගමනය යොදා ගනිමින් සිදු කළ හැක. එහි දී සංකේන්ද්‍රණ අනුපාතිකය ආර්ථිකයේ විවිධ අංශයන්ගෙන් දළ දේශීය නිෂ්පාදිතයට ඇති ප්‍රතිශතාත්මක දායකත්වයන්හි වර්ගයන්ගේ එකතුව යොදාගනිමින් ගණනය කරනු ලබයි.[2] සංඛ්‍යා සටහන වි.ස. 1.1 මගින් තෝරාගත් රටවල් කිහිපයක් සඳහා සංකේන්ද්‍රණ අනුපාතය ගණනය කර ශ්‍රී ලංකාව සමග සංසන්දනය කර පෙන්වා ඇත. ඒ අනුව, ඉහළ සංකේන්ද්‍රණ අනුපාතිකයක් මගින් වැඩි සංකේන්ද්‍රණ ආර්ථිකයක් ද, පහළ සංකේන්ද්‍රණ අනුපාතිකයක් මගින් අඩු සංකේන්ද්‍රණ ආර්ථිකයක් ද විස්තර කෙරේ.

රටක ආර්ථික ක්‍රියාකාරකම් අංශ කිහිපයක් කෙරෙහි සංකේන්ද්‍රණය වීමට එරට පවතින ස්වභාවික සම්පත් මට්ටම බලපෑ හැකිය. උදාහරණයක් ලෙස, මැද පෙරදිග රටවල බහුල වශයෙන් ඛනිජ තෙල් සම්පත් ඇති අතර, එම නිසා ආර්ථික ක්‍රියාකාරකම් “පතල් හා කැනීම්” අංශය කෙරෙහි සංකේන්ද්‍රණයවී ඇත. යහපත් කාල වකවානුවල දී


**රූප සටහන වි.ස. 1.3**

**අපනයන විවිධාංගීකරණය**

(අ) මුළු නිෂ්පාදන භාණ්ඩ අපනයනයන්හි සංයුතිය (2012)

(ආ) මුළු සේවා අපනයනයන්හි සංයුතිය (2012)

(ඇ) මුළු අපනයනයන්හි සංයුතිය (2012)




මූලාශ්‍ර: World Trade Organisation

2. *Adapted from Shediac et.al. (2008), “Economic Diversification: The Road to Sustainable Development”.*

මෙම රටවලට ඉතා ඉහළ වර්ධන වේගයක් ළඟා කර ගැනීමට හැකියාව ලැබී ඇත. කෙසේ වෙතත්, ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරීත්වය ලෝක තෙල් මිල සමඟ විශාල වශයෙන් බද්ධ වී ඇති අතර, එම නිසා ආර්ථික ක්‍රියාකාරීත්වයන් කෙරෙහි ලෝක තෙල් මිල විචලනයන් සැලකිය යුතු අන්දමින් බලපෑමක් සිදු කරනු ලබයි. මේ අතර, ස්වභාවික සම්පත් වලින් පොහොසත් සමහර රටවලට එම ස්වභාවික සම්පත් වලින් ලබා ගන්නා ආදායම් වෙනත් අංශයන් කෙරෙහි යෙදවීමට හැකියාව ලැබී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, එවැනි රටවල ආර්ථික ක්‍රියාකාරකම් වඩාත් විවිධාංගීකරණය වී ඇත. ඒ අතරම, ස්වභාවික සම්පත් වලින් පොහොසත් නොවූ නමුත් ඔවුන්ගේ ආර්ථිකයන් විවිධාංගීකරණය කරගෙන ඇති රටවල් ද ඇත.

රූප සටහන වි.ස. 1.1 මඟින් දැක්වෙන පරිදි සංකේන්ද්‍රණ අනුපාතිකය සහ වර්ධන වේගයේ සම්මත අපගමනය අතර ධනාත්මක සම්බන්ධයක් දැකගත හැකිය. ඉහළ සංකේන්ද්‍රණ අනුපාතිකය මඟින් ආර්ථිකය අංශ එකක් හෝ දෙකක් කෙරෙහි සංකේන්ද්‍රණය වී ඇති බව අදහස් කෙරෙන අතර, ඉහළ සම්මත අපගමනයක් මඟින් වර්ධනයේ ඉතා ඉහළ විචලතාවයක් එනම් අස්ථාවර ආර්ථිකයක් නිර්මාණය වී ඇති ලෙස සැලකේ. ඒ අනුව, ආර්ථිකයක් අංශ කිහිපයකට පමණක් සංකේන්ද්‍රණය වී ඇති නම් එම ආර්ථිකය අඩු ස්ථාවර ආර්ථිකයක් ලෙස හැඳින්විය හැකිය. ඉන් හැඟෙනුයේ, මනා ලෙස විවිධාංගීකරණය වූ ආර්ථිකයක ආර්ථික වර්ධනය, සංකේන්ද්‍රිත ආර්ථිකයකට වඩා වැඩි තිරසාර භාවයක් අපේක්ෂා කළ හැකි බවයි. කෙසේ නමුදු, මෙම විශ්ලේෂණය ආර්ථිකයේ තෝරාගනු ලබන අංශයන් ගණන සහ කාලපරිච්ඡේදයන්ට ඉතා සංවේදී වේ. එමනිසා මෙමගින් ලබාගත හැක්කේ සාමාන්‍යගත නිරීක්ෂණයක් පමණි. එසේකුදු වුවත්, මනා ලෙස විවිධාංගීකරණය වූ ආර්ථිකයකින් අඩු විචලතාවයකින් යුතු ආර්ථික වර්ධනයකට රුකුලක්වේ යන සාධකයෙන් හැඟෙනුයේ, ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් අංශයන් කිහිපයක සිදුවන සංකේන්ද්‍රිත වර්ධනයකට වඩා ආර්ථිකයේ තුලිත වර්ධනයක් නිර්මාණය කිරීම අරමුණු කරගෙන ක්‍රියා කළ යුතු බවයි. එමනිසා, රටක ඉහළ කාර්යසාධනයක් ඇති අංශයන්ගෙන් ලැබෙන ප්‍රතිලාභ තුළින් අනෙකුත් අංශයන් සංවර්ධනය කිරීමට ක්‍රියා කළ යුතු බව මෙයින් හැඟී යයි. ඉහත විශ්ලේෂණය මඟින් පෙන්වන පරිදි වෙනත් රටවල් හා සංසන්දනාත්මකව බැලූ කල ශ්‍රී ලංකාවේ සංකේන්ද්‍රණ අනුපාතිකය පහළ මට්ටමක පවතී. ඉන් හැඟෙනුයේ, වෙනත් නැඟී එන ආර්ථිකයන්ට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ ආර්ථිකය විවිධාංගීකරණය වී ඇති බවයි.

විදේශීය වෙළෙඳාම, ආර්ථික විචලතාවය අඩු කිරීමට හේතු වන බවට සාධක පවතී.[3] රූප සටහන වි.ස. 1.2 මඟින් විස්තර කරන පරිදි, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අපනයන ඉහළ මට්ටමක පවතින රටවල පහළ ආර්ථික විචලතාවක් පවතී (උදා: මැලේසියාව සහ තායිලන්තය). කෙසේ වෙතත්, ඇතැම් රටවල දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අපනයන ඉහළ මට්ටමක පවතින අතර, ආර්ථික විචලතාව ද ඉහළ මට්ටමක පවතී (උදා: කුවේටය සහ කටාර් රාජ්‍යය). මෙම වෙනස අත්වනුයේ අපනයන විවිධාංගීකරණය හේතුකොටගෙනයි. රූප සටහන වි.ස. 1.3 දැක්වෙන පරිදි, මැලේසියාව සහ තායිලන්තය වැනි රටවල විශේෂයෙන් නිෂ්පාදන අපනයනයන්හි, ඉතා ඉහළ මට්ටමෙන් විවිධාංගීකරණය සිදු වී ඇති අතර, කුවේටය සහ කටාර් රාජ්‍යය තුළ එවැනි තත්ත්වයක් දැකිය නොහැක. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සැලකූ කළ, දළ දේශීය නිෂ්පාදිතයට අපනයනවල ඇති අඩු දායකත්වය පෙන්වමින් අපනයන ප්‍රතිශතය සහ අස්ථායීතාව සංසන්දනාත්මකව පහළ මට්ටමක පවතී. එසේම, අනෙකුත් රටවලට සාපේක්ෂව අපනයන විවිධාංගීකරණය ද ඉතා පහළ මට්ටමක පවතී. ප්‍රධාන වශයෙන් මෙම තත්ත්වය ඇඟළුම් මූලික කරගත් නිපැයුම් අපනයනයන්ගේ දැකිය හැක. සේවා අපනයන ක්ෂේත්‍රයේ යම් විවිධාංගීකරණයක් පවතින නමුත්, තවදුරටත් විවිධාංගීකරණය කිරීමේ ඉඩ ප්‍රස්ථා පවතී. මෙහි දක්වා ඇති වෙනත් නැගීඑන ආර්ථිකයන් හා සසඳා බලන කල, ශ්‍රී ලංකාවේ අපනයන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පහළ මට්ටමක පවතී. විශේෂයෙන්ම සීමිත අභ්‍යන්තර වෙළෙඳපොළක් සහිත කුඩා රටවල්, ඉහළ ආදායම් ආර්ථිකයක් කරා ගමන් කිරීමේදී අපනයන ප්‍රවර්ධනය සාර්ථක උපාය මාර්ගයක් බවට පත්ව ඇති බැවින් මෙය ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් වැඩිදුරටත් අවධානය යොමු කරමින් පවතින ක්ෂේත්‍රයක් බවට පත් වී ඇත. තවද, විචලතා අවම කර ගැනීමට හා තිරසාර සංවර්ධනයක් ළඟා කර ගැනීමට අපනයන විවිධාංගීකරණය බහුල ලෙස යොදාගනු ලැබේ.

තවදුරටත්, ඉහළ ගුණත්වයෙන් යුතු අධ්‍යාපනය සහ හැකියාව තුළ ආයෝජනය කිරීමත්, නව තාක්ෂණයන් කරා යොමුවීමත්, යටිතල පහසුකම් සහ සබඳතාවන් වැඩිදියුණු කිරීමත්, ශ්‍රම වෙළෙඳපොළ දෘඪතාවන් අඩු කිරීමත්, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීමත්, දේපළ හිමිකම් වැඩිදියුණු කිරීමත්, ආයතනික සහ නෛතික රාමුව ඉහළ නැංවීමත් සහ ඉහළ කලාපීය ඒකාබද්ධතාවත් තුළින් නිමැවුම් සහ අපනයන විවිධාංගීකරණයට පහසුකම් සලසනු ලබයි.

3 *Shediac et.al. (2008), "Economic Diversification: The Road to Sustainable Development".*

**ආර්ථික විවිධාංගීකරණය සඳහා උපාය මාර්ගය - පංච කේන්ද්‍රීය වැඩසටහන**

පංච කේන්ද්‍රීය වැඩසටහන, ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් විවිධාංගීකරණය කිරීම සහ රටේ අපනයන මට්ටම සහ අපනයන විවිධත්වය ඉහළ නැංවීම සඳහා රජය මගින් ආරම්භ කරන ලද ප්‍රධානම ක්‍රියාමාර්ගයකි. ශ්‍රී ලංකාව ඉහළ ආදායම් ලබන රටක් බවට පත් කිරීම සඳහා තිරසාර ආර්ථික වර්ධනයක් රට තුළ ඇති කිරීමත් එයින් ශ්‍රී ලංකාව ලෝකයේ උපායමාර්ගික වශයෙන් වැදගත් ආර්ථික මධ්‍යස්ථානයක් බවට පත්කිරීමත් අරමුණු කර ගනිමින් මෙම වැඩසටහන "මහින්ද චින්තන ඉදිරි දැක්ම" මඟින් හඳුන්වා දෙන ලදී. උපායමාර්ගික වශයෙන් ශ්‍රී ලංකාව සතු වාසිදායක භූගෝලීය පිහිටීම සහ වෙනත් විභවයන් සැලකිල්ලට ගෙන මෙම කේන්ද්‍රයන් හඳුන්වා දී ඇත. තේ සහ ඇඟළුම් කර්මාන්තය වැනි ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ප්‍රබල අංශයන්හි තරඟකාරීත්වයක් පවත්වා ගනිමින්, සාමුද්‍රීය, ගුවන්, වාණිජ සහ සංචාරක, දැනුම සහ බලශක්ති යන මෙම සෑම අංශයකම තරඟකාරීත්වයක් ඇති කිරීමෙන් රට තුළ නව ශක්තීන් ජනිත කළ හැකිය. රටේ දැනට පවතින සාම්ප්‍රදායික ප්‍රබල අංශයන්හි යහපත් ප්‍රතිඵල ඇති අතරතුර දී ම, නව ප්‍රබල අංශයන් දියුණු කර ගැනීම හරහා රට ඉහළ ආදායම් මට්ටමක් කරා පහසුවෙන් ගමන් කිරීමට මඟ සැලසීම මෙම උපාය මාර්ගයෙහි මූලික අභිප්‍රාය වේ.

ආර්ථිකයේ අංශයන් එකක හෝ දෙකක පමණක් සංවර්ධනයට සීමා නොවී විවිධාංගීකරණ සංකල්පය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මුල පිරීම පංච කේන්ද්‍රීය උපාය මාර්ගය තුළින් ගෙන ඇත. පංච කේන්ද්‍රීය උපාය මාර්ගයන් මේ දක්වා අත්පත් කරගත් ප්‍රගතීන් සහ මුල පිරීම් පහත දැක්වේ.

**සාමුද්‍රීය කේන්ද්‍රය**

නාවුක සහ සාමුද්‍රීය කර්මාන්තයන් තුළ තරඟකාරී ලෙස වාසි ලබාගත හැකි ලෝකයේ ඇති හොඳම ස්ථානයක ශ්‍රී ලංකාව පිහිටා ඇත. එහි පිහිටීම හේතුවෙන් වාසි ලබාගත් රටක් ලෙස ශ්‍රී ලංකාව අතීතයේ සිට ම ප්‍රසිද්ධියක් උසුලන අතර, රජය මෙම උපායමාර්ගික වාසිය උපයෝගී කර ගනිමින් සාමුද්‍රීය කර්මාන්තයන් දියුණු කිරීමට අපේක්ෂා කරයි. හම්බන්තොට වරාය සංවර්ධනය (පළමු අදියර නිම කොට ඇත), කොළඹ දකුණු වරාය සංවර්ධනය (දියකඩනය සහ යටිතල පහසුකම්වලින් කොටසක් නිම කර ඇති අතර එක් පර්යන්තයක් ක්‍රියාත්මක වේ), නව පර්යන්තයන් හරහා කොළඹ වරාය පුළුල් කිරීම, කොළඹ වරාය පුරවරය ඉදිකිරීම යනාදිය මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග අතර වේ. රටේ මාර්ග පද්ධතියේ දියුණුව උදෙසා රජය විසින් ප්‍රධාන ආයෝජනයන් කර ඇති අතර, එය වරාය, ගුවන්තොටුපළ සහ ප්‍රධාන නගර අතර සම්බන්ධතාව වැඩිදියුණු කිරීම හරහා සාමුද්‍රීය කේන්ද්‍රයේ සංවර්ධනයට උත්ප්‍රේරකයක්ද වේ. මේ අතරම සාමුද්‍රීය කේන්ද්‍රයේ සංවර්ධනය තුළ දී ශ්‍රී ලංකාව විසින් අවධානය යොමු කළ යුතු අභියෝග රාශියක් ද වේ. සාමුද්‍රීය කර්මාන්තයන් සඳහා අවශ්‍ය නිපුණතා සංවර්ධනය, සාගර පතුල ආශ්‍රිත සම්පත් ගවේෂණය, සැපයුම් දාම කළමනාකරණ ආයතන සඳහා සහයෝගය ලබාදීම, කීර්තිමත් සමාගම් ශ්‍රී ලංකාවට ආකර්ෂණය කර ගැනීමට ක්‍රියා කිරීම, නැව් නිපදවීමේ සහ අලුත්වැඩියා කිරීමේ කර්මාන්ත සංවර්ධනය කිරීම, සුළු වරායන් දියුණු කිරීම, පර්යේෂණ කටයුතුවල නියැලීම, නීති පද්ධතිය නැවත විමසීම, වෙරළාශ්‍රිත විනෝද කටයුතු වෙරළෙන් ඔබ්බට පුළුල් කිරීමට ක්‍රියා කිරීම, ආදිය අනාගතයේ දී අවධානය යොමු කිරීමට අවශ්‍ය ක්ෂේත්‍රයන් කිහිපයකි.

**ගුවන් කේන්ද්‍රය**

ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රධාන ගුවන් මාර්ග බොහොමයකට ආසන්නයෙන් පිහිටා ඇති අතර මෙහි සිට ලෝකයේ බොහොමයක් ප්‍රධාන නගරවලට පැය කිහිපයකින් ළඟාවිය හැක. ඒ අනුව ඩුබායි සහ සිංගප්පූරුව වැනි ගුවන් කේන්ද්‍රස්ථානයක් බවට පත්වීමේ ඉහළ හැකියාවක් ශ්‍රී ලංකාවට පවතී. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ පිහිටුවීම මේ සම්බන්ධයෙන් ගෙන ඇති ප්‍රධාන ක්‍රියාමාර්ගයක් වේ. මෙය ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළ වන අතර, එහි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි නැවැත්විය නොහැකි විශාල ගුවන් යානා නැවැත්වීම සඳහා පහසුකම් ඇත. තවද, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ නවීකරණය කිරීම, රත්මලාන, අම්පාර, ඉරණමඩු, අනුරාධපුරය, චීන වරාය ආදී අභ්‍යන්තර ගුවන්තොටුපළ වැඩිදියුණු කිරීම, ගුවන් යානා සංඛ්‍යාව වැඩි කිරීම, අභ්‍යන්තර මගී ගුවන් ප්‍රවාහනය වැඩිදියුණු කිරීම, පුහුණු සහ පර්යේෂණ පහසුකම් ඉහළ නැංවීම ආදිය ගන්නා ලද නව ක්‍රියාමාර්ග අතර වේ. ජාත්‍යන්තරව පිළිගත් ශක්තිමත් ජාතික ගුවන් සේවයක් පැවතීම ගුවන් කේන්ද්‍රයක් බවට පත්වීමට අවශ්‍ය මූලික අංගයකි. එමනිසා, විශේෂයෙන්ම ජාතික ගුවන් සේවය වන ශ්‍රීලංකන් ගුවන් සේවය වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනයන් අවශ්‍ය වේ. ගුවන් යානා සංඛ්‍යාව වැඩි කළ යුතු අතර, ගමන් වාර ගණන සමගම ගමනාන්ත ගණන වැඩි කිරීම තුළින් සම්බන්ධතාව ද ඉහළ නැංවිය යුතු වේ. මෙම අංශයෙන් සාර්ථකවීම සඳහා, ශ්‍රී ලංකාව හොඳ ගමනාන්තයක් පමණක් නොව හොඳ සංක්‍රමණ ස්ථානයක් බවට ද පත්විය යුතුය. තවද, කේන්ද්‍රස්ථානයක් ලෙස දියුණුවීම උදෙසා ශ්‍රී ලංකාව වඩා හොඳ ගුවන් සේවා සැපයුම් මධ්‍යස්ථානයක් බවට පත්විය යුතු අතර, ඒ හරහා වෙනත් ගුවන් සේවයන් රටට ආකර්ෂණය කර ගැනීම අවශ්‍ය වේ.

**වාණිජ සහ සංචාරක කේන්ද්‍රය**

වර්තමානයේ රට තුළ ක්‍රියාත්මක වන යටිතල පහසුකම් සංවර්ධනය වැඩසටහන්වලට සමගාමීව වාණිජ කේන්ද්‍රීය සංකල්පය හඳුන්වා දී ඇත. වාණිජ සේවාවන්, ජාත්‍යන්තර බැංකු කටයුතු සහ ජාත්‍යන්තර ආයෝජනයන්ගේ ආසියාවේ කේන්ද්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාව පත්කිරීම මෙහි මූලික අරමුණයි. එසේම, ත්‍රස්තවාදය අවසන් කිරීම සහ එමගින් ඇති වූ සීඝ්‍ර දියුණුවත් සමග රටේ සංචාරක ව්‍යාපාරය වර්ධනය කිරීමට හා එමගින් ශ්‍රී ලංකාව සංචාරක කේන්ද්‍රයක් ලෙස දියුණු කිරීමටද කටයුතු කෙරෙමින් පවතී. ශ්‍රී ලංකාව වාණිජ කේන්ද්‍රයක් ලෙස දියුණු කිරීම සඳහා කොළඹ ඇතුළු ප්‍රධාන නගර, අනෙකුත් මධ්‍යම ආදායම් රටවල නූතන, පාරිසරික හිතෛෂී නගරවල සම මට්ටමට දියුණු කිරීමට සහ එමගින් ඒවා දකුණු ආසියාවේ ප්‍රධාන වාණිජ කේන්ද්‍රස්ථාන බවට පත් කිරීම අරමුණ වේ. හරිත නගර සංකල්පය යටතේ කොළඹ නගරය පිරිසුදු, ජල ගැලීම්වලින් තොර නගරයක් ලෙස දියුණු කිරීම, කොටුව මත්ස්‍ය වෙළෙඳ සංකීර්ණය වෙනත් ස්ථානයකට ගෙනයාම හරහා කොළඹ කොටුව ප්‍රදේශයෙන් පිටතට ප්‍රවාහන කටයුතු යොමු කරමින් වාහන ගමනාගමනය ක්‍රමානුකූල කිරීම, පරිපාලන ආයතන සමහරක් කෝට්ටේ නගරයට ගෙනයමින් ශ්‍රී ජයවර්ධනපුර පරිපාලන අග නගරය බවට පත් කිරීම, අඩු පහසුකම් සහිත ජනතාව නවීන නිවාස යෝජනා ක්‍රම යටතේ පදිංචි කරවීම, බේරේ වැව සහ අවට ප්‍රදේශය සංවර්ධනය කිරීම, පැරණි ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීම (උදා: ලන්දේසි රෝහල, තුරඟ තරග පිටිය, ගාල්ල ලන්දේසි රෝහල, ජාතික අන්‍යොන්‍යතා ගොඩනැගිල්ල (National Mutual Building), ත්‍රිපොලි පෙදෙස), මඩකලපුව, යාපනය, නුවරඑළිය ඇතුළු කොළඹින් පිටත නගර සංවර්ධනය කිරීම මේ යටතේ ගෙන ඇති පියවර කිහිපයකි. මෙම සංවර්ධන ව්‍යාපෘතිවලට පෞද්ගලික අංශයේ ද දායකත්වය සැපයෙන අතර, ඇතැම් නගර සංවර්ධන ව්‍යාපෘති පෞද්ගලික අංශයේ අනුග්‍රහය යටතේ සිදු කෙරේ (උදා: මීගහකිවුල, දංකොටුව, හෝමාගම ආදිය). තවද, ෂැංග්‍රිලා හෝටල් ව්‍යාපෘතිය, වරාය පුරවරය, නෙළුම් කුලුන, ඉංදුසියැන් කුලුන වැනි මහා පරිමාණ ව්‍යාපෘති සහ වෙනත් අනුකූලක සංචාරක සංවර්ධන ව්‍යාපෘති හරහා කොළඹ නගරය වෙත සංචාරකයන් සහ නව ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, යටිතල පහසුකම් දියුණු කිරීම හරහා පමණක් ඉහත කී අරමුණු සාක්ෂාත් කරගත නොහැක. ආයෝජකයන් රට තුළ ආයෝජනය කිරීමට පෙර බදු ව්‍යුහය, නීති පද්ධතිය, ව්‍යාපාර කිරීමේ පහසුව සහ ස්ථාවර ප්‍රතිපත්ති පිළිබඳව ද අවධානය යොමු කරන නිසා මේ එක් එක් ක්ෂේත්‍රයන්ගේ සියුම් සැකැස්ම කෙරෙහි ද අවධානය යොමු කළ යුතුය. ඒ අනුව හම්බන්තොට, කොළඹ, මත්තල වරායන් සහ ගුවන්තොටුපොළ ආශ්‍රිතව නිදහස් වරායන් සහ නිදහස් වෙළෙඳ කලාප පිහිටුවනු ඇත. තවද, සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත හෝටල් කාමර ගණන සහ පහසුකම් වැඩිදියුණු කිරීමට කටයුතු කෙරේ. තරු පංතියේ හෝටල් රට වටා ඉදිවෙමින් පවතින අතර, ගෘහාශ්‍රිත නවාතැන් පහසුකම් ද වැඩිදියුණු වෙමින් පවතී. නිදහසින් පසු ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රකට සංචාරක ගමනාන්තයක් ලෙස නම් දරා සිටී. රට තුළ පවතින ස්වභාවික රමණීයත්වය සහ සංස්කෘතික උරුමයන් නැරඹීමට මූලික වශයෙන් සංචාරකයන් පැමිණෙන අතර, මින් බහුතරය යුරෝපා ජාතිකයන් වේ. එහෙයින් ඉදිරියේ දී ඉන්දියාව, චීනය, මැද පෙරදිග සහ අනිකුත් ආසියානු රටවලින් ද සංචාරකයින් ආකර්ෂණය කර ගැනීම සිදු කළ යුතුව ඇත. එමනිසා, යහපත් ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා අලෙවිකරණ වැඩසටහන් මෙම විවිධ භූගෝලීය ප්‍රදේශ ඉලක්ක කරගනිමින් ක්‍රියාත්මක වෙමින් පවතී.

**දැනුම් කේන්ද්‍රය**

විවිධ වෘත්තීන්වල නියැළි උගත් තරුණ පරපුරෙන් ප්‍රයෝජන ලබා ගැනීම, අධ්‍යාපන පද්ධතිය වැඩිදියුණු කිරීම සහ රට තුළට විශේෂඥයන් සහ විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීම යන පුළුල් අරමුණු ඇතිව දැනුම් කේන්ද්‍ර සංකල්පය හඳුන්වා දී ඇත. ඉහළ මැදි ආදායම් ආර්ථිකයක් කරා යන ගමනේ දී අධ්‍යාපන ක්‍රමය සංවර්ධනය කිරීම සහ මානව හැකියාවන් වැඩි දියුණු කිරීම ශ්‍රී ලංකාවට අතිශයින් වැදගත් වේ. උසස් හැකියාවන් වර්ධනය සඳහා ආයෝජනය කිරීම මැදි ආදායම් උගුලින් ගැලවීමට ප්‍රශස්ත උපායක් බව විශේෂඥයින්ගේ අදහසයි. එහෙයින්, අධ්‍යාපන පද්ධතිය වැඩි දියුණු කිරීම සහ පර්යේෂණ කටයුතු දියුණු කිරීම හරහා නවෝත්පාදනයන් දිරිගැන්වීම මේ අවධියේ දී රටට අතිශයින් වැදගත් වේ. රටේ උසස් අධ්‍යාපන ක්‍රමය වැඩි දියුණු කිරීම අරමුණු කරගත් නොයෙකුත් ක්‍රියාමාර්ග වර්තමානයේ දී ක්‍රියාවට නංවා ඇත. පසුගිය වසර කිහිපය තුළ දී නව පීඨයන් ආරම්භ කිරීම, සංචාරක ව්‍යාපාරය වැනි අලුත් ක්ෂේත්‍ර ඉලක්ක කරගත් නව පාඨමාලා ආරම්භ කිරීම, නව අධ්‍යාපන ආයතන පිහිටුවීම ඒ අතර වේ. එසේම රැකියා වෙළෙඳපොළ වෙත ගැලපෙන පරිදි උපාධිධාරීන් බිහිකිරීම සඳහා වූ සුසමාදර්ශී වෙනසක් උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිදු වෙමින් පවතියි. මෙම ඉගෙනුම් පරිසරය තුළ දී දැනුමට අමතරව හැකියාවන්, ආකල්ප සහ මානසික සිතුවිලි යනාදිය කෙරෙහි ද ප්‍රමුඛතාවය ලබා දී ඇත. එසේම, උසස් අධ්‍යාපන ආයතන හා සම්බන්ධව පර්යේෂණ කටයුතු සිදුකිරීමට පෞද්ගලික අංශය දිරිමත් කෙරේ. අධ්‍යාපන පද්ධතියේ තරඟකාරිත්වය වැඩි දියුණු කිරීමට අවශ්‍ය වන අතර, විශේෂයෙන් පර්යේෂණ කටයුතුවල දී විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශය අතර සම්බන්ධතාව වර්ධනය කිරීම අවශ්‍ය වේ.

**බලශක්ති කේන්ද්‍රය**

සීඝ්‍රයෙන් ඉහළ යන බලශක්ති ඉල්ලුම සපුරා ගැනීම සඳහා ලොව බොහෝ රටවල් පොසිල ඉන්ධන මත රඳාපැවතීමේ ප්‍රතිඵලයක් ලෙස දිනෙන් දින ඇතිවන්නා වූ කම්පනයන්ගෙන් පීඩා විඳීමට රටවලට සිදුව ඇත. කෙසේ වෙතත්, පොසිල ඉන්ධන ක්ෂය වන සම්පතක් වන අතර, ඒ නිසාම බලශක්තිය උපදවන නව මාර්ග පිළිබඳව සලකා බැලීම අවශ්‍ය වේ. ත්‍රස්තවාදය අවසන් වීමත් සමඟ උතුරු සහ නැගෙනහිර මුහුදු කලාපයන් මෙරටට විවෘත වීමෙන් එහි පැවති පොසිල ඉන්ධන සම්පත් හඳුනා ගැනීමට හැකි විය. මන්නාරම් ද්‍රෝණියේ තිබෙන බවට විශ්වාස කරන තෙල් සහ ගෑස් නිධි ලබා ගැනීමේ හැකියාවක් ඇති දැයි හඳුනාගැනීම සඳහා මේ වන විට ගවේෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී. වාණිජමය වශයෙන් භාවිතා කළ හැකි පමණින් මෙම පොසිල ඉන්ධන ලබා ගැනීමට හැකි වුවහොත් එය ක්ෂේත්‍ර ගණනාවකින්ම රටට ඉමහත් ප්‍රතිලාභ ගෙන දෙන්නක් වනු ඇත. කෙසේ වෙතත්, මේ අවස්ථාවේ දී පොසිල ඉන්ධන යුගය එහි අවසානය කරා ළඟා වෙමින් තිබෙන බව ද සැලකිල්ලට ගත යුතු වේ. මෙම පසුබිම තුළ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් කරා යොමු වීම රටට අවශ්‍ය වේ. වර්තමානයේ දී මහ පරිමාණ ජල බලශක්තිය එහි උපරිම මට්ටමෙන් ප්‍රයෝජනයට ගෙන ඇති බැවින් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වැඩිදියුණු කිරීම අතිශයින් වැදගත්ය. බොහෝ දෙනෙකු විසින් පෙන්වා දෙන පරිදි, මෙහි ප්‍රධාන අවාසිය වනුයේ පොසිල ඉන්ධන සමඟ සංසන්දනාත්මකව බැලූ කල මෙම ප්‍රභවයන් සඳහා ඉහළ පිරිවැයක් දැරීමට සිදුවීමයි. කෙසේ වෙතත්, තාක්ෂණික දියුණුවත් සමඟ දිගුකාලීනව, ආයුකාල පිරිවැය අඩු විය හැකිය. එනිසා පිරිවැය අඩු කිරීමේ හැකියාව තවදුරටත් විශ්ලේෂණය කිරීමට අවශ්‍ය වේ.

ඉහත දැක්වූ පරිදි, පංච කේන්ද්‍රීය වැඩසටහන ඉහළ සාර්ථකත්වයක් කරා ළඟා වෙමින් ඇති අතර ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රජය විසින් සැලකිය යුතු මට්ටමේ ආයෝජනයන් සිදුකර ඇත. කෙසේ වෙතත්, නොයෙක් ක්ෂේත්‍රයන් තුළ තව දුරටත් දියුණු කිරීම් සිදු කළ හැකිය. මෙම කේන්ද්‍රීය කටයුතු අතර වැඩි සම්බන්ධීකරණයක් අවශ්‍ය කරන අතර, අදාළ ක්ෂේත්‍රයන්හි දැනුම්වත් බව වැඩි කිරීමට සහ වැඩි ආයෝජනයන් ආකර්ෂණය කර ගැනීමට වැඩි ප්‍රයත්නයක් දැරිය යුතුව ඇත. මේ සඳහා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ප්‍රමාණවත් නොවන බැවින් එය දිරිමත් කිරීම අවශ්‍ය වේ. එපමණක් නොව, ශ්‍රමබලකායේ කුසලතාවයන් අලුතින් බිහි වූ රැකියා අවස්ථාවන් හා අනුකූල විය යුතුය.

ඉදිරි කාලයේ දී, කේන්ද්‍ර අතර අන්තර් ක්‍රියා හඳුනාගැනීම අවශ්‍ය වන අතර, හඳුනාගත් උපාය මාර්ග ක්‍රියාවේ යෙදවීම පහසු කිරීමට සමස්තය සම්බන්ධීකරණය කළ ප්‍රතිපත්ති රාමුවක් සහ නිරීක්ෂණය කළ හැකි ක්‍රමවේදයක් ක්‍රියාවේ යෙදවිය යුතුය. මේ සඳහා, කේන්ද්‍ර අතර අනුපූරකතාව හඳුනාගැනීම වැදගත්ය. එක් කේන්ද්‍රයක සංවර්ධනය අනෙකුත් කේන්ද්‍රවල සංවර්ධනයට හේතුවන අතර, මෙම වැඩසටහන මඟින් බොහෝ ප්‍රතිලාභ සහ ධන බාහිරතා ඇති විය හැක. පංච කේන්ද්‍රීය වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුළින් ඉහළ මට්ටමේ ස්ථායී තිරසාර වර්ධනයක් සහිත විවිධාංගීකරණය වූ ආර්ථිකයක් කරා ළඟා විය හැකිය.

මූලාශ්‍ර

ලංකා විදුලිබල මණ්ඩලය, http://www.ceb.lk.
ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, "Unstoppable Sri Lanka 2020 - Public Investment Plan 2014-2016", මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය - ශ්‍රී ලංකාව, 2010.
මහින්ද චින්තනය - ඉදිරි දැක්ම, 2010.
සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, http://www.aviationmin.gov.lk.
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, http://www.mohe.gov.lk
Pritchett, L., "Patterns of Economic Growth: Hills, Plateaus, Mountains, and Plains", The World Bank e Library, 1998.
Shediac, R., Abouchakra, R., Moujaes, C.N., & Najjar, M.R., "Economic Diversification: The Road to Sustainable Development ", Booz & Company, 2008.
ශ්‍රී ලංකා වරාය අධිකාරිය, http://www.slpa.lk
නාගරික සංවර්ධන අධිකාරිය, http://www.uda.lk

**පොලී අනුපාත අඩු මට්ටමක පවතින වාතාවරණයක් තුළ විශ්‍රාම දිවියේ දී සේවකයන් හට පිළිගත හැකි මට්ටමේ ජීවන තත්ත්වයක් භුක්ති විඳීම සහතික කිරීමට නව ඉතුරුම් හා විශ්‍රාම තැන්පතු උපකරණ හඳුන්වාදීමේ අවශ්‍යතාවයක් පවතී.** ශ්‍රී ලංකාව තුළ ඇතිවන ජනවිකාශ සංක්‍රමණය අනුව වැඩිහිටි ජනගහනය හා ආයු අපේක්ෂාව ක්‍රමයෙන් වැඩිවන බැවින්, ක්‍රමයෙන් වැඩි වන්නා වූ විශ්‍රාම ගන්නා වයසට ළඟා වන ජනගහන කොටසෙහි අවශ්‍යතාවන්ට සරිලන පරිදි, තැන්පතු සහ විශ්‍රාම තැන්පතු උපකරණ වර්ධනය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලබයි. වෙළෙඳපොළෙහි පවතින අඩු පොලී අනුපාත තත්ත්වය සහ බොහෝ දුරට විශ්‍රාමිකයින් පොලී ආදායම් මත යැපීම යන කාරණා මෙවැනි තැන්පතු උපකරණ නොපමාව හඳුන්වාදීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි. ඇතැම් මූල්‍ය ආයතන මෙවැනි උපකරණ කිහිපයක් දැනටමත් හඳුන්වා දී ඇතත්, දිගුකාලීන ඉතුරුකිරීම් සිදු කරන්නන්ගේ අවශ්‍යතාවයන්ට අනුව වාර්ෂික දීමනා, විශ්‍රාම පාරිතෝෂික වැඩසටහන් සහ විශ්‍රාමික සැලසුම් වැනි විකල්ප ඉතුරුම් සහ විශ්‍රාම උපකරණ තවදුරටත් වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය පවතී. මෙවැනි තැන්පතු උපකරණ හඳුන්වාදීම, විශ්‍රාමිකයන්හට වඩාත්

සුවදායී තත්ත්වයක් ලබාදෙන අතරම මූල්‍ය අංශයේ සංවර්ධනයට උපකාරී වෙමින් ප්‍රතිලාභ ලැබීමට දිගුකාලයක් ගන්නා ව්‍යාපෘති සඳහා දිගුකාලීන අරමුදල් ප්‍රභවයක් ද වනු ඇත.

**ගෝලීය ආර්ථිකය ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීම හේතුවෙන්, ලිහිල් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රමිකව ඉවත්කර ගැනීම සිදුවනු ඇති අතර, එමගින් නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි සාර්ව ආර්ථික කළමනාකරණය කෙරෙහි අභියෝග නිර්මාණය වනු ඇත.** සංවර්ධිත රටවල අපේක්ෂිත හිතකර වර්ධනය සහ කලාපීය වෙළෙඳාම වර්ධනය වීමත් සමඟ ශ්‍රී ලංකාව වැනි රටවලට ප්‍රතිලාභ සලසමින්, ජාත්‍යන්තර වෙළෙඳාම ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ප්‍රධාන ආර්ථිකයන් විසින් ක්‍රියාවට නංවන ලද මුදල් සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් අනුගමනය කරන ලද ප්‍රමාණාත්මක ලිහිල්කරණ ක්‍රියාමාර්ග හීන කිරීමේ කාලය සහ එහි ප්‍රමාණය, ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම කෙරෙහි පවතින අවදානම ඉහළ නංවනු ඇති අතර, මූල්‍ය වෙළෙඳපොළ තුළ ඉහළ අවිනිශ්චිතතාවක් නිර්මාණය කරනු ඇත. ඒ අනුව, ප්‍රමාණාත්මක ලිහිල්කරණ ක්‍රියාමාර්ග හීන කිරීමේ ක්‍රියාවලිය මගින් ආරම්භක අවස්ථාවේ පවතින ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම මැඩ පැවැත්වීම වැළැක්වීම සහතික කිරීම සඳහා මහ බැංකු අතර මනා සහයෝගීතාවක් පවත්වා ගැනීම අත්‍යාවශ්‍ය වනු ඇත. නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් විසින් දැඩි බාහිර මූල්‍ය තත්ත්වයන් මගින් පැන නගින අවදානම් සහ ප්‍රාග්ධන ගලායාමේ විය හැකි ප්‍රතිවර්තනයන් මෙන්ම දිගුකාලීන ණය අනුපාතිකයන්ගේ සහ අවදානම් පාරිතෝෂිකයේ අපේක්ෂිත වර්ධනය ද බාහිර කම්පනයන්ට ඔරොත්තුදෙන පරිදි ආර්ථිකය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය වන ආරක්ෂණ සහ ප්‍රතිපත්ති අවකාශයන් ගොඩනැගීම තුළින් සුපරීක්ෂාකාරීව කළමනාකරණය කිරීම අවශ්‍ය වේ. ආර්ථිකයෙහි විදේශ කම්පනයන්ට මුහුණ දීමට ඇති හැකියාව ශක්තිමත් කිරීම සහ ආර්ථිකය ක්‍රමයෙන් ලිහිල් කිරීම තුළින් ඇතිවන ප්‍රතිවිපාක වලට සාර්ථකව මුහුණ දීමට හැකියාව ඇති කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ සංචිත යහපත් මට්ටමක පවත්වා ගැනීම, විනිමය අනුපාතයෙහි නම්‍යශීලීත්වය පවත්වා ගැනීම සහ රාජ්‍ය සුරැකුම්පත්වල විදේශ ආයෝජන සීමා කරමින් ගත් ප්‍රතිපත්ති උපකාරී විය. ඉදිරිය පිළිබඳ සැලකීමේදී, හදිසියේ ඇතිවිය හැකි තත්ත්වයන්ට සාර්ථකව මුහුණදීමට හැකිවන ලෙසින් හා ආර්ථිකයේ සමස්ත ඵලදායීතාවය වර්ධනය කරගැනීමේ අරමුණෙන් මහ බැංකුව සහ රජය විසින් ගනු ලැබූ පූර්වෝපායික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, ගෝලීය සංවර්ධනයන් මගින් ඇතිවිය හැකි අවදානම් අවම කර ගැනීමට උපකාරී වනු ඇත.